# පටුන

පිටු අංක

01.කුණු කසල ප්‍රතිචක්‍රීකරණය තුළින් අභියෝග ජය ගැනීම. -*ඩබ්ලිව්. එච්. සිරිසේන* 01-03

02.ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ඉදිරි ගමන් මග. -*ජී.ජී.එස්. බණ්ඩාර* 04-07

03.සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන හා ප්‍රජාවගේ ජීවන තත්වය. -*ඩබ්. අනූෂා ප්‍රියන්ජනී* 08-11

04.ග්‍රාම සංවර්ධනයට දායක කරගත හැකි කුඹල් කර්මාන්තයේ වර්තමාන ස්වරූපය. -*පී.ඒ. චිත්‍රා ජයසිංහ* 12-15

05.වස විෂෙන් තොර වගාවට කාබනික දියර පොහොර. -*අෂාන් ප්‍රනාන්දු* 16-21

06. සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේදී මැදිහත්කරු හා ඔහුගේ කාර්යභාරය. -*ඩබ්.ඒ.ඩී මංගලා චිත්‍රානී* 22-24

07.කොරෝනා වසංගතය හමුවේ ළමා පරපුරේ අනාගතය. -*ඩබ්ලිව්.ආර්.එන්.පී. විජේවර්ධන* 25-28

08.දිළිඳුකම හඳුනා ගැනීමේ විකල්පීය ප්‍රවේශයක් ලෙස මානව හැකියා ප්‍රවේශය පිළිබඳ හැඳින්වීමක්. 29-31
-*ඊ.එන්.ඩබ්.ඩබ්.එන්.එස්.බී.ඒකනායක*

09.සහභාගිත්ව පුහුණුවක සාර්ථකත්වය උදෙසා නිවැරදිව පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම. -*එස්.ඩී. අල්ගම* 32-37

10.රසායනික පොහොර වලින් මිදෙන ශ්‍රී ලංකාවේ හෙට දවස. -*නිශාන්ත රණතුංග* 38-39

11.බෞද්ධ ආර්ථික දර්ශණයට අනුව දිළිඳුකම. -*එස්.එම්. යූ.බී. සමරකෝන්* 40-42

12. ශ්‍රී ලංකාවේ ගොවිජනපද ව්‍යාපාරය. - කේ.එම්.ජී.*සමරසේන* 43-46

13.සමාජ සුරක්ෂිතතාව හා බැඳුණු පුද්ගල වගකීම. -*සී. කේ. ඩබ්ලිව්.අල්විස්* 47-50

14. ශ්‍රී ලංකාවට කොවිඩ්-19 වසංගතයේ බලපෑම. - *ප්‍රදීප් ලංකාපෙල* 51-55

15.කොවිඩ් 19 ඇතුල් කෙළවර. -*යමුනා කුමාරි* 56-59

16. ග්‍රාම සංවර්ධනයේ ගමන් මග. - *ඩබ්. ඩී. එන්. වීරසූරිය* 60-62

17. සමාජ වගවීම හඳුනා ගැනීමේ වැදගත්කම. -*ඩී.ඒ.ප්‍රේමානි දාස්වත්ත* 63-64

18. ග්‍රාමීය දරිද්‍රතාව තුරන්කිරීම සඳහා යහපාලනය උපක්‍රමික ප්‍රවේශයක්ද? -ඒ.එම්.එස්. අතපත්තු 65-72

*19.* යහපත් මානව සම්පතක් සහිත රටක් ගොඩ නැගීමට දරුවන්ගේ මුල් ළමාවිය
සංවර්ධනයේ වැදගත්කම. -*ආර්.එම් කේ. බණ්ඩාර* **73-76**

# කුණු කසල ප්‍රතිචක්‍රීකරණය තුළින් අභියෝග ජය ගැනීම.

*ඩබ්ලිව්. එච්. සිරිසේන*

ඵලදායී ලෙස කුණු කසල ප්‍රතිචක්‍රීකරණය නොවීම දශක ගණනාවක් තිස්සේ අප රට මුහුණු දෙන ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. දෛනික මිනිස් භාවිතයෙන් ඉවත ලන කුණු කසල ප්‍රමාණය ටොන් දහස් ගණනකි. ඇතැම් විට මේවා අවිධිමත් ලෙස බැහැර කිරීම ද, අප පරිසරය තුළ සුලභව දක්නට ලැබෙන තත්වයකි. මෙය අපගේ ස්වාභාවික පරිසරය අවලස්සන කිරීමටත්, එම පරිසරය විනාශ කිරීමටත් තුඩුදී ඇත. නිවෙස් තුළ ඉඩකඩ ප්‍රමාණය මදි කම නිසා හෝ නොදැනුවත්කම නිසා ද, නොසැලකිළිමත්කම නිසා ද, කුණු කසල ප්‍රතිචක්‍රීකරණය සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් නොමැති කම නිසා ද මෙම අහිතකර තත්වය බැරෑරුම් කිරීමට බලපා ඇත. නිවෙස් තුළ ද කුණු කසල ප්‍රශ්නය උද්ගතව ඇති අහිතකර තත්වයක් සේම, පළාත් පාලන ආයතන විසින් කාලයක් තිස්සේ එක්රැස් කරනු ලබන කුණු කසල අවිධිමත් ලෙස බැහැර කිරීමෙන් විශාල කුණු කඳු පවා අගනුවර නිර්මාණය වූ තත්වයක් පසුගිය කාලය තුළ දක්නට ලැබුණි. මෙම තත්වය බැරෑරුම් වූ එක් අවස්ථාවක් වූයේ අවිධිමත් ලෙස එක්රැස්වූ කුණු කඳු නාය යෑම තුළින් මිනිස් ජීවිත රැසක් අහිමිවීමත්, නිවාස හා වටිනා දේපල රැසක් ද විනාශයට පත්වීමයි. විද්‍යාත්මක ප්‍රවේශයක් තුළ මෙම කාර්යය සිදු නොවීමෙන් මිනිසාගේ දෛනික ජීවන රටාවට දැඩි අහිතකර බලපෑමක් එල්ල කිරීමට සමත්ව ඇති බව කුණු කසල එක්රැස්වී ඇති ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන ජනතාව අත්විඳින තත්වයෙන් පැහැදිලි වේ. ඔවුනට නිදහසේ තම දෛනික කටයුතු සිදුකර ගැනීමට නොහැකිවීමට පවා මෙම අවිධිමත් ක්‍රියාදාමය බලපා ඇත. මෙවන් තත්වයක් පවතිද්දීත් අදාළ ඇතැම් පළාත් පාලන ආයතන විසින් මෙම ගැටලුකාරී තත්වයට යම් ප්‍රමාණයකින් හෝ සාධනීය උත්සාහයක් ගෙන තිබීම ඉතා අගය කළ යුතු කරුණකි. මෙම තත්වය තවදුරටත් ගුණාත්මක කරමින් වර්තමාන රජයේ කෘෂි වගා ප්‍රතිපත්තියට අනුව කුණු කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් කාබනික පොහොර නිෂ්පාදන වැඩපිළිවෙල සඳහා සමාජ හා ආර්ථික වටිනාකමක් එක්කිරීමට කටයුතු කර තිබීමත් පැසසුම් කටයුත්තකි.



අවිදිමත් ලෙස කුණු කසල බැහැර කිරීම

කුණු කසල ප්‍රතිචක්‍රීකරණය යනු දෛනික භාවිතයෙන් ඉවතලන දැවල අඩංගු අමුද්‍රව්‍ය භාවිතයෙන් අවශ්‍ය භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමයි. මෙමගින් මිනිස් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය නිෂ්පාදන යෙදවුම් ලෙස හෝ වෙනත් නිෂ්පාදනයන් ලෙස ද පරිවර්තනය කිරීම මෙම ක්‍රියාදාමයෙන් සිදුවේ. නිදසුනක් ලෙස මෙයට දශක ගණනාවකට පෙර ආරම්භ වූ මෙරටේ කඩදාසි නිෂ්පාදන කර්මාන්තය ද මෙම ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමයේ එක් ප්‍රතිඵලයකි. අද අප රටේ කඩදාසි, වීදුරු, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය සඳහා තාක්ෂණය ද, යන්ත්‍රෝපකරණ ද මිනිස්

සම්පත ද ඇත. මෙම කර්මාන්ත දියුණු කිරීම සඳහා අවශ්‍ය වන්නේ ප්‍රතිචක්‍රීකරණයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමේ ජනතා සහභාගිත්ව කාර්යභාරයකි. මෙම කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය වලින් වැඩි කොටසක් සපයාගැනීමේ කාර්යභාරය ඉහත ආකාර වැඩපිළිවෙලක් තුළින් සපුරාගත හැක. මේ සඳහා අදාළ ඇතැම් පළාත් පාලන ආයතන මේ වන විටත් ක්‍රියාත්මකව ඇති අතර එමගින් ආදායම් උත්පාදන කාර්යයට ද පිවිස ඇත. ඒ අනුව මෙවැනි කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා ජනතා සහභාගිත්ව වැඩපිළිවෙලක අවශ්‍යතාව ඉතා වැදගත් වන අතර, එමගින් අවශ්‍ය අමුද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් එක්රැස් කරගැනීමේ හැකියාව ඇත. මෙය එම ආයතනවලට මෙන්ම ඊට සම්බන්ධ ප්‍රජාවට ද ආදායම් ගෙන දෙන කාර්යයකි. වර්තමාන රජය විසින් දියත් කොට ඇති කෘෂිකාර්මික කටයුතු සඳහා කාබනික පොහොර ප්‍රවර්ධන ප්‍රතිපත්තිය ද කුණු කසල ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා විශාල අනුග්‍රහයක් සපයා ඇත. මෙරටේ බොහෝ ප්‍රදේශවල දිනකට එක්රැස්වන කුණු කසල අතුරින් විශාල ප්‍රතිශතයක් දිරාපත් වන ද්‍රව්‍යයන්ගෙන් යුක්ත වන අතර, එය කාබනික පොහොර ප්‍රවර්ධන වැඩපිළිවෙලට ද රුකුළක් වේ. ඒ අනුව දිරාපත් වන ද්‍රව්‍ය එක්රැස් කොට කාබනික පොහොර බවට හැරවීමේ වැඩපිළිවෙලක් අදාළ පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක කිරීම



නිවෙස් මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය

වඩා ප්‍රතිඵලදායක වේ. දිරාපත් වන ද්‍රව්‍ය කාබනික පොහොර බවට පත්කිරීමේ ක්‍රමයේ දී ද්‍රව්‍ය දිරායාමට අවශ්‍ය ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය උපරිම ලෙස සිදුකිරීම සඳහා අවශ්‍ය පරිසරය සැකසීම මගින් කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාදාමය විද්‍යානුකූලව සිදු වන අතර, එමගින් පොහොර නිෂ්පාදන කාර්යය පරිසර හිතකාමී ලෙස කෙටි කාලයක් තුළ සිදු කළ හැක. නිවසේ කුණු කසල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය ද බොහෝ නිවෙස් තුළම සිදුකළ හැකි අතර, එමගින් ඔවුගේ ගෙවතු වගා කටයුතු සඳහා අවශ්‍ය පොහොර සකස්කර ගැනීමේ හැකියාව ඇත.

එසේම, අදාළ පළාත් පාලන ආයතන විසින් ද මෙම ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය සිදුකිරීමෙන් සමාජ ආර්ථික ප්‍රතිලාභ රැසක් අත්කර ගැනීමේ හැකියාව පවතී. පවත්නා කෘෂිකාර්මික ප්‍රතිපත්තියට අනුව කාබනික පොහොර අවශ්‍යතා සපුරාලීමට කඩිනම් නිෂ්පාදන ක්‍රම අවශ්‍යය. අදාළ සියලුම පළාත් පාලන ආයතනවලට තම ප්‍රදේශය තුළ කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘති ආරම්භ කළ හැකිය. මේ සඳහා ප්‍රජා සහභාගිත්ව වැඩපිළිවෙලක් ද සකසා ක්‍රියාත්මක කිරීම මගින් මෙම වැඩපිළිවෙල වඩා ඵලදායීකර ගැනීමටත්, මෙමගින් විශාල ආර්ථික ප්‍රතිලාභයක් උපයා ගැනීමටත් හැකියාව ඇත. එසේම වර්තමාන රජය විසින් මෙම කාර්යයන් නිවෙස් මට්ටමින් සිදුකර ගැනීම සඳහා කෘෂිකාර්මික කටයුතු සිදුකරන ගොවි පවුල් වෙත කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මූල්‍ය හා ද්‍රව්‍ය සහනාධාර ලබාදීමට ද කටයුතු සැලසුම් කොට ඇත. ඉවත ලන කුණු කසල කාබනික පොහොර බවට පත්කර ගැනීම සඳහා මෙම වැඩපිළිවෙල බෙහෙවින් වැදගත් වේ. දෙමව්පියන් විසින් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමට කටයුතු සිදුකරනවා සේම නිවෙස්වල කුණු කසල කළමනාකරණය කිරීම ද සියලු දෙනාටම හොඳ සෞඛ්‍ය තත්වයක් අත්කරදීමටත් ඉතා වැදගත් වේ. ලෙඩරෝග බෝකරන මැසි මදුරුවන් බෝවන පරිසරයක් නිර්මාණය කර නොගැනීමට කටයුතු කිරීම සියලු දෙනාගේම වගකීම වේ. ඇතැම් පෙදෙස්වල කුණු කසල පාරවල් දෙපස විසි කිරීම තුළින් මැසි මදුරුවන් බෝවීමේ තත්වයක් ද උග්‍ර වී ඇත. උදෑසන රැකියාවට යද්දී තම ගෙදරින් රැගෙන ආ කුණු කසල මල්ල තව කෙනෙකුගේ නිවෙස අසල තැනකට විසිකිරීමට ද පුද්ගලයින්

පුරුදුව සිටිති. ඒ අනුව කුණු කසල ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රජා සහභාගිත්ව වැඩපිළිවෙලක් ඉතා අවශ්‍ය වේ. ප්‍රජාවගේ උනන්දුව ඇතිකරලීමට මෙන්ම, දැනුවත්බව ඇතිකරලීමට ද වර්තමාන රජයේ කාබනික වගා ප්‍රතිපත්තිය ද මේ සඳහා විශාල අනුබලයක් සපයයි.

# ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ඉදිරි ගමන් මග.

*ජී.ජී.එස්. බණ්ඩාර*

සියවස් ගණනාවක සිට පැවත එන ව්‍යාපාරයක් ලෙස සංචාරක ව්‍යාපාරය සදහන් කළ හැක. රටවල් අතර වෙළදාම සහ දේශ, දේශාන්තර අතර ගවේෂණ කටයුතු හා දූත මෙහෙවර ආරම්භ වීමත් සමගම ඊට සමගාමීව සංචාරක ව්‍යාපාරයද ක්‍රමයෙන් දියුණු විය. 1950 වර්ෂයේදී සංචාරක කාර්යාංශය පිහිටුවීමෙන් පසුව, කර්මාන්තයක් ලෙස සංචාරක ව්‍යාපාරය සදහා පදනම වැටුනි. මෙකල සංචාරක ව්‍යාපාරය පිළිබදව ලෝකයේ බොහෝ රටවල් කතාකල අතර, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට මූලික සැලසුම් පිළියෙල කිරීමද ලෝකයේ බොහෝ රටවල සිදු වු කාල වකවානුවක් ලෙස 1950-1960 දශකය හදුනාගත හැකිය.

සංචාරක ව්‍යාපාරය, ව්‍යාපාරයක් ලෙස දියුණු වීමේදී කලින් කලට ලෝකයේ සිදුවූ වෙනස් වීම් අප රටේ සංචාරක කර්මාන්තයටද එක ලෙස බලපෑ අතර, මූලික වශයෙන් සංචාරකයින්ගේ සංචාරක අරමුණ මෙහිදී වැදගත් විය. ඒ අනුව මුල්කාල වලදී වැඩි සංචාරකයින් ප්‍රමාණයක් මෙරටට පැමිණියේ නිවාඩු ගත කිරීමටය. මෙහිදී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ වෙරළ තීරය සංචාරක කර්මාන්තය දියුණු කිරීමට යොදාගත හැකි වඩා හොද විභවයක් පවතින කලාපයක් ලෙස හදුනාගෙන තිබූ අතර, බෙන්තොට. කොග්ගල, පාසිකුඩා, ත්‍රිකුණාමලය, නිලාවේලි, වැනි මුහුදුබඩ ප්‍රදේශත් මීගමුව අවට මුහුදු කලාපයත් සංචාරක කර්මාන්තයේ ප්‍රගමනය සදහා යොදාගත හැකි කලාප ලෙස ප්‍රචලිත විය. මේ වන විට ශ්‍රී ලංකාව තුල වෘත්තීය මට්ටමෙන් සංචාරක ව්‍යාපාරය ගොඩනැගී නොතිබූ නමුත්, ව්‍යාපාරයේ දියුණුවත් සමග මුහුදු බඩ කලාපයේ විශේෂයෙන් දකුණු හා බස්නාහිර මුහුදු තීරය අවට සංචාරකයින් ඉලක්ක කර ගෙන හෝටල් කාමර සහිත ගොඩනැගිලි ඉදිවන්නට විය. ඒ සමගම මෙම ක්ෂේත්‍රය තුළ විශාල සේවක සංඛ්‍යාවකට සෘජු රැකියා මෙන්ම, ඊට සාපේක්ෂව වක්‍ර රැකියා විශාල සංඛ්‍යාවක් ද රට තුළ නිර්මාණය වන්නට විය.

සංචාරක පැමිණීම හා සෘජු හා වක්‍ර සේවා සැපයීම.

| වර්ෂය | පැමිණි සංචාරකයින් ගණන. | සෘජු සේවා සැපයීම් සංඛ්‍යාව | වක්‍ර සේවා සැපයීම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1985 | 257,456 | 22,723 | 31,810 |
| 1995 | 403,101 | 35,068 | 49,095 |
| 2005 | 549,308 | 52,085 | 72,919 |
| 2015 | 1,798,380 | 135,930 | 183,506 |
| 2016 | 2,050,832 | 146,115 | 189,544 |
| 2018 | 2,333,796 | 169,003 | 219,484 |
| 2020 | 507,704 | 175,990 | 171,761 |

(දත්ත - ශ්‍රීලංකා මහ බැංකුව ආගමන විගමන දෙපාර්තමේන්තුව)

වෙරළබඩ කලාපය හැරුණු කොට 1970 දශකයෙන් පසු කොළඹ නගරය කේන්ද්‍ර කරගෙන ද, සංචාරක ව්‍යාපාරය අරමුණු කරගෙන විශාල ප්‍රමාණයේ හෝටල් ඉදිවීම් ආරම්භ වූ අතර, මෙම කර්මාන්තයේ මුදල් ආයෝජනය මත රට තුළ ආර්ථික වශයෙන් විශාල වෙනස්කම් සිදු වීමටද මෙම තත්වය බලපෑවේය. තවද ක්ෂේත්‍රය තුළ කාර්යය ශුර මානව සම්පතක්ද බිහිවන්නට වූ අතර, සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිතව රාජ්‍ය ආදායම ද ක්‍රමයෙන් වැඩිවන්නට විය.

ක්‍රම ක්‍රමයෙන් සංචාරක ක්ෂේත්‍රය පුළුල් වෙත්ම මෙම ක්ෂේත්‍රය හා බැඳුණු බලපෑම් රාශියක් ද රට තුළ පැණ නැගුණු අතර, ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, හා සංස්කෘතික ප්‍රගමනයට එය ධනාත්මකව මෙන්ම ඍණාත්මකව බලපෑ අවස්ථාද හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ යහපත් ආර්ථික වෙනසකට සංචාරක ව්‍යාපාරය මහඟු රුකුලක් වූ අතර, නිෂ්පාදනය, වෙළඳාම, ආයුර්වේද, ඉදිකිරීම්, සුළු ව්‍යාපාර, ප්‍රවාහන ආදී ක්ෂේත්‍රවල දියුණුවට සංචාරක ව්‍යාපාරයෙන් විශාල පිටිවහලක් ලැබුණි.

ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික හර පද්ධතිය පිළිබඳ සැලකීමේ දී , සංචාරක ව්‍යාපාරයෙන් ඍණාත්මක බලපෑමක් සිදුවූ බව කිව හැකිය. මුල් කාල වලදී හිපි, සංස්කෘතියත් සමග මුහුදුබඩ කලාපයේ අඩ නිරුවත් සංචාරකයින් වැඩි වැඩියෙන් ගැවසීම හා ගණිකා වෘත්තිය ඉහළ යාම, ළමා අපචාර ආදිය නිසා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය විවේචනයට ලක් වීමට හේතු පාදක ඇති විය. මුල් කාලයේදී අසංවිධිතව ගොඩනැගී තිබූ මෙම සංචාරක ව්‍යාපාරය මේ වන විට ක්‍රමානුකූලව වෙනස් වී ඇත, නමුත් මෙම ව්‍යාපාරයේ අනාගත පැවැත්ම හා තිරසරභාවය පිළිබඳ සැලකීමේ දී නවතාවයකින් මේ පිළිබඳව සිතිය යුතු බව අදහසයි.

මූලික වශයෙන් මෙම සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට ක්ෂේත්‍රයේ නියලී සිටින සහ රටේ සාමාන්‍ය ප්‍රජාවගේ ආකල්ප වෙනසක අවශ්‍යතාවය දැඩි ලෙසම පවතී. මෙහිදී, සුද්දෙක්, කලු ජාතිකයෙක්, ජපනෙක්, ඉංදියානුවෙක්, චීනෙක් යන්න ආදී ලෙස ප්‍රජාවගේ සහ ක්ෂේත්‍රයේ නියලී සිටින්නන්ගේ ආකල්පයක් ඇත. බොහෝ විට මෙය තම අත්දැකීම් දැනුම. බුද්ධිය ආදී කරුණු මත රඳා පවතී. මෙම ආකල්පය සංචාරක කර්මාන්තය සඳහා ඍජුවම බලපාන අතර පොදුවේ ආගන්තුකයෙක් මෙන්ම අපේ වටිනාකම් අගයන්නෙක් ලෙස බලන්නේ කලාතුරකිනි. මෙම කර්මාන්තයේ අභිවෘද්ධිය අපේක්ෂා කරන්නේ නම් සංචාරකයින් පිළිබඳ ප්‍රජා ආකල්පය ධනාත්මකව වෙනස්විය යුතුමය. හේතුව මේමත පිහිටා ප්‍රජාව කටයුතු කරන බැවිනි.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය පිළිබඳ දත්ත හා තොරතුරු සොයා බැලීමේ දී රටතුළට පැමිණෙන සංචාරක ප්‍රමාණය පිළිබඳ වැඩි අවධානය යොමු කරන බවක් දක්නට ලැබෙන අතර, එක් එක් අයගෙන් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය පිළිබඳව තොරතුරු හා දත්ත පිළිබඳව වැඩි සැලකිල්ලක් නොදක්වයි. විශේෂයෙන්ම වැඩි සංචාරකයින් ප්‍රමාණයක් මෙරටට පැමිණීමෙන් ඒ තුළ ජනිත වන විදේශ විනිමය ප්‍රමාණය සාපේක්ෂව අඩු නම් එය රටට වාසි සහගත ලෙස බලනොපායි. එබැවින් මෙම තත්වය වෙනස්කර රටට වඩාත් වාසි ගෙන දෙන සංචාරක ව්‍යාපාරයක් පිළිබඳව සිතිය යුතුය.

ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීම රට අනුව - 2018 වර්ෂය.

| රට | සංචාරකයින් ප්‍රමාණය |
|---|---|
| ඉන්දියාව | 424,887 |
| චීනය | 265,965 |
| එ.රාජධානිය | 254,176 |

| | |
|---|---|
| ජර්මනිය | 156,888 |
| ඔස්ට්‍රේලියාව | 110,928 |
| ප්‍රංශය | 106,449 |
| මාලදිවයින | 76,108 |
| එ.ජනපදය | 75,308 |
| රුසියාව | 64,497 |
| නෙදර්ලන්තය | 57,160 |

Annual report sri lanka tourist board

මෙහිදී විශේෂයෙන් මෙරටට පැමිණෙන සංචාරකයින්ගේ ආදායම් තත්වය හා ඔවුන්ගේ ජීවන මට්ටමද සැලකිය යුතුය. ඒ අනුව ඔවුන්ගේ වියදම් කිරීමේ හැකියාව තීරණය වන අතර එය රටේ ආදායමට සෘජුවම බලපායි. එබැවින් මේ පිළිබඳව සොයා බැලිය යුතුය.

සංචාරක ව්‍යාපාරය පිළිබඳව සොයා බැලීමේදී මෙම ව්‍යාපාරය හා බැඳුණු කර්මාන්ත විශාල ප්‍රමාණයක් රට තුළ බිහි වී ඇති අතර ඒ අතර ප්‍රධාන වශයෙන්

සංචාරක හෝටල්, නිවාඩු නිකේතන හා ආපන ශාලා.

පිහිණුම් හා බෝට්ටු සේවා

සංචාරක ප්‍රවාහන සේවා

සංචාරක මගපෙන්වන්නන්

විසිතුරු භාණ්ඩ හා දේශිය අත්කම් භාණ්ඩ අලෙවිය.

දේශීය වෛද්‍ය ක්‍රම හා සංස්කෘතික සේවා.

ආදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සංචාරක ව්‍යාපාරය විහිදී යයි. විශේෂයෙන්ම මෙම ක්ෂේත්‍ර ඔස්සේ මේ තුළින් රට තුළට ගලා එන විදේශ විනිමය ප්‍රමාණය වැදගත් වන අතර, මෙම ක්ෂේත්‍ර දියුණු කිරීමේදි ශුද්ධ ලෙස රට තුළට ගලා එන විදේශ විනිමය ප්‍රමාණය ඉතා වැදගත් වන අතර සංචාරක ක්ෂේත්‍රය දියුණු කිරීමේදී දේශීය සම්පත් බහුල වශයෙන් යොදවාගෙන මෙම කර්මාන්තය දියුණු කිරීමට උත්සාහ කළ යුතුය. උදා- විදේශ සංචාරකයෙකුට ආහාර වේලක් සැපයීමේ දී එය දේශීය අමුද්‍රව්‍ය වලින් පිළයෙල කොට පිළිගැන්වීම සඳහන් කළ හැකිය. මෙහිදී රටට වඩා වාසි සහගත බව මෙම ක්ෂේත්‍රයේ නියලෙන්නන් තුල ආකල්පයක් ගොඩනැගීම වැදගත් වේ. ආනයනය කරන ලද අමුද්‍රව්‍ය යොදා ගෙන එය සිදු කරයිනම් ඒ තුළ මෙරටට වාසි අත්නොවන බව තේරුම්ගත යුතුය. එබැවින් මෙම ක්ෂේත්‍රයේ නියලෙන්නන් තුළ දැඩි ආකල්ප වෙනසක අවශ්‍යතාවය පවතී.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය පිළිබඳ කතා කිරීමේදී මෙම ව්‍යාපාරයේ අයහපත් ප්‍රතිපල පිළිබඳ ව ද කතා නොකෙර බැරිය. විශේෂයෙන්ම

ගණිකා වෘත්තිය

මත්ද්‍රව්‍ය භාවිතය

සංස්කෘතික පරිහානිය

සමාජ රෝග

ආදී අනිටු ප්‍රතිවිපාකද මෙම ව්‍යාපාරය තුල දැකිය හැකිය. නමුත් මෙම තත්වය පැහැදිලිව හඳුනාගෙන මූලික වශයෙන් සංචාරකයින් මෙරටට ගෙන්වීමේදී මෙවැනි අයහපත් දේ සඳහා යොමුවීමට වැඩි ඉඩක් ඇති සංචාරක ආකර්ෂණය සඳහා යොමු නොවීමට වගබලා ගතයුතු අතරම, රට තුළ මෙම තත්වය සීමා කිරීමටද වග බලා ගත යුතුය. මෙහිදී ද ක්ෂේත්‍රයේ නියැළි පිරිස් සහ සමස්ත ප්‍රජාවම මෙම ව්‍යාපාරය පිළිබඳව දැනුවත් කිරීම කළ හැකිය.

මෙහිදී ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය ප්‍රමුඛව කටයුතු කරන රාජ්‍ය ආයතනය ලෙස හඳුනාගත හැකිවන අතර ඒ අනුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය වෙත අවධානය යොමු කිරීම වැදගත්කොට සැලකිය හැකිය.

දැක්ම - මතකයේ රැඳෙන වඩාත්ම විශේෂිත සහ විවිධාකාර අත්දැකීම් සඳහා ලොව වඩාත්ම අනර්ඝ දූපත වශයෙන් හඳුනාගැනීමට පාත්‍රවීම.

මෙහෙවර - ස්වභාවික හා සංස්කෘතික උරුමය සහ පරිසර හිතකාමී සමාජීය සම්බන්ධතා පිළිබිඹුවන අතිවිශිෂ්ඨ අත්දැකීම් ලබා දෙන සහ ප්‍රජාවට මෙන්ම රටටද ආර්ථික ප්‍රතිලාභ උරුම කරන ඉහල වටිනාකම් වලින් යුත් ගමනාන්තය බවට පත්වීම.

මෙහිදී විශේෂයෙන්ම මේ සඳහා සමස්ත ශ්‍රී ලාංකීය ප්‍රජාවගේම දායකත්වය ලබාගැනීම වැදගත්වන අතර මේ තුළින් ශ්‍රී ලාංකේය ප්‍රජාවට ලබාගත හැකි වාසි බොහෝය. මෙහිදී විශේෂයෙන්ම ශ්‍රී ලාංකේය ග්‍රාමීය ප්‍රජාවට වැඩි වාසි අත්කරගත හැකි අතර, ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය, ස්වභාවික පරිසරය, හා සමාජ හිතකාමී බව අදටත් සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාව තුළ පවතී. ඒ අනුව ශ්‍රී ලාංකේය ග්‍රාමීය ප්‍රජාව මේ වටා හවුල්කර ගැනීම පිළිබඳව සහ ඒ සඳහා යොදා ගන්නා උපාය උපක්‍රම මොනවාද යන්න පිළිබඳව සිතා බැලිය යුතුය.

වර්තමානයේ උද්ගතවී ඇති කොරෝනා වසන්ගතය හමුවේ ලොව සංචාරක ව්‍යාපාරය පසු බෑමකට ලක්වී තිබුනත් මෙම වසංගතයෙන් පසුව එලඹෙන අවධිය පිළිබඳ සිත් යොමු කල යුතු අතරම, දීර්ඝ කාලයකින් පසුව මෙම ව්‍යාපාරය නැවත සක්‍රීය වීමට පටන් ගන්නා අවධියකදී අපේ වෙනස්කම් දැන්මම සැලසුම් කිරීම කල යුතුව ඇත.

# සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන හා ප්‍රජාවගේ ජීවන තත්වය.

ඩබ්. අනූෂා ප්‍රියන්ජනී

ආදායම් උත්පාදන ව්‍යාපෘතීන්හි ප්‍රධාන අරමුණ වන්නේ දිළිඳුබවේ සීමාවට පහළින් සිටින ජන කොටස්වල ආදායම වැඩි කර ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීමයි. මේ තුළින් ග්‍රාමීය ආර්ථිකය සක්‍රියත්වයට පත් වන අතරම ඒ තුළින් මානව හා සමාජ ප්‍රාග්ධනය කාර්යක්ෂම කර ගැනීමට හැකි වන බව මේ පිළිබඳව විවිධ රටවල කරන ලද පර්යේෂණවලින් හෙළි වී ඇත.

අදායම් උත්පාදන ව්‍යාපෘති යන්නෙන් කෙටියෙන් අදහස් කරන්නේ ස්වංරැකියා උත්පාදනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් වේ. මෙම ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ ස්වයංරැකියාවන් කිරීමට කැමැත්තක් දක්වන අය සඳහාය. අදාල කාලසීමාව තුළ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ලාභයක් ලැබීම හෝ පවුලේ යැපීම සඳහා අඩු ආදායම්ලාභි පුද්ගලයන්ගේ ඉපැයීම් ව්‍යාප්තිය ඉහළ නැංවීමට ආදායම් උත්පාදන වැඩසටහන් ඉවහල් වී ඇති බව අධ්‍යයනවලින් අනාවරණය වී ඇත. අඩු අධ්‍යාපන මට්ටමක් සහිත ආදායම් උත්පාදන වැඩසටහන්වල නිරත අයගේ ඉපැයීම්වල වර්ධනය ආරම්භක කාලසීමාව හැරුණු කොට ඔවුන්ගේ සමකාලීන වැටුප් ලබන රැකියාවල නිරත වූවන්ගේ ඉපැයීම් වර්ධනයට වඩා වැඩි වේගයකින් වර්ධනය වන බව අධ්‍යයනය වලින් හෙළි වී ඇත. (fairlie, 2004) ආදායම් උත්පාදන වැඩසටහන් ඍජුවම පවුලේ ආදායම හා වත්කම වෙනස් වීමට හේතුවක් වි ඇති අතර එමඟින් සමාජ හා මානව ප්‍රාග්ධනය වෙනස් වීමටද හේතුවක් වේ. මෙවැනි පසුබිමක් තුළ සමෘද්ධි අඩු ආයම්ලාභි පවුල් සඳහා ආදායම් උත්පාදන වැඩසටහනක් වශයෙන් නිෂ්පාදන ගම්මාන වැඩසටහන හඳුන්වා දීමෙන් අපේක්ෂා කරන ලද්දේ ඔවුන් සමාජ ආර්ථික වශයෙන් සවිබලගැන්වීම තුළින් ජීවන තත්වය උසස් කිරීමයි.

ලංකාව වැනි රටක් තුළ වඩාත් තිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කරගැනීම සඳහා අර්බුදවලින් යුත් නාගරික-කේන්ද්‍රීය දැක්මට විකල්පව යෝජනා කල හැක්කේ ග්‍රාමීය අංශයේ කරනු ලබන ආයෝජනවලට ප්‍රමුඛතාවය දීමයි. ආර්ථික පදනම සහ ග්‍රාමීය වත්කම් අනුව ග්‍රාමීය ආර්ථික ජීවිතයේ එක් විශේෂත්වයක් වන්නේ ආදායම් හා වියදම්වල සැලකිය යුතු පංගුවක් මුදල්-නොවන ස්වභාවයක් ගැනීමයි. වෙළඳපොලට නොඑන මෙබඳු බොහෝ ක්‍රියාකාරකම් ජාතික දත්තවල අඩංගු වන්නේ නැත. ඉන්ධන සඳහා දර සොයාගැනීම, ගෙවතු වගා මඟින් එළවලු ලබාගැනීම, ගෘහස්ථ පරිභෝජනය සඳහා කෘෂි හා ධීවර නිෂ්පාදිතවල කොටසක් ඉතිරි කරගැනීම ආදිය මෙබඳු මුදල්මය-නොවන ක්‍රියාකාරකම්වලට නිදර්ශන වන අතර ගම්බද පවුල්වල ආර්ථික ජීවිතයේ වැදගත් පදනමක් වන මෙම අංශය ප්‍රධාන දහරාවේ ආර්ථික විශ්ලේෂණවලට බොහෝ විට විෂය නොවේ. කෙසේ වූවද නියග හෝ ගංවතුර ආදී ස්වභාවික ආපදාවලට ලක්වූ විට මෙම ආර්ථික පදනමට හානි සිදුවිය හැක. එසේම වෙළඳපොල මඟින් ඇති කරන පීඩනයන්ට ද ග්‍රාමීය ප්‍රජාවන්ට මුහුණ දීමට සිදුවේ. උදාහරණ ලෙස රටේ බොහෝ ගම්බද පෙදෙස්වල ව්‍යාප්ත වී තිබෙන විනාශකාරී ක්ෂුද්‍ර-මුල්‍ය ණය සේවා මඟින් ගම්බද පවුල් මත කරන බලපෑම බරපතලය. මෙබඳු ණය උගුලකට හසුව ණයහරිත වූ විට එම ණයගැතිභාවය ඔවුන්ගේ ආර්ථික ජීවිතය කෙරෙහි බලපායි. මෙවැනි පසුබිමක් තුළ ග්‍රාමීය ජනතාව නඟා සිටුවීම සඳහා ඔවුන් සවිබලගැන්වීම තුළින් ඔවුන්

ශක්තිමත් කිරීමත් ඒ සඳහා ඔවුන් තුළ ආකල්ප කුසලතා වැඩිදියුණු කිරීමත් මෙම ආදායම් උත්පාදන වැඩසටහනට සමගාමීව සිදු කරනු ලබයි.

ආදායම් උත්පාදන ව්‍යාපෘති මඟින් දිළිඳුබවේ සීමාවට පහළින් සිටින පුද්ගලයින් ඉහළ මට්ටමක් කරා යොමු කළ හැකිය. අඩු ආදායම, අඩු ඉතිරි කිරීම්, අඩු ආයෝජනය, අඩු ඵලදායිතාව, දිළිඳුකම හා දුර්වල ආකල්ප ඇති පුද්ගලයින් ඉහළ ආදායම, ඉහළ ඉතිරි කිරීම්, වැඩි ආයෝජනය, වැඩි ඵලදායිතාව හා උසස් සමාජ ආර්ථික තත්වය හා ධනාත්මක ආකල්ප සහිත පුද්ගලයන් බවට පරිවර්තනය කළ හැකිය. මේ අනුව සාර්ථක ආදායම් උත්පාදන වැඩසටහන්, පුද්ගලයන්ගේ ජීවනෝපාය සංවර්ධනය කරමින් සමාජ සජීවීකරණය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. මෙය රටක සංවර්ධනයෙහිලා බෙහෙවින් වැදගත් වේ. පහත දැක්වෙන්නේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් මඟින් අපේක්ෂිත තත්වයයි.

| පවත්නා තත්වය | | අපේක්ෂිත තත්වය |
|---|---|---|
| • අඩු ආදායම<br>• අඩු ඉතිරිකිරීම්<br>• අඩුඵලදායිතාව<br>• දිළිඳුබව<br>• දුර්වල ආකල්ප | → | • ඉහළ ආදායම<br>• ඉහළ ඉතිරිකිරීම්<br>• වැඩි ඵලදායිතාව<br>• වැඩි ආයෝජන<br>• උසස් සමාජ ආර්ථික තත්වය<br>• ධනාත්මක ආකල්ප |

ඒ අනුව සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන නිෂ්පාදන ගම්මාන වැඩසටහන අඩුආදායම්ලාභීන් සවිබලගන්වා ඔවුන් ගේ ජීවන තත්වය උසස් කිරීම ප්‍රමුඛ අරමුණ වී ඇත. ඒ අනුව මෙම නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ අරමුණු වශයෙන්

1. ප්‍රධාන නිෂ්පාදනය හා සම්බන්ධ කෘෂිකාර්මික, සත්ත්වපාලන, ධීවර කර්මාන්තය හා සේවා මඟින් ඇති කරන ලද නිෂ්පාදනය වර්ධනය කිරීම.
2. අගය එකතු කළ නිෂ්පාදන වර්ධනය සඳහා පියවර ගැනීම.
3. නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ වූ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවධානය යොමු කිරීම.
4. අලෙවි සම්බන්ධතා සඳහා පුද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයක් ගොඩ නැඟීම.
5. නිශ්චිතව සවිබලගැන්විය හැකි සමෘද්ධිලාභී පවුල් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතර ගම්මානයේ සියලු දෙනා අදාළ නිෂ්පාදන කටයුතු සඳහා දායක කර ගැනීම.
6. අනෙකුත් ග්‍රාමීය නිෂ්පාදනයන්ට අවශ්‍ය අමතර ආදායම් ලබා ගැනීමට ඉඩ සැලැස්වීම.
7. ගම්මානයේ සමාජිකයින්ගේ සහභාගීත්වය තුලින් එකමුතුකම, සහජීවනය ඇති කිරීම.
8. ගම්මානයෙහි සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය හා සියලු නිවාසවලට විදුලිය හා ජල පහසුකම් ලබා දීම.
9. ආදර්ශ ගම්මානයේ ඓතිහාසික වටිනාකමක් ඇති සියලු පෞරාණික ස්ථාන කෙරෙහි ජනතාවගේ ආකර්ශනය වර්ධනය කිරීම.

මේ වන විට ලංකාව පුරා මෙම නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක වන අතර එමගින් ඊට සම්බන්ධ ජනතාවගේ ජීවන තත්වයේ සැබෑ වෙනසක් සිදු වී ඇති බව අධ්‍යයනවලින් හෙළි වී ඇත. ඒ ඒ ප්‍රදේශවලට ආවේනික කර්මාන්ත මෙන්ම එම ප්‍රදේශවල සම්පත් බහුල කර්මාන්ත මේ සඳහා තෝරා ගෙන ඇති අතර තෝරා ගත් අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා ද්‍රව්‍යමය හා මූල්‍යමය වශයෙන් ආධාර ලබා දී ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. මීට සමගාමීව ආධාර ලබා ගත් පවුල් සේම ගමේ අනෙකුත් ප්‍රජාවද අද වන විට මේ කෙරෙහි අවධානය යොමු කිරීම නිසා මෙම ආදර්ශ ගම්මාන වැඩසටහන අද වන විට පොකුරු ගම්මාන දක්වා වර්ධනය වී ඇත. මෙම වැඩසටහන සඳහා වැඩි වශයෙන් යොමු වී ඇත්තේ ග්‍රාමීය කාන්තාවන් බව 2021 වර්ෂයේ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මඟින් මේ පිළිබඳ කරන ලද අධ්‍යයනවලදී හෙළි වී ඇත. මෙම නිෂ්පාදන ගම්මාන වැඩසටහන නිසා එම ගම්මානවල ජනතාවගේ ආර්ථික මෙන්ම සාමාජීය හා සංස්කෘතික, අධ්‍යාපන ආදී සියලු ක්ෂේත්‍රවල සැළකිය යුතු දියුණුවක් සිදු වී ඇති බව ප්‍රතිලාභින්ගේ අදහසයි. සමස්තයක් වශයෙන් ගත් කළ මෙම වැඩසටහන දිවයිනපුරා ගම්මානවල ක්‍රියාත්මක අතර එය සෘජුවම ජාතික ආර්ථිකය නඟා සිටුවීම සඳහා දායක වී ඇත.




සමාජය තුළ සාක්ෂරතා මට්ටම වර්ධනය වන විට පුද්ගලයින් ආදායම් උත්පාදන වැඩසටහන් කරා යොමු වීම ඉහළ යයි. මේ නිසා පුද්ගලයන් විධිමත් හා අවිධිමත් ආකාරයෙන් දැනුමෙන් පෝෂණය වන විට ආදායම් වැඩි කර ගත හැකි ප්‍රවේශයන් කරා නැඹුරු වෙයි. දැනුමෙන් හා තොරතුරු වලින් පුද්ගලයන් පෝෂණය වන විට ජීවන රටාවන් හා ජීවන අපේක්ෂාවන් වැඩි දියුණු වීම සිදු වෙයි. එවිට පුද්ගලයින් ඵලදායි ආර්ථික ව්‍යාපෘතිවලට වැඩි වශයෙන් යොමු වීමට පෙළඹීම සිදු වෙයි. ග්‍රාමීය ප්‍රදේශවල ජන කොටස් කෘෂිකර්මය හා වෙනත් කර්මාන්ත ආශ්‍රිත ස්වයංරැකියා ව්‍යාපෘතීන්වලට යොමු වීම තුළින් නාගරික ප්‍රදේශවලට ජනතාව සංක්‍රමණය වීම පහසුවෙන් පාලනය වෙයි. එමඟින් සංකීර්ණ සමාජ ආර්ථික ගැටළු ඇති වීම වලක්වා ගත හැකිය.

විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල වැඩි ජනගහනයක් දරිද්‍රතා මට්ටමට පහළින් සිටී. මෙවැනි ආදායම් උත්පාදන ව්‍යාපෘති තුළින් දීර්ගකාලීනව ඔවුන් ආදායම් ඉපැයීම්වලට යොමු වන අතර එය ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට නිතැතින්ම පත් වේ. මෙමඟින් ප්‍රතිලාභී ජනතාවගේ ආදායම් තත්වය වැඩි වී ගම තුළ එම නිෂ්පාදනයට අදාල අතුරු නිෂ්පාදන පමණක් නොව විවිධ කර්මාන්ත

සඳහා අවශ්‍ය වන විවිධ අමුද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය, බීජ, ඇසුරුම්කරණය වැනි විවිධ කර්මාන්ත බිහි වී ඇති අතර එමඟින් තවත් පිරිසකට රැකියාවන්ද නිර්මාණය වී ඇත. ග්‍රාමීය ප්‍රදේශවල මෙම ආදයම් උත්පාදන වැඩසටහන් සඳහා නැඹුරු වී ඇති පිරිසෙන් 90% කට වැඩ පිරිසක් කාන්තාවන් වන අතර කාන්තාවන් ගෘහස්තව ආදායම් ඉපැයීමේ මාර්ග සඳහා නැඹුරු වීම වැඩි වන විට එමඟින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් වේ. එමෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල විරැකියාවෙන් පෙළලන තරුණ කොටස් ස්වකැමැත්තෙන් දෙමව්පියන්ගේ මෙම වැඩසටහන් සඳහා සහභාගී වන විට ග්‍රාමීයව පවතින තරුණ විරැකියා ප්‍රශ්නයටද නිරායාසයෙන් විසඳීම මෙම ව්‍යාපෘති මඟින් ලඟාකරගත් වක්‍ර ප්‍රථිඵල සේ සඳහන් කළ හැකිය. එමෙන්ම මෙම වැඩසටහන් මඟින් විවිධ සුළු ජනවාර්ගික කොටස් ද සවිබලවීම සිදු වන අතරම එමඟින් ජාතික ආර්ථිකයට ඇති කරන බලපෑම සුළු පටු නොවේ. ආදායම් ඉපැයීම් වර්ධනය වීමත් සමඟම ග්‍රාමීය ජන කොටස්වල රැකියාවල ස්වභාවය වෙනස් වීම හා කාන්තාවන්ට ජාතික ආර්ථිකයට සක්‍රීයව දායකවීමට හැකි වීම නිසා නිෂ්පාදන ගම්මාන වැඩසටහන ආදායම් උත්පාදන වැඩසටහනක් ලෙස සාර්ථක ප්‍රථිඵල අත් කර ගෙන ඇත.

# ග්‍රාම සංවර්ධනයට දායක කරගත හැකි කුඹල් කර්මාන්තයේ වර්තමාන ස්වරූපය.

පී.ඒ. චිත්‍රා ජයසිංහ

කුඹල් කර්මාන්තය පාරම්පරිකව පැවත එන කර්මාන්තයකි. මැටි උපයෝගී කර ගනිමින් නිවසට අවශ්‍ය උපකරණ වන වලං, මුට්ටි, නැඹිලි, මැටි කෝප්ප, පිගන්, කෝප්ප, කරමුඩි, කිරිහට්ටි, මල් පෝච්චි, වතුර පිල්ටර්, ගුරු ලේත්තු, ලිප්, බුජේසෙට් මෙන්ම ගොඩනැගිලි සෙවිලි කිරීම සඳහා අවශ්‍ය වන දැද, කලාත්මක විසිතුරු මැටි භාණ්ඩද නිපදවේ. විදේශිකයින් අප රටේ නිපදවන අලංකාර විසිතුරු භාණ්ඩ සඳහා දක්වන්නේ දැඩි ප්‍රියතාවයකි. එමගින් අප රටට අපනයන ආදායමක්ද හිමි වේ. එමෙන්ම ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහල දැමිය හැකි කර්මාන්තයක්ද වේ. අතීතයේ මෙම කර්මාන්තයේ නියැලි පරම්පරාවල අය තාමත් ලංකාවේ විවිධ ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වේ. අදටත් ඔවුන් තම ජීවිකාව ගෙන යන්නේ කුඹල් කර්මාන්තයේ නිරත වෙමිනි. කෑගල්ල, මාතර, ගම්පහ, ගාල්ල, කුරුණෑගල වැනි දිස්ත්‍රික්ක වල වැඩි වශයෙන් කුඹල් කර්මාන්තයේ නිරත වූවන් වේ. මැටි භාජන නිපදවීම ඉතාමත් පාරසරික හිතකාමී, මනුෂ්‍යයාගේ සෞඛ්‍යයට හිතකර කර්මාන්තයකි. දේශීය පාරම්පරික කර්මාන්තයක් වන මෙම මැටි කර්මාන්තය පාරසරික හිතකාමී කර්මාන්තයක් වන අතර ග්‍රාමීය අර්ථිකය නංවා ලිය හැකි කර්මාන්තයක්ද වේ.

මිනිසා නිරත කර්මාන්ත අතර මැටි කර්මාන්තය හෙවත් කුඹල් කර්මාන්තයට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. ආදි මානවයා ගල් යුගයෙන්, දඩයම් යුගයෙන් ගෘහස්ථ ගොවි දිවියට සංක්‍රමණය වීමත් සමගම මැටි කර්මාන්තයට අවශ්‍ය පදනම නිර්මාණය විය. ඊට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම ගංගා නිම්න ආශ්‍රිතව දිවි ගෙවූ ජනයාට පහසු විය. පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් වලදී සොයා ගැණුනු වලං කැබලි හා මැටි පුවරු වලින් මෙරට ඓතිහාසික කුඹල් කර්මාන්තය පිළිබඳ වැදගත් සාක්ෂි අනාවරණය වේ. දැනට හමු වී ඇති පැරණිතම මැටි බඳුන් අවශේෂ ලැබී ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වරකාපොල දොරවක කන්ද ගල් ලෙනෙනි. ඒවා ක්‍රි.පූ.530 ට අයත් යැයි නිර්ණය කර ඇත. මැටි කර්මාන්තය සම්බන්ධ සිරිත් විරිත් පිළිබඳ මහාවංශය, ථූපවංශය, පූජාවලිය ආදි ලිඛිත ග්‍රන්ථ හා ජනප්‍රවාද වල සඳහන් වේ. මැටි කාර්මිකයා කුම්බකර යනුවෙන්ද හඳුන්වනු ලබයි. කුම්බය යනු කලගෙඩියයි. කර යනු කරවන්නාය.

ජනප්‍රවාදයක එන පරිදි බඳුනක නිර්මාණයේ ඇරඹුම අලියෙකු මැටි පොළවක තැබූ පාද සටහනකින් සිදු වී ඇත. මැටි පොළවක තැබූ පාසටහනක් දුටු මිනිසෙකු එය සියුම් ලෙස පොළොවෙන් වෙන් කර ගත්තාය යන්න ජනප්‍රවාදයේ එයි. අමු මැටි ගින්නෙන් පිලිස්සීමෙන් ඉතා තද බවට පත්වන නිසා වැඩි කලක් පාවිච්චි කළ හැකි බව දැනගත් මානවයා මේ බඳුන් හා වෙනත් නිර්මාණ විවිධ අත්හදා බැලීම් වලට භාජනය කළේ ඉන් පසුවය. විවිධ හැඩ හා ප්‍රමාණයන් උපයෝගී කර ගනිමින් මැටි බඳුන් නිර්මාණයේ ලා මානවයා විසින් කරවන ලද අත්හදා බැලීම් විශ්මය ජනකය. එමෙන්ම විද්වත් මත අනුව ප්‍රාග් ඓතිහාසික මානවයාගේ මඩෙහි එරෙන පා සටහන් ලැව් ගිනි ආදි ස්වභාවික හේතූන් මගින් පිළිස්සීමෙන් පසු එම ගැඹුරු සටහන්වල වතුර පිරී තිබෙන අයුරු දැක ප්‍රථමයෙන් භාණ්ඩ සෑදීමේ සංකල්පය පහළවන්නට ඇති බව එක් මතයකි. තවද මිනිසුන්ගේ හා සතුන්ගේ හිස් කබල්වලට යම් යම් දෑ ගෙන යාමට භාවිතාකර ඇති බවත් පසුව ඒ වෙනුවට මැටි භාණ්ඩ තනා ගත් බවද මතයක් වේ. කුරුළු

කුඩුවලට මැටි තවරා භාණ්ඩ ලෙස භාවිතාකර පසුව ඒ වෙනුවට මැටි වලින් භාණ්ඩ තනා ගත් බවද ඉතිහාසයේ කියවේ.

ශ්‍රී ලංකාවේ මැටි කර්මාන්තය වර්ෂ 4000 ක් තරම් ඈතට දිවෙන ඉතිහාසයක් ඇති බව විවිධ ප්‍රදේශවල සිදු කරන ලද කැණීම් මත හමුවූ නෂ්ඨාවශේෂ සාක්ෂි දරයි. එක් එක් යුගවල මැටි භාණ්ඩ මගින් එම යුගයේ කර්මාන්තයේ ගුණාත්මකභාවය, ශිල්පීය ප්‍රවණතා, කලාත්මක පරිසමාප්තිය, ස්වරූපය, වර්ගය, බෙදාහැරීම, භාවිතය, වෙළදාම හා තාක්ෂණය යනාදි තොරතුරු අනාවරනය වේ. (De Silva 2008:12)

මැටි කර්මාන්තයේ නියැලෙමින් නිර්මාණ හැකියාව ප්‍රකට කළ ශිල්පීන්හට ගම්වර පවා ප්‍රදානය කිරීමට හෙළ රජවරු ක්‍රියා කර ඇත. විජයාවතරණයෙන් පසු විවධ ගෝත්‍රවලට අයත් පිරිස් ලංකාවට පැමිණි අතර විජය කුමරුට මදුරා පුරයෙන් කුමරියක් ගෙන එන විට ඒ සමග අටලොස් කුලයක ශිල්පීන්ද ලංකාවට පැමිණ ඇත. එම අටලොස් කුලය අතර කුඹල් කුලයද සිටි බව පුරාණ පොතපතේ සදහන්ව ඇත. මෙරටට ශ්‍රී මහ බෝධීන්වහන්සේ වැඩම කරන විටද කුඹල් කරුවන් පැමිණ තිබේ. (මහා වංශය 1957:17). ඔවුන් කුල අටකින් සමන්විත බවද සදහන්ය.( සිංහල බෝධිවංශය 1970:180).

මැටිකර්මාන්තකරුවා ස්වභාව ධර්මයත් සමග ජීවත් වූ කෙනෙකු විය. ඔහුට අවශ්‍ය සියලුම අමුද්‍රව්‍ය ලබා ගත්තේ මහ පොළොව ඇසුරින්ය. එනිසා ඔහු භූමියට ගරු කළා මෙන්ම ආදරය කළ අයෙකි. ඔවුන් මහ පොළොවට වන්දනාමාන කළ අතර මහී කාන්තාව දෙවගනක් සේ සළකා එමගින් ශක්‍රිකත්වය හා සමෘද්ධිය ලැබේය යන විශ්වාසය මත වන්දනාමාන කළේය. පසු කාලීනව ඔවුනට එරෙහිව නැගී සිටි සමාජ බලවේග ඔවුන් පීඩනයට පත් කරමින් සමාජයේ පහළ ස්ථරයක අයෙකු ලෙස නම් කරනු ලැබීය. සිංහල රජු දවස කුඹල් කාර්යංශය බඩහැල නමින් හැදින්වීය. සිංහල සාහිත්‍යකරුවන් කුම්භකාරයා (සිංහල මිලින්ද ප්‍රශ්නය 1970 :62) යන්න හදුන්වා ඇත්තේ මෙම කුඹල් කරුවාටය.

ශ්‍රී ලංකාව විදේශිකයින්ට නතුවීමෙන් පසු දේශීය කර්මාන්තවලට නිසි අවධානයක් යොමු වූයේ නැත. එහෙත් පාරම්පරිකව පැවත එන ශිල්ප ඥානය ගිලිහී යාමට ඉඩ නොදී පරපුරෙන් පරපුරට කෙසේ හෝ රැක ගැනීමට අප රටේ කුඹල් කර්මාන්ත කරුවන් කටයුතු කර ඇත. අදද අඩු වැඩි වශයෙන් මැටි කර්මාන්තයේ ශීල්පීහු නිරතව සිටී. ලොව අද්විතීය නිර්මාණශීලි කර්මාන්තයක් වූ මැටි කර්මාන්තයට උරුමකම් කියන කුඹල් ප්‍රජාව මුලින්ම ශීලාචාර වූ පිරිස සේ සැළකේ.

දේශීය මැටි කර්මාන්තයේදී මැටි වර්ග දෙකක් භාවිතා කෙරේ. එනම් කෙයොලින් මැටි හා දේශීය මැටි වේ. කෙයොලින් මැටි සැදෙන්නේ ජීර්ණය වූ සෙල්පාර් පොළොවේ තැන්පත් වීමෙනි. කෙයොලින් මැටි සුදු පාටය. එය ප්‍රාථමික, ශේෂ, කිරි මැටි ආදි නම් වලින් හදුන්වයි. කෙයොලින් මැටි හැකිලීමේ ගුණයෙන් හා ඇළෙන සුළු බවින් වැඩිය. එනිසා කෙයොලින් මැටි වලින් භාණ්ඩ සෑදීමේදී පෙල්ස්පාර්, සිලිකා වැලි, ක්වාට්ස් යන ඛණිජ වර්ග කෙයොලින් හා මිශ්‍ර කරයි. දේශීය රතු මැටි යනු කෙයොලින් වැසි ජලයත් සමග සේදී ගොස් ගංගා දෙපස හා කුඹුරු දෙපස තැන්පත් වේ. එසේ තැන්පත් වූ මැටි කාලයක් ගත වූ පසු ශාක හා සත්ව රසායනික ද්‍රව්‍ය සමග සංයෝග වීමෙන් රතු මැටි බවට පත්වේ. දියළු, ද්විතියික මැටි ආදි නම්වලින්ද හදුන්වයි. කැළණි ගග හා ගිංගඟ ආශ්‍රිතව බංගදෙණිය, අනුරාධපුරය, කොච්චිකඩේ, අලුත්නුවර දේශීය රතුමැටි පිහිටා ඇති අතර එම මැටි ස්වභාවිකව භාණ්ඩ තැනීමට සුදුසු ආකාරයට සැකසී තිබේ. මෙම මැටි උපයෝගි කර ගනිමින් නිවසට අවශ්‍ය උපකරණ, ගොඩනැගිලි සෙවිලි කිරීම සඳහා අවශ්‍ය වන දෑ මෙන්ම කලාත්මක මැටි භාණ්ඩ නිපදවේ.

විදේශිකයින් අපරටේ නිපදවන අලංකාර විසිතුරු භාණ්ඩ සඳහා දක්වන්නේ දැඩි ප්‍රියතාවයකි. එමගින් අප රටට අපනයන ආදායමක්ද හිමි වේ. එමෙන්ම ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහල දැමිය හැකි කර්මාන්තයක්ද වේ. අතීතයේ මෙම කර්මාන්තයේ නියැලි පරම්පරාවල උදවිය තාමත් ලංකාවේ විවිධ ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වේ. අදටත් ඔවුන් තම ජීවිකාව ගෙන යන්නේ කුඹල් කර්මාන්තයේ නිරත වීමෙනි. කෑගල්ල, මාතර, ගම්පහ, ගාල්ල වැනි දිස්ත්‍රික්ක වල වැඩි වශයෙන් කුඹල් කර්මාන්තයේ නිරත වුවත් කුරුණෑගල දිස්ත්‍රික්කයේද ප්‍රදේශ ගණනාවක එනම් පඩුවස්නුවර, කටුපොත, මහව, රුක්මලේ, මුරුතැංගේ ආදි ප්‍රදේශ වල ක්‍රියාත්මක වේ. එහෙත් මෙම මැටි ගම්මානවල නිරත පවුල් එම කර්මාන්තයෙන් බොහෝ සේ ඈත් වීමක් දක්නට ලැබෙන අතර බොහෝ ගම්මානවල සුළු පිරිසක් පමණක් කර්මාන්තයේ නියැලේ. එම ප්‍රදේශ වල ඉතා සාර්ථකව මැටි කර්මාන්තයේ යෙදෙන පවුල් මෙන්ම ගම්මානද ඇත. ඇලුමිනියම් හා ප්ලාස්ටික් වැනි දේ වලින් සකස් කරන ආදේශක භාජන මෙන් නොව මෙම මැටි භාජන ඉතාමත් පාරසරික හිතකාමී, මනුෂ්‍යයාගේ සෞඛ්‍යයට හිතකර කර්මාන්තයකි. දේශීය පාරම්පරික කර්මාන්තයක් වන මෙම මැටි කර්මාන්තය පාරසරික හිතකාමී කර්මාන්තයක් වන හෙයින් හා ග්‍රාමීය අර්ථිකය නංවාලිය හැකි කර්මාන්තයක්ද වේ.

එසේ වුවත් වර්තමානය වන විට මැටි කර්මාන්තකරුවන් මෙම වෘත්තියෙන් දුරස්වීමක් දක්නට ලැබෙන අතර ඒ සඳහා බලපාන කරුණු ගණනාවක් මේ සඳහා හේතු වී ඇත.

- නිවසේ වයස්ගත කාන්තාවන් පමණක් මැටි කර්මාන්තයේ නියැලීම.

- තරුණ පරපුර මෙම කර්මාන්තයෙන් ඉවත් වී පෞද්ගලික ආයතන වන ඇගළුම් කර්මාන්ත, හෝටල් ක්ෂේත්‍රය ආදි රැකියාවලට යොමු වීම හා යකඩ එකතු කිරීමේ රැකියාවලට යොමු වීම.

- මැටි කර්මාන්තය ඉතා වෙහෙසකාරි රැකියාවක් නිසා වැඩිහිටි පරපුරද කර්මාන්තයෙන් ඉවත් වීම.

- මැටි කර්මාන්තයේ යෙදෙන්නන්ගේ දරුවන් උසස් අධ්‍යාපනය ලබා රජයේ රැකියා වලට යොමු වීම.

- මැටි කර්මාන්තයේ යෙදෙන්නන් කුලහීන යැයි සමාජය සැළකීම මත මෙම පවුල්වල දරුවන්ගේ විවාහ කටයුතු වලදී කර්මාන්තයෙන් ඉවත්වීම.

- දිගු කාලීනව මැටි පෑගීම හා සකපෝරුවේ හිඳගෙන සිටීම මත කාන්තාවන්ට දණ හිස් අමාරු, පාදවල අමාරු, කොන්දේ අමාරු වැනි සෞඛ්‍යමය ගැටළු මත කර්මාන්තයෙන් ඉවත් වීම.

- අමුද්‍රව්‍ය වශයෙන් ලබා ගන්නා මැටි සපයා ගැනීමේ අපහසුතාවය.

-වලං සඳහා සාධාරණ මිලක් නොලැබීම.

-අතරමැදි වෙළඳුන්ට හසුවීම.

- මැටි නිෂ්පාදනවල ගුණාත්මකභාවය පහල මට්ටමක පැවතීම මත ඉල්ලුම අඩුවිම.

- වලං කර්මාන්තයට තාක්ෂණය යොදා නොගැනීම.

- ගෑස්වලං නිෂ්පාදනය නොකිරීම.

- නිෂ්පාදන විවිධාංගීකරණය නොවීම.

මෙම කරුණු නිසා කුඹල් කර්මාන්තයෙන් කර්මාන්තකරුවන් ඉවත්වීමක් දක්නට ලැබෙන අතර කර්මාන්තය සාර්ථකව සිදු කරන කර්මාන්තකරුවන් එය සාර්ථකව සිදු කිරීමට පහත පහත කරුණු බලපා ඇත.

- පවුලේ සියළු දෙනාම මැටි කර්මාන්තයේ යෙදීම.

- තරුණ පරපුර කර්මාන්තයට යොමු වීම.

-තාක්ෂණය ගලපා ගැනීම. (විදුලි සකපෝරු , මැටි අඹරන මැෂින්)

- කර්මාන්තයේ යෙදෙන්නන්ගේ සාමූහිකත්වය හා එතුළින් වෘත්තියට අදාළ සමිති සංවිධාන පිහිටුවා ගැනීම.

- නිෂ්පාදකයින් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී සහතිකය ලබා ගැනීම.

- ගෑස් වලං නිපදවීම.

- මැටි නිෂ්පාදනවල ගුණාත්මක භාවය ආරක්ෂා කර ගැනීම.

- අතර මැදි වෙළඳුන්ට හසු නොවී තම නිෂ්පාදන අදාළ ස්ථාන වෙත නිෂ්පාදකයින් විසින්ම අළෙවි කිරීම.

- මැටියෙන් කළ නව නිර්මාණ සඳහා යොමු වීම.

-නිෂ්පාදන භාණ්ඩ විවිධාංගීකරණය.

-නිෂ්පාදනයේදී වලං අච්චු යොදා ගැනීම.

-රජයේ ආයතන මෙම පාරම්පරික කර්මාන්ත නගා සිටුවීමට දායක වීම

ආදියයි. මෙම සාර්ථකත්වයට බලපා ඇති කරුණු කුඹල් කර්මාන්තයට යොදා ගැනීමෙන් අපගෙන් ගිලිහි යන පාරම්පරික කර්මාන්ත රැක ගැනීමට මෙන්ම ග්‍රාමීය ආර්ථිකය නංවාලීමටද හැකියාව පවතී.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.**


1. De Silva, Nimal and Dissanayaka, Ranjith Bandara (2008), A Catalogue of Anciant Pottery from Sri Lanka, Postgraduate Institute of Archaeologgy, Colombo
2. Skibo, james M. and Feinman, Gary M. (1999), Pottery and People, The University of UTAH Press, Salt Lake City
3. කුමාරස්වාමි, ආනන්ද (1962), මධ්‍යකාලීන සිංහල කලා (පරි.) එච්.එම්. සෝමරත්න, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ
4. මහාවංශය 1 (1996), (පරි.) ශ්‍රී සුමංගල හිමි සහ ද සිල්වා, දොන් අන්ද්‍රිස් බටුවන්තුඩාවේ, දීපානි ප්‍රකාශන, නුගේගොඩ
5. සිංහලබෝධිවංශය (1970), (සංස්) ඩී.පී.ආර්. සමරනායක, ගුණසේන, කොළඹ
6. සිංහල මිළින්ද ප්‍රශ්නය (1970), (සංස්) ගලගම පණ්ඩිත ශරණංකර හිමි, කොළඹ
7. පීරිස්, රැල්ප් (1964), සිංහල සමාජ සංවිධානය, සමන් ප්‍රකාශකයෝ, කොළඹ

# වස විෂෙන් තොර වගාවට කාබනික දියර පොහොර.

*අෂාන් ප්‍රනාන්දු*

හැටේ දශකයේ ආරම්භවූ හරිත විප්ලවයත් සමඟ කෘෂි නිෂ්පාදනවල අස්වැන්න ඉහල නැංවිම සඳහා රසායනික පොහොර හා කෘෂි රසායනික පරිභෝජනය ඉහල ගිය අතර ඒ සමඟ එයට ඇති අධික ඉල්ලුමත් සමඟ ප්‍රමිතියෙන් තොර, බාල හා බැරලෝහ සහිත කෘමිනාශක, වල්නාශක හා පොහොර ශ්‍රී ලංකාවට ගලා එන්නට විය. මේ නිසා රටේ පරිසර පද්ධතියට මේ වන විට හානි සිදු වි ඇති අතර මෙමගින් වගා කරන ආහාර විෂ සහිත විම හා භූමියේ ජලය අපවිත්‍රවිම සිදුව ඇත. මේ නිසා ශ්‍රී ලංකාව තුළ මේ වන විට පිළිකා හා වකුගඩු රෝග බහුලව දක්නට ඇත. මෙයට විසඳුමක් ලෙස "**සෞභාග්‍යයේ දැක්ම**" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ***"නිරෝගීමත් සහ ඵලදායි පුරවැසියෙක් බිහිකිරිමට නම් රජය විසින් වස විසෙන් තොර ආහාර වේලක් සඳහා ජනතාවට ඇති අයිතිය සහතික කල යුතුය"*** යන්න ක්‍රියාවට නැංවිම හා දේශගුණ විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත සමාජ ආර්ථික රටාවක් බිහි කිරිම අරමුණු කරගෙන කාබනික පොහොර භාවිතයට ජනතාව දිරිමත් කිරිම රජය විසින් කටයුතු කරමින් ඇත.
මෙහිදි ජනතාව ලෙස අප, අවට පරිසරයෙන් පහසුවෙන් සපයා ගත හැකි සත්ත්ව සහ ශාක අමු ද්‍රව්‍ය එකතු කරගෙන අපගේ ගෙවත්තේ මෙන්ම වගාබිම තුළම උසස් ප්‍රමිතියෙන් යුත් කාබනික පොහොර අපටම නිෂ්පාදනය කර ගත හැකිය. පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරිම මඟින් පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වර්ධනය විම, බෝග වර්ධනයට අවශ්‍ය ප්‍රධාන පෝෂක මෙන්ම අංශු මාත්‍ර මුලද්‍රව්‍ය එක්විම, බුරුල් පසක් ඇති කිරිම මඟින් වාතාශ්‍රය දියුණු විම සහ මුල් වර්ධනය පහසු කරවිම, පසේ ජලය රදවා ගැනිමේ හැකියාව වැඩි විම හා ශාක පෝෂක රදවාගැනිමේ හැකියාව වැඩි විම සිදුවනු ඇත. මේ සඳහා භාවිත කල හැකි කාබනික පොහොර ලෙස

- කොළ පොහොර
- බෝග අවශේෂ
- ගොවිපොළ පොහොර
- කොම්පෝස්ට් පොහොර
- කාබනික දියර පොහොර .
- ජීව පොහොර, හඳුන්වා දිය හැකි ය.



මෙම කාබනික පොහොර අතරින් කාබනික දියර පොහොර සඳහා සුවිශේෂි ස්ථානයක් හිමිවන අතර නාගරික කෘෂිකර්මයේ නාගරික ගෙවතු වගාව සඳහා පහසුවෙන් සකසා ගැනිමේ හා භාවිත කිරිමේ අවස්ථාව මේ සඳහා ඇත. මෙහිදි,

- මාළු නිස්සාරක (ෆිෂ් ටොනික්)
- පළතුරු නිස්සාරක (ෆෲට් ටොනික්)
- ශාක සාර දියර පොහොර
- ජිවමෘත දියර පොහොර
- කොම්පෝස්ට් තේ
- කෙසෙල් ලෙලි දියර පොහොර

**මෙම කාබනික දියර පොහොර,**
- ✓ අඩු ඉඩකඩකින් සකසා ගැනිමට හැකිවිම
- ✓ අඩු කාලයකින් සකසා ගැනිමට හැකිවිම
- ✓ අඩු ශ්‍රමයකින් හා පහසුවෙන් සකසා ගැනිමට හැකිවිම
- ✓ අඩු වියදමකින් අවශ්‍යය ප්‍රමාණයට සකසා ගැනිමට හැකිවිම
- ✓ කෘමි විකර්ශකයක් ලෙස භාවිත කිරිමට හැකිවිම
- ✓ නිවසින් හා ගෙවත්තෙන් ඉවතලන අපද්‍රව්‍ය වලින් ප්‍රයෝජනයට ගැනිමට හැකිවිම,

**යනාදි වාසි ගෙන දෙන අතර මේ නිසා මෙම කාබනික දියර පොහොර සකසා ගැනිම හා භාවිත කිරිම පිළිබඳව අවබෝධයක් ලබා ගැනිම ඔබහට ප්‍රයෝජනවත් වනු ඇත.**

යන දියර පොහොර සුවිශේෂි වේ.



## මාළු ටොනික්.

**අවශ්‍ය ද්‍රව්‍ය:**

- ලේ සහිත මාළු (බලයා,කෙලවල්ලා) ඔලු 1 kgක්.
- දුඹුරු සීනි හෝ සක්කර 1Kg ක්.
- ක්ලෝරීන් රහිත ජලය 2L.
- සියල්ල දමා ගත හැකි, වැසිය හැකි ප්ලාස්ටික් භාජනයක්.



**සාදන ආකාරය :**

- කුඩාවට කපාගත් මාලු කැබලි භාජනයට දමා ගන්න.
- දුඹුරු සීනි/සක්කර 500g ක් වතුර 500ml ක හොඳින් දිය කර ගන්න.
- දියකරගත් ද්‍රාවණය මාලු කැබලි සහිත භාජනයට දමා කලවම් කර දින 7ක් හොඳින් වසා තබන්න.
- දින 7කට පසු නැවත දුඹුරු සීනි/සක්කර 500g ක් වතුර 1.5L ක හොඳින් දිය කර පෙර මිශ්‍රනයට එක් කර කලවම් කර තව දින 7ක් වසා තබන්න.
- ඉන්පසු මිශ්‍රනය පෙරා ඇසුරුම් කර තබන්න.
- සාර්ථකව මාලු ටොනික් සෑදී ඇත්නම් දිවුල් කිරි මෙන් සුවඳ වහනය වේ.

**ගබඩා කරන ආකාරය :**

- ✓ මේ සඳහා ප්ලාස්ටික් බෝතල් හෝ කෑන් සුදුසු වේ.
- ✓ ඇසුරුම් කිරීමේදී භාවිතා කරන භාජනයේ ¾ ක් පමණ පුරවා ¼ ප්‍රමානයක් හිස්ව තබා ගන්න.
- ✓ මූඩිය තද කිරීමේදී සම්පූර්ණයෙන් තද නොකර මදක් බුරුල්ව තැබිය යුතුයි.
- ✓ මෙය වියලි සිසිල් ස්ථානයක සූර්යාලෝකයට නිරාවරණය නොවන පරිදි ගබඩා කර තබන්න.
- ✓ මෙලෙස සකස්කොට තබාගන්නා ද්‍රාවනය වසර 1 ½ ක් පමණ කාලයක් තබාගත හැක.

**භාවිතා කරන ආකාරය :**

- මාලු ටොනික් කොටස් 1ක් ජලය කොටස් 200කට (1:200) මිශ්‍රකර උදේ හෝ සවස බෝග වලට හා පසට යෙදීම කල හැක.
- ගෙවතු වගාවේදී සතියකට දෙවතාවක් යෙදීමෙන් සරු ඵල ලැබිය හැක.
- මාලු ටොනික් භාවිතා කරනුයේ බෝග වැඩීම සඳහාය. ඵල දරන අවස්ථාව වන විට යෙදීම නතර කල යුතුයි.

## පළතුරු ටොනික් .

**අවශ්‍ය ද්‍රව්‍ය:**

- හොඳින් ඉදුනු ගස්ලබු 1Kg
- සීනි කෙසෙල් 1Kg
- වට්ටක්කා 1Kg.

(ඉදවීමට/ වගා කරන විට රසායන ද්‍රව්‍ය යොදා නොමැති ඒවා විය යුතුයි)

- දුඹුරු සීනි/ සක්කර 2Kgක්
- ක්ලෝරීන් රහිත ජලය 6L
- සියල්ල දමා ගත හැකි, වැසිය හැකි ප්ලාස්ටික් භාජනයක්.





**සාදන ආකාරය :**

- කුඩාවට කපාගත් පලතුරු සහ වට්ටක්කා කැබලි භාජනයට දමා ගන්න
- දුඹුරු සීනි/ සක්කර 1Kg ක් වතුර 1L ක හොඳින් දිය කර ගන්න
- දියකරගත් ද්‍රාවණය පලතුරු කැබලි සහිත බාල්දියට දමා කලවම් කර දින 7ක් හොඳින් වසා තබන්න
- දින 7කට පසු නැවත දුඹුරු සීනි/ සක්කර 1Kg ක් වතුර 5L ක හොඳින් දිය කර පෙර මිශ්‍රනයට එක් කර කලවම් කර තව දින 7ක් වසා තබන්න
- ඉන්පසු මිශ්‍රනය පෙරා ඇසුරුම් කර ගන්න
- සාර්ථකව පලතුරු ටොනික් සෑදී ඇත්නම් මිහිරි සුවඳක් වහනය වේ

**ගබඩා කරන ආකාරය :**

- ✓ මේ සඳහා ප්ලාස්ටික් බෝතල් හෝ කෑන් සුදුසු වේ.
- ✓ ඇසුරුම් කිරීමේදී භාවිතා කරන භාජනයේ ¾ ක් පමණ පුරවා ¼ ක ප්‍රමාණයක් හිස්ව තබා ගන්න.
- ✓ මූඩිය තද කිරීමේදී සම්පූර්ණයෙන් තද නොකර මදක් බුරුල්ව තැබිය යුතුයි.
- ✓ මෙය වියලි සිසිල් ස්ථානයක ගබඩා කර තබන්න.
- ✓ මෙලෙස සකස්කොට තබාගන්නා ද්‍රාවනය වසර 1 ½ පමණ කාලයක් තබාගත හැක.

**භාවිතා කරන ආකාරය :**

- පලතුරු ටොනික් කොටස් 1ක් ජලය කොටස් 200කට (1:200) මිශ්‍ර කර උදේ හෝ සවස බෝග වලට හා පසට යෙදීම කල හැක.
- ගෙවතු වගාවේදී සතියකට දෙවතාවක් යෙදීමෙන් සරු ඵල ලැබිය හැක.
- පලතුරු ටොනික් භාවිතා කරනුයේ බෝග වල මල් පිපී ඵල දරන අවස්ථාවේදීය.

## ශාක සාර දියර පොහොර



**අවශ්‍ය ද්‍රව්‍ය:**

- ග්ලිරිසීඩියා කොල 5kg
- බාලොලි හෝ කරඳ කොල 1kg
- මුරුංගා කොල 100g
- ජලය 20 L
- එළ හරක් ගොම 2 kg

.



**සාදන ආකාරය :**

- බැරලයකට මෙම ද්‍රව්‍ය සියල්ලම දමා ගන්න.
- දිනකට 4 වරක් විනාඩි 10ක් ලීයක් ආධාරයෙන් ද්‍රාවණය කලතන්න.
- දින 15ක් මෙලෙස කැලතීම සිදු කරන්න.
- පලමු දිනයේම බුබුලු දමමින් පැසීම සිදුවන අයුරු නිරීක්ෂණය කළ හැකිය.
- දින 15ක් කලතා අවසානයේ දින 6ක් කැලතීම නතර කර නොදිරූ ද්‍රව්‍ය මතුපිටට ඒමට ඉඩ සලස්වන්න.
- දින 21කට පසු ද්‍රාවණය පෙරා ගන්න.

**භාවිතා කරන ආකාරය :**

- මෙම ද්‍රාවණය කොටස් 1කට ජලය කොටස් 3ක් (1:3) දමා දින 7කට වරක් වැසි රහිත දිනවලදී සවස් වරුවේ බෝග වගාවන්ට යොදන්න.
- බෝග පැලෑටි වලට මෙහි අනුපාතය 1:8 ක් වේ.
- මෙම ද්‍රාවණය සති 2ක් පමන කල් තබා ගත හැක.



## ජිවමෘත දියරපොහොර.

**අවශ්‍ය ද්‍රව්‍ය:**

- ක්ලෝරීන් රහිත ජලය 10L
- එල හරක් ගොම 5Kg
- ගව මුත්‍රා 2L
- දුඹුරු සීනි /සක්කර / ඉදුනු වැල-වරකා එක් වර්ගයකින් 1Kg හෝ පොල් වතුර 2L ක්.
- දෙපිලි බීජ (උඳු , මුං ,කව්පි , කඩල) පිටි 1Kg හෝ ග්ලිරිසීඩියා කොල දින 2ක් මද පවනේ වියලා කුඩාවට ලියා ගත් 4Kgක්.
- කැලේකින් හෝ ගෙවත්තෙන් හෝ දිරාපත් වන කොල සහිත ස්ථානයකින් ලබාගත් පස් පිඩක්.



**සාදන ආකාරය :**

- බැරල් එකකට මෙම ද්‍රව්‍ය එකතු කර කරන්න
- දිනකට 5 වරක් විනාඩි 10 කාලයක් දකුනු අතට ලීයක ආධාරයෙන් කැලතීම කල යුතුයි
- බැරලය තෙත ගෝනියකින් වසා තබන්න
- එලෙස දින 3ක් කැලතීම කල යුතුයි
- ග්ලිරිසීඩියා කොල යොදාගන්නේ නම් දින 6ක් කැලතීම කල යුතුයි
- දින 5 හෝ 6 කින් ද්‍රාවණය පෙරා භාවිතා කල හැක

**භාවිතා කරන ආකාරය :**

- ද්‍රාවණය කොටස් 1කට ජලය කොටස් 3 (1:3) දමා දින 10කට වරක්,වැසි රහිත දිනක සවස් වරුවේ බෝග වගාවන්ට එක් කරන්න.
- මෙය දින 8ක් කල්තබා ගත හැක.

**(මෙම දියර පොහොර වර්ගය ඉන්දීය පරිසර ගොවි නියමු සුභාෂ් පලේකාර්ගේ වියදමක් නැති වගා ක්‍රමය යටතේ හඳුන්වා දෙන ලද ක්ෂුද්‍ර ජීවී ද්‍රාවනයකි.)**



# කොම්පෝස්ට් තේ දියර පොහොර


**අවශ්‍ය ද්‍රව්‍ය:**

- ප්ලාස්ටික් බඳුනක් හෝ බැරලයක් (100L).
- ගුණාත්මක තත්ත්වයෙන් ඉහල කොම්පෝස්ට් 12-15Kg.
- සක්කර හකුරු /උක් හකුරු දියර (මොලෑසස්) හෝ ඉවතලන පලතුරු 1Kg පමණ. (අන්නාසි, කෙසෙල්)
- ක්ලෝරීන් රහිත පිරිසිදු ජලය.
- කොම්පෝස්ට් බහා ලීමට රෙදි කවරයක්/ පරණ කොට්ට උරයක්/ ගෝනියක්.
- ලනු කැබැල්ලක් (1m දිග).
- ලී දන්ඩක්.

- ආවරණය කිරීමට දැලක් / රෙදි කැබැල්ලක් හෝ ගෝනියක්.

.






**සාදන ආකාරය :**

- ➢ කොම්පෝස්ට් හා ජලය ගත යුතු අනුපාතය පරිමාව අනුව 1:5 වේ
- ➢ කොම්පෝස්ට් මල්ලට දමා.මල්ල බැරලය තුල ජලයේ ගිල්වා ගැට ගැසූ කෙලවර දන්ඩේ මැදින් එල්ලා තබන්න
- ➢ සක්කර හකුරු /උක් හකුරු දියර (මොලෑසස්) හෝ ඉවතලන පලතුරු (අන්නාසි, කෙසෙල් ආදිය) ඒවාද බැරලයට එක් කරගන්න
- ➢ මෙම ඇටවුම සිසිල් සෙවන ස්ථානයක තබන්න
- ➢ මදුරුවන් බෝවීම සහ සතුන් එතුළට වැටීම වැලැක්වීමට පැරනි දැල් / රෙදි කැබැල්ලකින් වසා තබන්න
- ➢ දින 5-7කට පසු භාජනයේ ඇති කොම්පෝස්ට් දියරය පෙරා භාවිතය සඳහා ගත හැකි වේ
- ➢ ඉහල ගුණත්වයෙන් යුත් කොම්පෝස්ට් දියරය සෑදීමේදී විශේෂ අවශ්‍යතාව වන්නේ ස්වායු තත්වයෙන් පවත්වා ගැනීමයි
- ➢ වාතනය කිරීම සඳහා ඔක්සිජන් සැපයුමක් භාවිතා කිරීම , කුඩා බඳුනක් යොදාගෙන පෙන නගින සේ මිශ්‍ර කිරීම හෝ ලී දණ්ඩක ගැට ගසා උස් පහත් කිරීම මගින් වාතය හා හොඳින් කලවම් කිරීම

**භාවිතා කරන ආකාරය :**

- කොම්පෝස්ට් දියරය ජලය සමග 1:5 අනුපාතයට මිශ්‍ර කර සවස් වරුවේ බෝග වලට යෙදීම කල හැක.
- තවාන් සඳහා දින 7-10 වයසදී.
- වපුරා / පැල සිටුවා සති 2-4-6 යන කාල වලදී.
  වී වගාවේදී සහ එළවලු තවාන් වලදී දිලීර නාශක වෙනුවට බීජ ප්‍රතිකාරයක්ලෙස භාවිතා කල හැකිය.

- මෙහි ඇති පෝෂක නිසා මුල් ඇදීම හා වර්ධනය ඉක්මන් වේ.

- **කොම්පෝස්ට් දියරයේ ගුණාත්වය වැඩි කර ගැනීම :( කොල නිස්සාරකය)**
  - කොම්පෝස්ට් දියරය ඉසීමට දින 2කට පෙර ග්ලිරිසීඩියා , වල් සූරියකාන්ත , මකුන , කැප්පෙටියා වැනි ශාකවල කොල 3-5Kg ක් තලා පෙඟෙන්නට දමන්න.
  - එම පෙරා ගත් දියරය ද කොම්පෝස්ට් දියරය සමග මිශ්‍ර කර ඉසීම කල යුතුයි.
- කොම්පෝස්ට් දියර : කොල නිස්සාරකය : ජලය (2:1:5).
- තද හිරු රශ්මියට කොම්පෝස්ට් දියරයෙහි ගුණාත්මය විනාශ වීම අවම කිරීම සඳහා සවස් වරුවේ ක්ෂේත්‍රයට ඉසීම සිදු කල යුතුයි.

- **වී වගාවේ පඳුරු දමන හා පීදෙන අවස්තාවලදීත් , එළවලු වගාවේ පඳුරු දමන හා මල් පිපෙන අවස්ථාවලදීත් කොම්පෝස්ට් දියරය යෙදීමේදී මෙසේ පෝෂණ ගුණාත්වය වැඩි දියුණු කිරීම වැදගත් වේ.**

## කෙසෙල් ලෙලි දියර පොහොර

**අවශ්‍ය ද්‍රව්‍ය:**



- කෙසෙල් ලෙලි 15-20.
- වැසිය හැකි විනිවිද පෙනෙන බෝතලයක් හෝ බඳුනක්.
- ක්ලෝරීන් රහිත පිරිසිදු ජලය.



**සාදන ආකාරය**

- ඉවතලන කෙසෙල් ලෙලි කිහිපක් ගෙන කුඩාවට කපා ගන්න.(කෙසෙල් ලෙලි 15-20)
- විනිවිද පෙනෙන වැසිය හැකි බෝතලයකට මෙම කපා ගත් ලෙලි එක් කර ගන්න
- එයට ජලය 1L එක් කර ගන්න.
- හොදින් වසා ගෙන දින 7ක් වියලි සිසිල් ස්ථානයක තබන්න
- කෙසෙල් ලෙල්ලේ පෝෂක කොටස් බැක්ටීරියා ක්‍රියාකාරීත්වය නිසා ජලයට මුදා හැරීම සිදු වේ
- මෙම ද්‍රාවනයයේ පැහැය සුදුපාටට හුරු ලා කහ පැහැයක් විය යුතුයි

**භාවිතා කරන ආකාරය**

- ද්‍රාවනය පෙරා බෝග වල පත්‍ර සහ මුල මණ්ඩල කලාපයට ස්ප්‍රේ කර ගන්න
- ඉතිරි වන කෙසෙල් ලෙලි කැබලි බ්ලෙන්ඩර් එකක් ආධාරයෙන් අඹරා මිශ්‍රනය සමග ස්ප්‍රේ කර ගැනීමට හෝ නැතිනම් බෝග වල මූල මණ්ඩල කලාපයට එක් කරගන්න
- කෙසෙල් ලෙල්ලේ N, P, විශේෂයෙන් K සහ Ca වැනි බෝග වලට අවශ්‍ය පෝෂක යහමින් පවතී
- මෙම කාබනික දියර පොහොරය සතුව කෘමිනාශක ගුණයක් ද පවතී
- **මෙම කාබනික දියර පොහොර එක් කිරීම මගින් බෝග වර්ධනය වී දලු ලා මල් පිපීම වේගවත් වී හොද අස්වැන්නක් ලබා ගැනීමට උපකාරි වේ.**

## මූලාශ්‍ර.


- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2021, කාබනික පොහොර අත් පොත.
- Hii Trees, 2020, අපගේ වගාවන් සඳහා කාබනික පොහොර, Facebook, viewed 12 July 2021. *https://www.facebook.com/hiitreesteam/posts/1868053066658098*

# සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේදී මැදිහත්කරු හා ඔහුගේ කාර්යභාරය.

*ඩබ්.ඒ.ඩී මංගලා චිත්‍රානි*

ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේදී සමාජ සංවර්ධනය විෂය ප්‍රධාන ධාරාවන් දෙකක් කෙරෙහි අවධානය යොමු වේ. එනම්

1.පොදුවේ සමාජ කණ්ඩායම් සංවර්ධනය කරා මෙහෙයවනු ලබන සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය.

2. විවිධාකාර සමාජමය හා පුද්ගලික අවහිරතාවන් නිසා අගතියට පත් වූ පුද්ගලයන් හට ක්ෂය වී ගිය ශක්තිය ලබා ගැනීමට සහාය වෙමින් ඔවුන් සක්‍රීය සමාජ ක්‍රියාකාරකයින් බවට පත්කරවන සමාජ වැඩ ක්ෂේත්‍රය.

මෙම ක්ෂේත්‍ර දෙකෙහිදීම ප්‍රධාන වගකීම පැවරෙන්නේ එම ක්‍රියාවලියට මැදිහත්වන මැදිහත්කරු වෙතය. ඉහත දැක්වූ සංවර්ධන ක්‍රියාවලීන් දෙකෙහිදීම අදාල ඉලක්ක කණ්ඩායම හට ස්වයං සංවර්ධනය සඳහා ඇති ශක්තිය හීන වී ඇති නිසා ඔවුන් ගොදුරු වී සිටින අක්‍රීය උදාසීන ස්වභාවයෙන් මුදවා ගෙන සක්‍රීය බවට හැරවීමේ ප්‍රධාන බලවේගය වන්නේ මැදිහත්කරුය. එම නිසා මැදිහත්කරුගේ කාර්ය භාරය හා එම කාර්ය භාරය ඵලදායී අන්දමින් ඉටු කිරීම සඳහා ඔහු වෙත පැවතිය යුතු ආකල්ප, කුසලතා හා දැනුම් සම්භාරය පිළිබඳව අවධානය යොමු කිරීම ඉතාම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්ෂේත්‍රය තුළ මැදිහත්කරුගේ භූමිකාව හැදින්වීම සඳහා රැකියා නාම කිපයක්ම භාවිතා වේ. සජීවීකාරක, විපර්යකාරක, පහසුකාරක, සමාජ නියාමක ආදීය ඉන් කීපයකි. මෙම අර්ථ නිරූපනයට අනුව සමාජ වැඩ මැදිහත්කරුගේ වෘත්තීය භූමිකාව වන්නේ දැනට විවිධ සමාජමය හා පෞද්ගලික හේතූන් නිසා අක්‍රියව පවතින පුද්ගල විභවතාවන් සක්‍රීය කරමින් අදාල ඉලක්ක ගත පුද්ගලයන්ට හෝ ප්‍රජා කණ්ඩායම්වලට තම හීන වී ගිය ශක්තිය උපදවා ගනිමින් සක්‍රිය හා ඵලදායී චරිත බවට පත්වීමට අවශ්‍ය ශක්තිය ලබා දීමයි.

මෙම කාර්ය භාරය ඉටු කිරීම සඳහා මැදිහත්කරුට සමාජ හිතවාදී ආකල්ප හා දැනුම මෙන්ම සාර්ථක මැදිහත්වීමේ කුසලතාවන්ද තිබිය යුතුය. මෙහිදී වඩාත් වැදගත් වන්නේ ද මැදිහත්කරුගේ ආකල්පයයි. පුද්ගල චර්යාව කෙරෙහි බලපාන අභ්‍යන්තර සාධක ඇසුරින් වැඩිම බලපෑම ඇති කරන්නේ ආකල්ප විසින් බව මනෝ විද්‍යාත්මක දැනුම මගින් තහවුරු කොට ඇත. පුද්ගලයෙකු කිසියම් දිශාවකට හෝ ක්‍රියාවකට යොමු වීම තීරණය වන්නේ ඒ කෙරෙහි දක්වන කැමැත්ත, රුචිය හා ආකල්ප මතය. සමාජ වැඩ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වීමට බලාපොරොත්තු වන මැදිහත්කරුවෙකු පහත සඳහන් සමාජ සංකල්ප කෙරෙහි සුබවාදී ආකල්ප වලින් බැලිය හැකි විය යුතුය.

- මිනිසුන්ගේ හැකියාවන් හා ශක්තීන් පිළිබඳ සංකල්පය.

සෑම පුද්ගලයෙකු තුළම කිසියම් හැකියාවක් හා ශක්තියක් ගැබ්ව ඇත. මෙම ශක්තිය හා හැකියාව එක් එක් පුද්ගලයා තුළින් විවිධ අවස්ථා වල විවිධ ආකාරයට පිබිදෙන්නේ හා ප්‍රදර්ශනය වන්නේ ඔහු මුහුණ දෙන සමාජ පරිසරයට අනුවය. විවිධ සමාජ ආර්ථික හේතූන් නිසා සමාජයේ නිසි තැන නොලබා සිටින

පුද්ගලයන්ට හා කණ්ඩායම් වලට පහසුකාරිත්වය සැපයීමට යන මැදිහත්කරු මෙම ප්‍රකාශයන් සත්‍යයක් ලෙස පිළිගෙන ඒ වෙනුවෙන් කැපවීමට කැමති පුද්ගලයෙකු විය යුතුය.

➢ පුද්ගලයෙකු හා සමාජය සතු වගකීම පිළිබඳ සංකල්පය.

සමාජය යනු පුද්ගල සමූහයේ එකතුවකි. පුද්ගලයෙකුගේ පැවැත්ම සඳහා ආහාර, ආරක්ෂාව, අධ්‍යාපනය හා ආදරය ආදී සියල්ල ලැබෙන්නේ සමාජය තුළිනි. ඒ අනුව සමාජය හා පුද්ගලයා තම යුතුකම් අන්‍යෝන්‍යව ඉටුකල යුතුය යන සංකල්පය මැදිහත්කරු විසින් ධනාත්මකව පිළිගත යුතුය.

➢ සියළු දෙනාටම සමාන අවස්ථාවක් තිබිය යුතු බව.

අප ජීවත් වන සමාජය විෂමතාවන්ගෙන් පිරී පවතී. එම විෂමතාවන් නිර්මාණය වීමට ස්වභාවික භෞතික හේතුන් මෙන්ම මිනිසා විසින්ම නිර්මාණය කරන ලද සමාජමය හේතුන් ද බලපා ඇත. ආර්ථික හා සාමාජික කරුණු මත පුද්ගලයන් හට ලැබිය යුතු අවස්ථාවන් නොලැබී යාම මෙන්ම ඒවා ලබා ගැනීමට අවශ්‍ය පෞරුෂමය සාධක නිසා නොලැබී යන අවස්ථා ද ඇත. ඒ අනුව මැදිහත්කරුගේ භූමිකාව අනුව සමාජයේ සියළුම දෙනාට සමාන අවස්ථාවන් තිබිය යුතුය යන ආකල්පය ඔහු හෝ ඇය විසින් හදවතින්ම පිළිගත යුතුය.

➢ සමාජ සම්පත් පොදුවේ හා සමසේ පරිහරණය කිරීම.

දේශපාලන, ආර්ථික, සාමාජික, භූගෝලීය හා පෞරුෂ සාධක නිසා සමාජයේ ඇති හැකි අය සම්පත් වැඩි වශයෙන් භාවිතා කරන අතර, නැති බැරි දුබලයන් හට ලැබෙන්නේ අවම සම්පත් ප්‍රමාණයකි. එහෙත් ස්වභාවයෙන්ම සමාජය සතු වන සම්පත් සමසේ සමාජයේ විවිධ කණ්ඩායම් අතරේ බෙදී යා යුතුය යන සංකල්පය සමාජ මැදිහත්කරු විසින් පිළිගත යුතුය. ඒ අනුව වඩා හොඳ හා සාධාරණ සමාජ වෙනසක් සඳහා ක්‍රියාත්මක විය යුතුය.

මැදිහත්කරුහට ඉහත සඳහන් කළ කාර්ය ඉටු කිරීමට යාමේදී ඔහු සතු විය යුතු ගුණාංග කීපයක් ද ඇත.

1. රහස්‍යභාවය ආරක්ෂා කිරීම.

   විශේෂයෙන්ම සමාජ වැඩ ක්ෂේත්‍රයේදී සේවාලාභීන්ගේ පුද්ගලික කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුවන අතර, ඒවායේ පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය රැකීමට සමාජ වැඩකරුට හැකි විය යුතුය.

2. කැපවීම.

   මෙයින් අදහස් වන්නේ සාමාන්‍යයෙන් රැකියාවට අදාල සීමාවන් ඉක්මවා යමින් තම සේවාවන් ඉටු කිරීමට ඇති මානසික පෙළඹවීමයි. විශේෂයෙන් ව්‍යාපෘති කටයුතු සඳහා හෝ පුද්ගල සංවර්ධනය සඳහා කටයුතු කිරීමේදී වෙනත් රැකියාවල මෙන් පැය අටේ සේවයට හෝ ලේඛණමය අවශ්‍යතා වලින් පූර්ණ ප්‍රතිඵල නෙලිය නොහැකිය. එවැනි අවස්ථාවලදී කාලය, ශ්‍රමය හා තම කුසලතාවන් කොන්දේසි විරහිතව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් මුදා හැරීමට හැකි විය යුතුය.

3.වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීම.

තම වෘත්තීය ඉටු කිරීමේදී ජාති, ආගම්, පන්ති, කුල ආදී සමාජ බෙදීම් වලට පක්ෂපාත නොවී තම සේවය ලබා ගැනීමට පැමිණෙන සියළු දෙනාම සමානව තම සේවාව සැපයීමට තරම් ආත්ම ගරුක විය යුතුය.

4.අව්‍යාජත්වය හා මධ්‍යස්ථ බව ආරක්ෂා කිරීම.

මෙය සමාජ වැඩකරුවෙකුගේ වටිනාකම වර්ධනය කරන ගුණාංගයකි. ව්‍යාජ පුද්ගලයෙකුට හෝ මධ්‍යස්ථභාවය රැකීමට අසමත් පුද්ගලයෙකු හට ඉහත සඳහන් කළ ආකාරයෙන් වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීමට අවශ්‍ය මානසික ශක්තිය ලැබෙන්නේ නැත

5. සාර්ථක සවන් දෙන්නෙකු වීම.

සාමාන්‍යයෙන් මනුස්ස චරිතය නිර්මාණය වී ඇත්තේ සවන් දීමට නොව තම මතය ඉක්මනින් ඉදිරිපත් කිරීමේ ප්‍රවනතාවය සඳහාය. සාර්ථක මැදිහත්කරුවෙකු වීමට නම් ඉතා අසීරු වූ සවන් දීමේ හැකියාව පුරුදු පුහුණු කර ගත යුතය. මෙහිදී සවන් දීම යනු හුදෙක් අසා සිටීම නොව කතා කරන පුද්ගලයාගේ වචන හා චර්යාව තුළින් ඔහුගේ අදහස් හා හැගීම් හා මතයන් අවබෝධ කර ගැනීමයි.

6. ඉවසීමෙන් හා සහකම්පාවෙන් යුතුව සබඳතාව පවත්වා ගෙන යාම.

සහකම්පාව යනු හුදු අනුකම්පාව නොව ගැටළුවට මුහුණ දෙන පුද්ගලයාගේ ඇසින් ගැටළුව දැකීමට හා විශ්ලේෂණය කිරීමට හැකිවීමය.

# කොරෝනා වසංගතය හමුවේ ළමා පරපුරේ අනාගතය.

*ඩබ්ලිව්.ආර්.එන්.පී. විජේවර්ධන*

කුඩා පැල්පතක උපන්නද, සුවිසල් මන්දිරයක උපන්න ද, වීදියක උපන්නද ළමයා යන වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ගත්කළ මානව සමාජයේ බිහිවන අනගිතම, වටිනාම වස්තුවකි. මානව ස්වභාව දහමින් බිහිවන මෙම මිනිස් පැටවා නොහොත් දරුවා කාලයක් තිස්සේ ආදරය, සෙනෙහස, පෝෂණය, මෙන්ම රැකවරණය සලසමින් උස් මහත් කළ යුතුය. මෙම ක්‍රියාදාමයේදී මුලු මහත් සමාජයටම වගකීම පැවරෙන අතර කිසිදු පාර්ශවයකට එයින් මඟහැර යාමට නොහැකිය. අද දවසේ උපදින කුඩා බිළිඳා මතු දවසක තම රටටත්, ලෝකයටත් කීර්තියක් ගෙන දෙන මිණි පහනක් විය හැකිය. කුමන සමාජ ස්ථරයක, භූගෝලීය වශයෙන් කුමන ප්‍රදේශයක ඉපදුනද, යම් දිනෙක රට කරවන නායකයෙකු, පරිපාලකයෙකු වුවද විය හැකිය. අනිවාර්යයෙන්ම අනාගත ලෝකය නිර්මාණය වන්නේ, අනාගත ලෝකය පාලනය කරන්නේ අද ඉපදෙන බිළිඳාය. එනිසා මේ රටේ අනාගතය රඳා පවතින්නේ දරුවන් අතය. අද දරුවන්ගේ පෞරුෂය, අද දරුවන්ගේ අධ්‍යාපනය, අද දරුවන්ගේ මානසික තත්වය ආදී මෙකී නොකී සියලු දෙය හෙට දින ලොව එළිය කිරීමට උරමත වැටෙන වගකීම දරන්නට අද දරුවන්ගේ ඉහත සාධකයන් නොඅඩුව බලපානු ඇත.

ළමයා යනු කවරෙක්ද ? යන්න විමසා බැලීම මෙහිදී වැදගත් වේ. එක් ආකාරයකින් දක්වන්නේ නම් ළමයා යනු ළපටි පැලැටියකි. එසේත් නැතිනම් මැටි ගුලියකි. අද ළපටි පැලැටිය හෙට දින රුස්ස ගසක් බවට පත් වීමටත්, අද මැටි ගුලියෙන් හෙට දින අලංකාර නිර්මාණයක් බිහිවීමටත් විවිධ බාහිර හේතු සාධක බලපායි. පැළයේ නිසි වර්ධනයට ජලය, පොහොර, හිරු එළිය, ආදී සියලු බාහිර සාධක එකතුවීමෙන් එල දරන රුක්ෂයක් සැදෙයි. එසේම මැටි ගුලියට ජලය, සකපෝරුවක්, නිර්මාණකරුවෙකුත් එක් වීමෙන් අලංකාර භාණ්ඩයක් නිමාවට පත්වේ. මේ ඉහත සිද්ධීන්ට මෙන්ම ළමයෙකුටද කුඩා කළ සිටම හොඳ පුරවැසියෙකු වන්නට, අඩි තාලම වැටෙන්නේ ඔහුට හෝ ඇයට ලැබෙන බාහිර සාධක පදනම් කර ගෙනයි. එසේනම් දරුවෙකුට අවශ්‍ය බාහිර සාධක මොනවාද? විශේෂයෙන්ම පෝෂණය, ආදරය, ආරක්ෂාව හා රැකවරණය, අධ්‍යාපනය දරුවෙකුට අවශ්‍ය බාහිර සාධක වේ. මැටි ගුලියකට අවශ්‍ය සාධක නොලැබුනහොත් මැටි ගුලිය ගල් බවට පත් වන්නේ යම් සේද ? පැළෑටියට අවශ්‍ය සාධක නොලැබී පැළය කනාටු වන්නේ යම්සේද ? මිනිස් පැටවාටද (ළදරුවෙකුට) අවශ්‍ය බාහිර සාධක නොමැති වුවහොත් ඔහු හෝ ඇය අකර්මන්‍ය වේ. එය මුලු මහත් සමාජයටම, රටටම මෙන් මුලු මහත් අනාගතයටම බලපාන තීරණාත්මක තත්වයකි.

ළමයෙකු යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකු ලෙස එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල යුනිසෙෆ් ආයතනය විසින් අර්ථ දක්වා ඇත.

2019 වර්ෂයේ අග භාගයේදී චීනයේ වුහාන් නගරයේ ආරම්භ වූ කොරෝනා හෙවත් කොවිඩ් 19 රෝගය ලෝක වසංගතයක් ලෙස ලොව පුරා ඉතා වේගයෙන් ව්‍යාප්ත විය. කෝටි ගණනක ආසාධිතයින් හා ලක්ෂ සංඛ්‍යාත ජීවිත අහිමි වීම් තුළ ලෝකයේ සියලුම රටවල දරුණු ආර්ථික, මානසික අධ්‍යාපනය ආදී ගැටලු රැසක්

අත්කර දෙන්නට විය. තවමත් ලෝකයේ රටවල්වලින් පහව ගොස් නොමැති මෙම දරුණු වසංගතය මල් කැකුළුවන් දරුවන්ගේද ජීවිත අහිමි කරන ලදී. ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වසර දෙකක් තිස්සේ ඇණ හිට තිබේ. පවුල් වල ආර්ථිකය දරුණු ලෙස සෝදාපාලුවට ලක්වීමේ ප්‍රතිඵලය දරුවන්ටද අත් විඳින්නට විය. එය කිහිප ආකාරයකින් සිදු විය.

- දෙමාපියන්ගේ රැකියා අහිමි වීම / ජීවන මාර්ග අඩපන වීම තුළ දරුවන් රැකියා සොයා යාම, ඒ මගින් ළමා ශ්‍රමිකයින් බිහිවීම.
- පාසල් අධ්‍යාපනය ඇණ හිටීම නිසා දරුවන් අධ්‍යාපනයෙන් ඈත්වීම / පාසල් හැරයාම.
- පාසල් නොයාම තුළ මිතුරු කණ්ඩායම් අහිමි වීම. මේ නිසා දරුවන් ප්‍රචණ්ඩත්වයට පත්වීම.
- ළමා හිංසනයට ගෙදර තුළදීම ලක්වීම.

අවුරුදු 20කට පමණ පසුව ලෝකයේම නැවතත් ළමා ශ්‍රම සූරා කෑම ඉහළ යමින් පවතී. යුනිසෙෆ් සංවිධානය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය නිකුත් කර ඇති ඒකාබද්ධ ප්‍රකාශයට අනුව ශ්‍රම සූරා කෑමට දරුවන් මිලියන 160ක් පමණ ගොදුරු වී ඇත. පසුගිය වසරක කාලය තුළ තවත් ළමුන් මිලියන 8.4කට රැකියාවන්හි නිරතවීමට සිදු වූ අතර දසලක්ෂ සංඛ්‍යාත ළමා පරපුරක් කොවිඩ් වසංගතයේ ප්‍රතිවිපාකයක් වශයෙන් අනතුරට ලක් වී තිබේ.

කම්කරු හා යුනිසෙෆ් සංවිධානයේ ප්‍රකාශනයට අනුව වයස අවුරුදු 5ත් 11ත් අතර වැඩ කරන දරුවන්ගේ සංඛ්‍යාව සුවිශේෂී ඉහළ යාමක් දක්නට ලැබේ. වසය අවු. 5ත් 14ත් ළමුන් අන්තරායකාරී වෘත්තීන්හි නිරත කරවනු ලැබ ඇත. උදා:- ඝානාවේ දරුවෙකු වන ජේකොබ් ළමා ශ්‍රමිකයෙකි. ඔහු කොරෝනා වසංගතයෙන් දෙමාපියන්ගේ රැකියා අහිමි වීම නිසා පවුලේ ආර්ථිකයට සවියක් වීම සඳහා රැකියාවක් සොයා ගිය ළමා ශ්‍රමිකයෙකි. " මම වැඩට යද්දී මගේ පංතියේ පරණ යාළුවෝ ඉස්කෝලේ යනවා දකිනකොට මට ලොකු කණගාටුවක් දැනෙනවා " - ජේකොබ්.

ඔහුගේ ප්‍රකාශය තුළ ඇත්තේ කුමක්ද කොරෝනා වසංගතයත් සමග ජේකොබ් වැනි අය තව කොපමණ සිටීද ?

ළමයෙකුගේ ශ්‍රමය කොල්ලකෑම එම ළමයාගේ ජීවිතයට බලපායි. එසේම එය අනාගත පරම්පරාවටද බලපායි. ළමුන් පාසල් යා යුතුයි. එය ළමයෙකුගේ අයිතියක්. නමුත් මේ නිසා දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා අහිමි විය. එමගින් සිදු වන්නේ දුගී භාවයේ විෂම චක්‍රය නොනවත්වා පැවැත්මට අවශ්‍ය පරිසරය සකස් කිරීමකි. ගැහැණු දරුවන්ට වඩා පිරිමි ළමුන් ළමා ශ්‍රමිකයින් ලෙස යොදා ගනු ලැබුවද ගෙදර දොරේ වැඩවලට දිනකට පැය කීයක් සම්බන්ධ කර ගන්නවාද? ළමා ශ්‍රමය සූරා කෑම එම ළමුන්ගේ හැඟීම් වර්ධනය සහ යහපැවැත්ම කෙරෙහි සෘජුවම බලපායි. එසේම ඔවුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍යට ඉතා අහිතකර ලෙස බලපානු ලබයි. මෙහි බලපෑම නිසාම 2002 වර්ෂයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයක් ලෙස වෙනම දිනයක් ප්‍රකාශයට පත් කරන ලදී. ජූනි මස 12 දිනයක් ලෙස වෙන් කළද මේ පිළිබඳව නිරන්තරව අවධානය යොමු කළ යුතුය.

ලොව පුරා බිලියන 2.2ක් සිටින ජනගහනයෙන් බිලියන 2කට ආසන්න ප්‍රමාණයක් ජීවත් වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවලය. ශ්‍රී ලංකාවද මින් එක් රටකි. කොවිඩ් 19 වසංගතය ලෝකයේ සෙසු රටවලට මෙන්ම ශ්‍රී ලංකාවේ ළමා පරපුර කෙරෙහි කෙසේ බලපායිද ?

ලංකාව තුළ කොවිඩ් වසංගතය හමුවේ ළමා පරපුර මුහුණ දෙන මානසික, සාමාජීය හා අධ්‍යාපනික තත්වයන් විශාල වශයෙන් වෙනස් මානයන් දක්වා ගමන් කර ඇත. ලෝකයේ ඕනෑම වසංගතයකදී වැඩි වශයෙන්ම එයින් පීඩාවට පත්වන්නේ ළමුන්ය. දෙමාපියන්ගේ ආර්ථික මාර්ග අඩාල වීම නිසා පවුලේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටීම. ඒ නිසා ආහාර පාන සපයා ගැනීම අසීරු වීම තුළ දරුවන් නිරාහාරව කුසගින්නේ සිටීමට සිදුවිය. ඒ නිසාම ළමා මන්ද පෝෂණය ඉහළ යාම වේගවත් වී ඇත. ළමා මන්දපෝෂණය ඔහුගේ / ඇයගේ කායික මෙන්ම මානසික වර්ධනයට සෘජුවම සම්බන්ධ වේ. මේ නිසා දරුවන් කායිකව දුර්වල වීම, මානසික දුර්වල වීම, එකී සාධක පෞරුෂ වර්ධනයට බලපෑම හා දරු පරපුර රෝගී භාවයට පත්වීම, ඔවුන්ගේ බුද්ධියේ වර්ධනය හීනවීම මුළු අනාගතයටම බලපානු ඇත.

දෙමාපියන්ට පවුලේ ආර්ථිකය දරාගත නොහැකි වීම නිසා දරුවන් ශ්‍රමිකයින් බවට පත් කිරීම මෙමෙහෙකාර සේවයට යෙදවීම. මේ නිසා දරුවන්ට ආරක්ෂාව හා රැකවරණය අහිමි වීම. ජීවිතයෙන් පවා වන්දි ගෙවීමට සිදු වූ අවස්ථා පසුගිය දා මාධ්‍යයෙන් පවා අසන්නට ලැබුණි. දුප්පත්කම නිසා ශාරීරික දුර්වලතා ඇති දරුවන් විශාල වශයෙන් අසරණ භාවයට ලක්වීම, අවතැන් වීම සීග්‍රයෙන් වැඩි විය. ගම්බද අඩු ආදායම්ලාභී පවුල්වල අඬදබර හේතුවෙන් දරුවන් විශාල මානසික පීඩනයකට ලක්වේ. ඔවුන් නිවස තුළදී ගෘහස්ථ හිංසනයට ලක් වී ඇත.

ශ්‍රී ලංකාව තුළ මිලියන 4ක පමණ දරුවන් කොවිඩ් 19 නිසා පාසල් නොයයි. වසර දෙකක් තිස්සේ අධ්‍යාපනයෙන් ඈත් වී ඇත. ඔවුන්ගෙන් වැඩිදෙනා ජාලගත (Online) අධ්‍යාපනයට නැඹුරුව ඇතත් Online අන්තර්ජාල වැඩසටහන් නිසා ළමා අපචාර හා ළමා හිංසනයන් විශාල වශයෙන් වැඩි වී ඇත. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (Online) ආයතනය පවසන පරිදි පසුගිය මාර්තු 19 සිට අප්‍රේල් 07 දක්වා ශ්‍රී ලංකා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබුණු ළමා අපයෝජන පැමිණිලි 292ක් බවත් එයින් 121ක්ම ඉතා දරුණු වද හිංසනවලට ලක්ව ඇති බවත්ය.

අනෙක් අතට ශ්‍රී ලංකාවේ ළමුන්ගෙන් 66% කට අන්තර්ජාල පහසුකම් නොමැත. අන්තර්ජාල පහසුකම් සොයා සිය දිවි පරදුවට තබා ගල් උඩට නැගීම්, ගස් උඩ අට්ටාල හදා ගැහැණු / පිරිමි දරුවන් දෙපාර්ශවයම රෑ දවල් නොබලා වෙහෙස වූ ආකාරය කාගේත් නෙත් වලට හසුවිය. පාසල තුළින් අධ්‍යාපනය පමණක් නොව යහළු මිත්‍රාදීන්ගේ ඇසුර, ගුරුවරුන් ශිෂ්‍යන් අතර සබඳතා පවා දුරස් විය. මිතුරු කණ්ඩායමේ දුරස් වීම නිසා මානසික ව්‍යාකූල තත්වයට දරුවන් ලක් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස දරුවන් පාසල් හැරයාම, කායික අපයෝජනයට ලක් වීම, මෙමෙහෙකාර සේවයට යාම සිදුවිය.

ඉහත කරුණු විමසා බැලීමේදී පැහැදිලි වන්නේ අනාගතයේදී පෞරුෂ දුර්වල වීම, දරා ගැනීමේ හැකියාව අඩු පරපුරක් බිහි වීමට ඉඩකඩ වැඩි බවය. ඒ සඳහා පවුලේ දුප්පත්කම, ආරක්ෂිත රැකවරණයක් නොලැබීම, ලිංගික හිංසාවන්ට හා අපයෝජනයට ලක්වීම, බැන වැදීම්, පහරදීම්, හෙලා දැකීම් හේතු වී ඇත.

මේ තත්වය රටේ ඉදිරි අනාගතයට ඉතාමත් අහිතකර ලෙස බලපායි. මේ සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

තවද, අනාගතය භාර ගැනීමට සිටින දැයේ දූවා දරුවන්ගේ ලෝකය ඔප්නැංවීම හා ඔවුන්ගේ කුසලතාවයන් වර්ධනය කරමින් කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම සඳහාත් රටපුරා " කැකුළු ළමා සමාජය " නමින් ළමා සංවිධාන දස දහසකට වඩා සමෘද්ධි වැඩසටහන හරහා පිහිටුවා තිබුණි. ඒවාට යළි පණ දීමෙන් යම් ප්‍රමාණයක දායකත්වයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි විශ්වාස කරමි. එපමණක්

නොව මේ සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන, සියළු අංශයන් ඒකාබද්ධව පුළුල් වැඩපිළිවෙලක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවයකි. එසේ නොවුනහොත් රටේ ජීවනාලිය බඳු දරු පරපුර විනාශ වනු ඇත. මෙයින් මුදවා ගැනීමට සහය දීම සෑම පුරවැසියෙකුගේම වගකීම වේ. “ හොඳම දේ දරුවන්ටයි ” යන ලෙනින්ගේ කියමන යථාර්තයක් වන්නේ එවිටයි.

# දිළිඳුකම හඳුනා ගැනීමේ විකල්පීය ප්‍රවේශයක් ලෙස මානව හැකියා ප්‍රවේශය පිළිබඳ හැඳින්වීමක්.

ඊ.එම්.ඩබ්.ඩබ්.එන්. එස්.බී. ඒකනායක

දරිද්‍රතාවය බහු මුහුණුවරකින් යුත් සංකීර්ණ හා ගතික සමාජ ප්‍රශ්නයකි. එය පුද්ගලයකුගේ ආදායම හෝ පරිභෝජන වියදම ඇතුළත් මූල්‍යමය ප්‍රවේශයකින් පමණක් අවබෝධ කර ගත නොහැකිය (htt://en:Wikipedia.org/wiki/poverty). එබැවින් මේ සඳහා මූල්‍ය නොවන වෙනත් විකල්පීය ප්‍රවේශයන් පිළිබඳව අවධානය යොමු වී තිබේ. ඒ අතර මානව හැකියා ප්‍රවේශය සඳහා විශේෂ වැදගත්කමක් ලැබී ඇත.

දරිද්‍රතාවය යනු ආදායම් සාධකය (ආදායම් හා පරිභෝජන වියදම) හෝ වෙනත් මූල්‍යමය සාධක මත ම හුදෙක් තීරණය වන දෙයක් නොවේ. එය මානව හැකියාවන්හි විහීනතාවය නැතහොත් පුද්ගලයකුට යහපත් ජීවන මට්ටමකින් යුතු වටිනාකමක් සහිත ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය හැකියා නොමැතිකම/ අහිමි වීම හේතුවෙන් තීරණයවන දෙයක් ලෙස නොබෙල් ත්‍යාගලාභී ආචාර්ය අමර්ත්‍ය සෙන් මානව හැකියා/ශක්‍යතා ප්‍රවේශය තුළින් පෙන්වා දී තිබේ. මෙම ප්‍රවේශයට අනුව දරිද්‍රතාවය යනු පුද්ගලයකුට ආත්ම අභිමානයෙන් සහිත යහපත් ජීවන මට්ටමකින් යුතු ජීවිතයක් පවත්වාගෙන යෑමට අවශ්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට පුද්ගල හැකියාවන්/ශක්‍යතා නොමැතිකම හේතුවෙන් තීරණයවන තත්තවයක් ලෙස විග්‍රහ වේ.

පුද්ගලයෙකුගේ ජීවන මට්ටම තීරණය වනුයේ එම මානව හැකියාව මත බව මෙයින් අවධාරණය කර තිබෙන අතර, හැකියා යනු මානව යහ පැවැත්මට අත්‍යවශ්‍ය දෙයකි. එම හැකියාවන් ලෙස අමර්ත්‍ය සෙන් දක්වනුයේ ප්‍රමාණවත් පරිදි පෝෂණය ලබා ගැනීමට ඇති හැකියාව, මනා සෞඛ්‍ය තත්ත්වයක් පවත්වා ගැනීමට ඇති හැකියාව, අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ හැකියාව, අවශ්‍යතාවලට සරිලන නිවහනක් ලබා ගැනීමේ හැකියාව, පුද්ගල ආත්මාභිමානය, ආත්ම ගරුත්වය හා අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට ඇති හැකියාව සහ සමාජ ජීවිතයේදී සක්‍රීය සහභාගීත්වය තුළින් තීරණ ගැනීමේ හැකියාව යන හැකියාවන් සමූහයකට ය. මෙම හැකියා එකිනෙකට සම්බන්ධ ක්‍රියාවලියකින් යුක්තය. මෙවැනි මානව හැකියාවන් යහපත් ජීවන මට්ටමක් පවත්වා ගෙන යෑම සඳහා පුද්ගලයකුට අත්‍යවශ්‍ය වේ. මෙය පුද්ගලයකුට හිමිවන ආදායම මගින් තීරණය වන තත්වයකට වඩා වැඩි දෙයකි. අඩු ආදායම්ලාභී පුද්ගලයෙකුගේ ජීවන මට්ටම තීරණය වීම සඳහා තවත් බොහෝ සාධක බලපානු ලබන අතර ආදායම යනු ඉන් එක් සාධකයක් පමණක් වන බව අමර්ත්‍ය සෙන් මෙහිදී පෙන්වා දී තිබේ (*Sen A.K,1985)*

පුද්ගලයකුගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පවතින හැකියාව ආදායම මත පමණක් තීරණය නොවන බව නිදසුන් මගින් පැහැදිලි කළ හැකිය. සෞඛ්‍ය සේවාවල අසමාන ව්‍යාප්තිය අනුව දුෂ්කර සහ අඩු සංවර්ධිත ප්‍රදේශවල ජීවත්වන අයකුට ගුණාත්මක හා ඉහළ ප්‍රමිතියකින් යුත් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට අපහසුතා ඇති වී තිබ. ඒ අනුව සමාන ආදායම් ලබන පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු සෞඛ්‍ය පහසුකම් හොඳින් පවතින ප්‍රදේශයක ද අනෙක් පුද්ගලයා සෞඛ්‍ය පහසුකම් වලින් දුර්වල දුෂ්කර ප්‍රදේශයක ජීවත් වන්නේ නම් ඒ අය හට

සෞඛ්‍ය සේවා ලබාගැනීම සඳහා වන හැකියාවන් වෙනස් වේ. ඒ අනුව පුද්ගලයෙකුගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාවන් ආදායම සමාන වුවත් සමාන නොවන බව පැහැදිලිය. ඒ සඳහා වන අවශ්‍යතා සපුරා ගැනීමට මිනිසාට සමාන හැකියා තිබිය යුතුය. එසේම මෙයට තවත් නිදසුනක් වශයෙන් අධ්‍යාපන අවශ්‍යතා සපුරා ගැනීමට පුද්ගලයකුට තිබෙන හැකියාව ද සලකා බැලිය හැකිය. අධ්‍යාපනය පුද්ගලයෙකුගේ ජීවන මට්ටම තීරණය කෙරෙන මූලික සාධකයකි .හොඳ අධ්‍යාපන මට්ටමක් ලබා ගැනීමට යහපත් ආදායම් මට්ටම පමණක් තිබීම ප්‍රමාණවත් නොවේ. සමාජයක අධ්‍යාපනය සඳහා සැමට සමාන අවස්ථා පැවතීම, අධ්‍යාපන හැකියාව ලබා ගැනීමට යහපත් සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයක් පැවතීම, සම අයිතිවාසිකම්, නිදහස වැනි ගුණාත්මක සාධක ඒ සඳහා අවශ්‍ය වේ. මේ ආකාරයට දරිද්‍රතාවය හා බැඳී තිබෙන බහුවිධ සාධක තේරුම් ගැනීමට හැකි වන පරිදි එය පුළුල් සංකල්පයක් ලෙස තේරුම් ගැනීමට අමර්ත්‍ය සෙන්ගේ හැකියා ප්‍රවේශය උපකාරී වී තිබෙන බව පැහැදිලිය.

මෙම ප්‍රවේශය මගින් පුද්ගලයකුට නිදහස තිබූ පමණින් ඔහුගේ ජීවන මට්ටම ඉහළ නොයන බව අමර්ත්‍ය සෙන් අවධාරණය කරනු ලබන විශේෂ කරුණකි. එය තීරණය වන්නේ ඔහුට එම අවශ්‍යතාවයන් සමාජය තුළින් ලබාගැනීමට පවත්නා හැකියාවන් මතය. (Sen Amartya. K. 1999) ඒ අනුව දිළිඳුකම පිටුදැකීමට මානව හැකියා ශක්තිය පුළුල් කළ යුතු බවත්, ඒ සඳහා මානව නිපුණතා වර්ධනයට ඇති අවස්ථා හා ඒවා තෝරා ගැනීමට ඇති නිදහස පුළුල් කළ යුතු බව අමර්ත්‍ය සෙන් සිය හැකියා ප්‍රවේශය තුළින් පැහැදිලි කර තිබේ. ( *Sen A.K,1985 ; Sen A. K,1992*)

එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම හැකියා ප්‍රවේශය අවධානයට ගෙන දිළිඳුකම තේරුම් ගැනීමට හා එය මැනීමට උත්සාහ ගෙන ඇත. 1996 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය දිළිඳුකම මැනීම සඳහා භාවිතා කළ

I. වයස අවුරුදු 5 ට අඩු දරු උපත් ප්‍රමාණය
II. පුහුණු සෞඛ්‍ය නිලධාරීන් නොමැතිව සිදුවන දරු උපත් ප්‍රමාණය
III. ලිවීමට හා කියවීමට නොදත් කාන්තා ප්‍රතිශතය

යන නිර්ණායකයන් මගින් ප්‍රකාශිත වන්නේ සමාජයක දිළිඳුකම අවම වීම කෙරෙහි ආර්ථිකමය නොවන හැකියාවන් පුළුල් වීමේ අවශ්‍යතාවයයි. මෙයින් එම සංවිධානය ජනතාවගේ තෝරාගැනීමේ පරාසය හා අවස්ථා පුළුල් කිරීමට අත්‍යවශ්‍ය සාධක වන සෞඛ්‍ය අධ්‍යාපනය යන සම්පත් අත්පත් කරගැනීමේ හැකියාව මැන බලා ඇත.

ආර්ථික ශක්තිය තිබූ පමණින් පුද්ගලයන් දුගී බවෙන් තොර නොවන බව සෙන් ගේ හැකියා ප්‍රවේශය තුළින් දක්වා තිබෙන විශේෂ කරුණකි. එහෙත් මෙහිදී සෙන් තවදුරටත් අවධාරණය කරනුයේ පුද්ගලයෙකුගේ ආදායම සහ හැකියා සැම විටම එකට ගමන් නොකරන නමුත් හැකියා විහිනතාවය කෙරෙහි බලපාන සාධක අතුරින් ප්‍රබල සාධකය වනුයේ ප්‍රමාණවත් ආදායමක් නොලැබීම වන බැවින් අඩු ආදායම් තත්වය දරිද්‍රතාවයට බලපාන සාධක අතර ප්‍රධාන තැනක් හිමිකර ගනු ඇති බවයි( Sen A. K. 2005).

මෙසේ දිළිඳු බවින් තොර වීම යනු ආහාර ,සෞඛ්‍ය, අධ්‍යාපනය යන මූලික අවශ්‍යතාවයන් සපුරා ගත හැකි වීම පමණක් නොව ජීවිතයේ ගුණාත්මක බව හා බැඳුණු සාධක ද එයට ඇතුළත් විය යුතු බව එමගින් පැහැදිලි කර දී තිබුණ ද, මෙම ප්‍රවේශය තුළ විස්තර කෙරෙන මානව හැකියාවන් මිනුම් කළ හැකි විචල්‍යයන් බවට පත්කර ගැනීමේ දුෂ්කරතාවයක් පවතී. දිළිඳුකම නිශ්චිතව හඳුනා ගැනීම සඳහා ප්‍රමාණාත්මක නිර්නායකයන් ඉදිරිපත් කර නොතිබීම ද හැකියා අතුරින් කුමන ඒවා කුමන ප්‍රමාණයකින් දිළිඳුකමට බලපාන ආකාරය සැළකිල්ලට ගත යුතු ද

යන්න නිශ්චිතව සඳහන් කර නොතිබීම මෙම ප්‍රවේශයේ ප්‍රධාන දුර්වලතා ලෙස සැලකේ (Majumdar, M. and Subramanian, S. 2001) මෙවැනි අඩුපාඩු පැවතියද හැකියා ප්‍රවේශය මගින් දිළිඳු බව අවම කිරීම සඳහා සමාජය තුළ පොදු භාණ්ඩ හා සේවා සැපයීම කෙරෙහි මූලික ප්‍රමුඛතාවයක් ලබා දී ඒ සඳහා පහසු ප්‍රවේශයක් සැමට ඇති කළ යුතු බව පෙන්වා දීම හේතුවෙන් එය නිරන්තර ඇගයීමට ලක් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


Sen A.K, (1999) Development As Freedom, Oxford: Oxford University Press.

Sen A. K 1985 “A Sociological Approach to the Measurement of poverty” Oxford Economic press.

Sen A. K 1992 “Inequality Reexamined Clarendom press” Oxford.

Sen A K 2004 ,Human Rights And Capabilities Jounal Of Human Development www //Tand online .Com.

Majumdar. M and Subramanian. S, (2001),Capability failure and group disparities: some evidence from India , Journal of Development Studies.
https://en.wikipedia.org/wiki/Poverty_reduction.

# සහභාගිත්ව පුහුණුවක සාර්ථකත්වය උදෙසා නිවැරදිව පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.

*සුභාෂිනී දිනුෂා අල්ගම*

පුහුණු කිරීමක් යනු, කිසියම් නිශ්චිත පරමාර්ථයක් හෝ පරමාර්ථ කීපයක් ඉටු කර ගැනීම උදෙසා යම් කිසිවකුට උවමනා කරන දැනුම කුසලතා හා ආකල්ප කිසියම් සංවිධානාත්මක අනුපිළිවෙල කින් යුතු වැඩසටහන් මගින් ලබා දීමයි. අහඹු සිදුවීම් හෝ ස්වභාවිකව අප වෙත ළඟා නොවන දැනුම සැලසුම් සහගතව කිසියම් නිශ්චිත පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා අප උවමනාවෙන් ම ලබාගන්නා දැනුමයි.

මෙවන් පුහුණුවක් අවශ්‍ය වන්නේ යම් කිසි ගැටළුවක් විසඳීම උදෙසාය. එසේම හඳුනාගන්නා සියලුම ගැටළු පුහුණු ගැටළු නොවන බැවින් සියලුම ගැටළු පුහුණු මගින් විසඳීමට ද නොහැකිය. එසේනම් පුහුණු ගැටලු යනු කුමක්ද, ඒ ගැටලු හඳුනාගන්නේ කෙසේද, හඳුනාගනේ කවුද, හඳුනා ගන්නේ කුමක්ද? යන පැනය නිතැතින්ම ඔබට නැගෙනු ඇත. මෙන්න මේ ප්‍රශ්න විසඳීම පුහුණුවට පෙර සිදු කළ යුතු ප්‍රධානම කාර්යය බව කිව යුතුව ඇත.

පර්යේෂණයක නියැලෙන ඔබගේ පර්යේෂණයට පාදක වන ගැටලුව පර්යේෂණ ගැටලුව බවත් සියලුම ගැටලු පර්යේෂණ ගැටලු ද නොවන බවත් කිව යුතුය. පර්යේෂණය සිදු කිරීමට ප්‍රථම මෙම පර්යේෂණ ගැටලුව හඳුනා ගත යුතු සේම පුහුණු ගැටලුව ද පුහුණුවට පෙර හඳුනා ගැනීම කළ යුතුවේ. ඒ සඳහා ප්‍රථමයෙන් ගැටලුවක් යනු කුමක්දැයි ඔබට පැහැදිලි කර ගත යුතුයි.

දැනට පවතින තත්ත්වයත් අපි බලාපොරොත්තු වන තත්ත්වයත් අතර පවතින වෙනස සරලව ගැටලුවක් ලෙස හඳුනාගත හැක.

| නිවසකට ජල පහසුකම් නොමැත | නිවසට ජලය නොමැතිකම → (ගැටලුව) | නිවසට ජල පහසුකම් සපයා ගනී |
|---|---|---|

නමුත් මේ වැනි වෙනසක් තිබූ පමණින් එය ගැටලුවක් නොවන අතර එම වෙනස නිසා යම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට ඉන් පීඩාවක් ගෙන දිය යුතුයි .එසේම මෙම දැවෙන ගැටලුව විසඳා ගැනීමේ අවශ්‍යතාවය ද ඔවුන් වෙතින් ම පැන නැගිය යුතුයි. එක් තරා A නම් ප්‍රදේශයක තේ නිෂ්පාදනයේ යෙදෙන තේ ගොවින් තේ අක්කරයකින් මසකට ලබාගන්නා සාමාන්‍ය තේ දළු ප්‍රමානය 400 kg පමණ වන නමුත් ක්‍රමවත්ව වගාකර ඇති, මනාව නඩත්තු කරන ලද B නම් ප්‍රදේශයේ තේ අක්කරයක ඉඩමකින් ලබා ගන්නා සාමාන්‍ය තේ දළු නිෂ්පාදන ප්‍රමාණය මසකට 800 kg පමණ වේ. ඒ අනුව A නම් ප්‍රදේශයේ තේ ගොවියා ලබාගන්නේ ඔවුන්ට ලබාගත හැකි අස්වැන්න ප්‍රමාණයෙන් අඩක් පමණක් අතර ඔවුන් එම ප්‍රමාණයෙන් සෑහීමකට පත්වේ. ඉන් තේ ගොවියා පීඩාවට පත් වී නැත. ඒ නිසා *අඩු තේ අස්වැන්න* යන කරුණ දැවෙන ගැටලුවක් බවට පත් වී නැත. ඒ අනුව ***අඩු තේ අස්වැන්න*** නම් වූ ගැටලුව නිර්මාණය වී නැත. එම ප්‍රදේශයේ ගොවීන්ගේ තත්ත්වය එසේවුවද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හට මෙම තත්ත්වය ගැටලුවක් විය හැක. එවැනි ඉහල

අස්වැන්නක් අපේක්ෂා නොකරන තේ ගොවියගේ කනස්සල්ලට, පීඩාවට ***අඩු තේ අස්වැන්න*** යන්න ගැටලුවක් නොවන්නා සේම අස්වැන්න වැඩිකර ගැනීමේ අපේක්ෂාවක් ද ඇති නොවේ. යම් ලෙසකින් ගොවියා හා රජය යන දෙපාර්ශ්වයම ***අඩු තේ අස්වැන්න*** හේතුවෙන් පීඩාවට පත්වී තේ නිෂ්පාදනය වැඩි කර ගැනීමේ අවශ්‍යතාවය මතු වූවා නම් ***අඩු තේ අස්වැන්න*** යන කරුණ ගැටලුවක් ලෙස සැලකිය හැක. දැන් පුහුණු ගැටලුව හඳුනා ගන්නා ලද බව ඔබට සිතෙනු ඇත.

නැත ..තවමත් ඔබ විසින් නිවැරදිව ගැටලුව හඳුනාගෙන නැත. සාමාන්‍ය පුහුණුවක් සඳහා පුහුණු ගැටලුව ලෙස මෙය සැලකිය හැකි වුවත්, සහභාගීත්ව පුහුණුවක අරමුණ වන වෙනස ඇති කිරීම උදෙසා නිවැරදි ගැටලුව හඳුනා ගැනීමට නම් ඔබ විසින් තව දුරටත් විමසා බැලිය යුතු ඉතා වැදගත් කරුණු රැසක් පවතී .

ගැටලුව හඳුනාගැනීමේ ඉතා වැදගත් ඊළඟ කාරණය වන්නේ එම ගැටලුව විසඳීම උදෙසා කළ හැක්කේ කුමක්ද? යන්න විමසා බැලීමයි. මේ සඳහා ඔබ කළ යුතු කාර්යය වන්නේ මෙම ගැටළුවේ ස්වභාවය ගැඹුරින් ම විශ්ලේෂණය කිරීමයි. එය තර්කානුකූල පදනමකින් සිදු කළ යුතු වේ. මෙම විශ්ලේෂණයේ දී හඳුනා ගත් ගැටලුව විසඳීම උදෙසා සිදුකළ යුත්තේ තේ ගොවීන් පුහුණු කිරීම ද?, නැතහොත් වෙනත් කාර්යයක් සිදු කිරීම ද? යන්න හඳුනා ගැනීම, විග්‍රහ කරගැනීම ඉතාම වැදගත් වේ. මේ සඳහා ***තේ නිෂ්පාදනය අඩු වීම*** කෙරෙහි බලපාන ලද කරුණු සියල්ල පිළිබඳ අධ්‍යයනය කිරීමක් කළ යුතු වේ. එහි දී තේ නිෂ්පාදනය කෙරෙහි බලපාන කරුණු රාශියක් ඔබට හඳුනාගත හැකි වේ. ඔබ විසින්ම හඳුනා ගත් ඒ ඒ කරුණු අතරින් ඒවා ගොවීන්ගේ දැනුම පිළිබඳ කරුණු ද?, ආකල්ප පිළිබඳ කරුණුද?, කුසලතාව පිළිබඳ කරුණු ද?, නැතහොත් මෙම කරුණු කීපයක එකතුවක්ද? යන වග විමසා බැලිය යුතු වේ. එහි දී,

- නව තේ වර්ග හා නව ක්‍රම පිළිබඳ ගොවීන්ගේ දැනුම අඩුකම
- නව ක්‍රම සඳහා යොමුවීමට මැලිකමක්, අකමැත්ත දැක්වීම
- පොහොර යෙදීම, නඩත්තු කටයුතු, වගාවේ සෙවන වැනි තාක්ෂණික කරුණු පිළිබඳව නොදැනුවත් කම
- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා, නව ක්‍රම සඳහා මූල්‍ය හා වෙනත් සම්පත්වල පවතින හිඟකම

යනාදී කරුණු රැසක බලපෑම තිබිය හැක .මේ කරුණු එකක් හෝ කරුණු කීපයක් නිසා ***තේ නිෂ්පාදනය අඩු*** වීමට හේතු වී තිබිය හැක .

මේ ආකාරයට ඔබ විසින් හඳුනාගන්නා ලද කරුණු අතර දැනුමේ අඩු පාඩුවක් පවතී නම් ඒ පිළිබඳ දැනුම ලබා දීමෙන් ද, ආකල්ප වෙනසක් අවශ්‍ය තැනදී ආකල්පමය වෙනසක් ඇති කිරීමෙන් ද, කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය වන්නේ නම් කුසලතාව ලබාදීමෙන් ද, මූල්‍යමය හෝ වෙනත් සම්පත් වල අඩුපාඩු ඇත්නම් එම අවශ්‍යතා සපුරාලීමෙන් ද මෙම ගැටලුව විසඳිය හැකි වේ. නැතහොත් මෙවැනි කරුණු කිහිපයක් බලපා ඇත්නම් එම කරුණු සියල්ල ඉටුකර දීමෙන් නැතහොත් සපයා දීමෙන් තේ නිෂ්පාදනය වැඩි කිරීමට හැකි වේද? යන්න විමසා බැලිය යුතු වේ. මේ ලෙස ***තේ නිෂ්පාදනය අඩු වීමට*** බලපා ඇති හේතුව නිවැරදිව විමසා නොබලා බොහොමයක් ප්‍රශ්න වලට විසඳුම් පුහුණුව ලෙස සලකමින් පුහුණු වැඩසටහන් සංවිධානය කරන ආකාරය ඔබටත් දැකගන්නට ලැබී ඇති බවට විශ්වාස කරමි.

තේ නිෂ්පාදනය අඩු වීමට හේතුව එම නිෂ්පාදනයේ යෙදවුම් සපයා ගැනීමට නොහැකි වීම නම් පුහුණුවක් සංවිධානය කිරීමෙන් ගැටලුව නිරාකරණය කර ගැනීමට ඔබට නොහැකි වනු ඇත. ඔබ කළ යුත්තේ එම යෙදවුම් සුලබ කිරීම හෝ ඒවා සපයා ගැනීමට උපදෙස් හා පහසුකම් සැලසීමයි.


මෙම කරුණුවලට අනුව පුහුණු කිරීම උදෙසා පුහුණුවට පෙර කළ යුතු කාර්යයක් ලෙස පුහුණු ගැටලුවක් හඳුනා ගැනීම සඳහා ඔබ විසින්,

- යම් ගැටලුවක් (පරතරය) නිසා යමෙක් පීඩාවට පත්වීම තුළින් එම ගැටලුව දැවෙන ගැටලුවක් බවට පත්වී තිබීම,
- මෙම ගැටළුව පිළිබඳව තොරතුරු රැස් කර විශ්ලේෂණය කර එම ගැටලුව විසඳීම උදෙසා පුහුණු වන්නන් තුල දැනුම, කුසලතා, ආකල්ප වෙනසක් ඇති කිරීම තුළින් චර්යාත්මක වෙනසක් ඇති කිරීමට හැකි ගැටලුවක් ද යන්න හඳුනා ගැනීම කළ යුතුවේ.

එසේ කළ හැකිනම් ඔබට පුහුණුවක් සංවිධානය කිරීම හෝ පුහුණු වැඩසටහනක් කිරීමේ සැලසුම් ප්‍රතික්ෂේප කිරීමට හැකිවේ.

දැන් ඔබට ඉහතින් දැක්වූ කරුණු විමසා බැලීමේදී පුහුණු ගැටළු හඳුනා ගැනීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම උදෙසා පෙර කළ යුතු කටයුතු බෙහෙවින් සරල බවක් හැඟී යනු ඇත .නමුත් එය එසේමද?...

නැත... මිනිසා සාමාජික සත්වයෙකු ලෙස සමාජය තුළ කටයුතු කිරීමේ ස්වභාවය අධ්‍යයනය කලහොත් මෙම කාර්යය ඉතා බරපතළ කරුණක් බව ඔබට ද? හැඟී යනු ඇත. සමාජයක විවිධ අංශ තුළ පවතින ගැටලු කෙරෙහි සමාජයේ පවතින්නා වූ සමාජයීය සම්බන්ධතා නැතහොත් ආර්ථික, සංස්කෘතික, ආයතනික, දේශපාලන, අධ්‍යාපන, නීතිමය ආදී අනෙකුත් සමාජ සංස්ථා හා බද්ධ වී ඇත. එබැවින් ගැටලුවක් මතුවන්නේ එක් හේතුවක ප්‍රතිඵලයක් ලෙස නොවේ. එය සමස්ත සමාජ පද්ධතින් සමඟ එකට බැඳී ඇති ඉතා සංකීර්ණ වූ හේතුවක් විය හැක. එබැවින් පුහුණු ගැටලුව තේරුම් ගැනීම දැන් ඉතාම වැදගත් සංකීර්ණ කාර්යයක් බවට පත් වී ඇති බව ඔබට තේරුම් යනු ඇත. මෙම තත්ත්වය නිසා පුහුණු ගැටලුවක යථා ස්වභාවය තේරුම් ගැනීම සංකීර්ණ සමාජය තුළ ලෙහෙසි පහසු කාර්යයක් වන්නේ නැත. ඒ සඳහා බලපාන සාධක ( දේශපාලන, ආර්ථික, සංස්කෘතික, අධ්‍යාපනික, සමාජයීය වැනි) බොහෝ ප්‍රමාණයක් පවතින බැවින් සැබෑ ලෝකය තුළ ගැටලු රැසක් අතරින් පුහුණු ගැටළු හඳුනා ගැනීම සඳහා බලපාන්නා වූ හේතු ඵල සබඳතා සරල සම්බන්ධතාවයක් සේ ක්ෂනිකව සරල ආකාරයෙන් මතු කරගත නොහැක. මෙම තත්ත්වය පහත උදාහරණ ඇසුරින් ඔබට පැහැදිලි කර ගැනීමට හැකිවනු ඇත.




ඉහත උදා හරණයට අනුව වාරි ජලය ඇසුරින් වී ගොවිතැන් සිදු කිරීමේ දී වී **අස්වැන්න අඩුවීම** කෙරෙහි වාරි ජලය නාස්ති වීම යන ආසන්නම හේතුව ඔබට හඳුනාගත හැකි වූ බව සිතන්න. මෙම ගැටලුව විමර්ශනය කර ලබාගත් තොරතුරු විග්‍රහ කර ගනිමින් අස්වැන්න අඩුවීම කෙරෙහි බලපාන හේතුඵල සම්බන්ධතාවය මනාව හඳුනාගත හැකිවූ බව සිතන්න. එහි දී ***අස්වැන්න අඩුවීමේ*** ආසන්නම හේතුව වන වාරි ජලය නාස්තිය සඳහා විසඳුම ලෙස ගොවියගෙ චර්යාත්මක වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වන්නේ පුහුණු වැඩමුළුවක් ම ලෙස ඔබ සිතන්නේද?..

පුහුණු ගැටළු හොඳින් ග්‍රහණය කර නොගන්නේ නම් ඔබ ද එසේ යෝජනා කරනු ඇත. එසේම මෙම ගැටලුව විසඳීමට පුහුණුවක් සංවිධානය කිරීම සඳහා සුදුසු ක්‍රම යෝජනා කරනු ඇත. එහි දී දක්ෂ පුහුණු කරුවෙකු

වන ඔබ, සාර්ථක පුහුණුවක් උදෙසා ජලය නාස්තිය පිළිබඳ දේශන, ක්‍රමවත් ජල පාලන ප්‍රදේශ ඇරඹීමට රැගෙන යාම, එවැනි ක්‍රම අනුගමනය කරනු ලබන ගොවීන් පිරිසක් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දීම, අභ්‍යාස, භූමිකා රංගන ආදී විවිධ උපක්‍රම, චිත්‍රපට හෝ වීඩියෝ පට ආදි විධි ක්‍රම උපයෝගී කර ගනිමින් විචිත්‍රවත් වූ පුහුණුවක් සංවිධානය කරනු ඇත .එමගින් පුහුණුව අවසානයේ ඉතා ඉහළ මට්ටමේ ඇගයීම් රැසක් ලබා ගැනීමේ හැකියාව ද ඔබට ලැබෙනු ඇත. ඒත් පුහුණුවෙන් පසු වාරි ජලය නාස්තිය නැවතී ද?. ***අස්වැන්න අඩු වීම*** ගැටලුව විසදේද?


මෙම උදාහරණයේ ඇති ***අස්වැන්න අඩු වීමේ*** ගැටලුව සඳහා පළවෙනි (ක්‍රමවත් ජල මුර ක්‍රමයක් නොතිබීම) හා දෙවැනි (සැලැස්මකින් තොරවජලය මුදා හැරීම) අවස්ථා දෙකේදීම විසඳුම් ලබාදීම කළ හැකි බව ඔබට පෙනී යන්නේ ද? එමගින් පුහුණුව සඳහා යන වියදම ට වඩා අඩු වියදමකින් ඉක්මනින්ම එම ගැටලුව විසඳීමට හැකි නොවන්නේද?. එසේ කිරීමෙන් ගොවීන් අතර ජලය උදෙසා ගැටුම් හා අකාර්යක්ෂම ජල පාලනය නවතා ගැනීම කලහැකි වන අතර ජලය නාස්තිය වලකා අස්වැන්න වැඩි කර ගැනීමට ගොවියාට හැකි විය යුතුයි. නමුත් සැබෑ ලෝකයේ මෙසේ සිදුවිය හැකිද? පළවන හා දෙවන හේතු වෙනස් කළ ද තුන්වන අවස්ථාව වන ගොවීන් අරගල නවතා ජලය නාස්ති නොකර සිටීමට ගොවියා පෙලඹේවි ද?.

එසේ නැතහොත් තුන්වන අවස්ථාව වෙනස් කිරීම උදෙසා හොඳ පුහුණුවක් සංවිධානය කිරීම මගින් ගොවියාගේ චර්යාවේ වෙනසක් ඇති කර ගොවීන් අතර ගැටුම් නවතා කාර්යක්ෂම ජල පාලනයක් සිදු කිරීමෙන් වාරි ජලය නාස්තිය නවතා අස්වැන්න වැඩි කල හැකි විය යුතුයි. එවිට ගොවියාගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනයෙන් ගැටලුව විස ඳී තිබිය යුතුයි. එය එසේ සිදු වේවිද?

ගොවියාට බලපාන සියලුම ප්‍රශ්ණ පුහුණුවකින් විසදිය හැකියැයි සිතීම අපි විසින් සිදුකරන බරපතනම වරදකි. අපි විසින් පුහුණුවක් මගින් ලබාදෙන කරුණුවලට වඩා ගොවීන්ගේ භෞතික හා සමාජීය පරිසරය විසින් ලබාදෙන දැනුම ඉතා ප්‍රබල බව කිවයුතුයි. එබැවින් ඔවුන් තීරණ ගනු ලබන්නේ ඔවුන්ට අවශ්‍ය පරිදි මිස පුහුණුව තුළින් අප ලබාදෙන දැනුම, කුසලතා, ආකල්ප මත පදනම් වීමෙන් නොවේ. එබැවින් පුහුණුවක් තුළින් අපට සිදුකළ හැක්කේ යෝග්‍ය තීරණ ගැනීම උදෙසා අවශ්‍ය පසුබිම සකස්කර දීම පමණි. මේ දේ සිදුකල හැක්කේ **පුහුණුවකින්ම පමනක් නොවන බව** සහභාගීත්ව පුහුණු පවත්වන ඔබ දැන ගත යුතුයි.

ක්‍රමවත් ජල මුර ක්‍රමයක් භාවිත කර, සැලසුම් සහගතව ජලය මුදා හැර ඇතිනම් (පළමු අවස්ථාව හා දෙවන අවස්ථාව වෙනස්කිරීමෙන්) තුන්වන අවස්ථාවේ සඳහන් වන ගොවියන් ගේ චර්යාව වෙනසක් වේවිද? ඒ සඳහා ගොවියාගේ පරිසරය සකස් වී තිබේ ද? එසේ වෙනස් නොවේ නම් ඒ ඇයි?. ඔබ මේ ගැන හිතා ඇද්ද?

ඇත්ත වශයෙන්ම තවදුරටත් ගොවියාගේ චර්යාව වෙනස් නොවී පෙර තත්ත්වය එලෙසම තවදුරටත් පැවතිය හැකියි.




මෙසේ වන්නේ ඇයි?. මෙම ප්‍රශ්ණයට ඔබට පිළිතුර තිබේ ද?

ඉහතින් සාකච්ඡා කළ පරිදිම ගැටලුව යන්න, හැම විට ම සරල ඍජු හේතුඵල සම්බන්ධයක් ඇති එකක් නොවේ. යම් ප්‍රතිපලයක් ඇති කිරීමේ දී ඒ හා සම්බන්ධ වන එක් හේතුවක් නොව හේතු කිහිපයක් තිබිය හැක. අපි හැම විටම උත්සාහ දරා ඇත්තේ සරල සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් ඒ මත සිට ගැටලු හඳුනා ගැනීම නමුත් සැබෑ ගැටලුව හඳුනා ගැනීම ඊට වඩා ගැඹුරින් සිදුකළ යුතු කටයුත්තක් බව දැන් ඔබට හැගී යනු ඇත. එබැවින් පවතින සමාජ ආර්ථික සංස්කෘතික රටා තුළට කිඳා බසිමින් ගැටලු බිහි කරන මූල බීජය නැත හොත් මූලධාතුන් සියල්ල විමර්ශණය කිරීම අප විසින් සිදු කළ යුතු කර්යයක් වේ.

සාමාන්‍යයෙන් අපි පවත්වන පුහුණු වැඩසටහන් සඳහා තත්‍ය ලෝකයේ ඇති මෙම සැබෑ තත්ත්වයන් අධ්‍යයනය වැදගත් නොවීය හැක. එවැනි පුහුණු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය එනම් විෂය මාලාවක්, දේශකයන්, සුදු ලෑල්ල, පෑන හා අනෙකුත් පුහුණු උපකරණ තිබේ නම් පුහුණු වැඩසටහනක් පැවැත්වීම සරල කාරණයක් වේ. නමුත් ගොවියගේ සැබෑ වෙනසක් බලාපොරොත්තු වන **සහභාගිත්ව පුහුණු වැඩසටහන් තුළ දී** මෙම හැදෑරීම ඉතාම වැදගත් ප්‍රමුඛම කාර්යය වේ.

දැන් අප විසින් සොයා බැලිය යුත්තේ පෙර උදාහරණයට අනුව පළමු හා දෙවන කරුණු වෙනස් කළ ද ගොවියගේ හැසිරීමේ වෙනස් නොවන්නේ ඇයි ද? යන කරුණයි. එසේ වෙනස් නොවන්නේ ඔහුගේ පරිසරය, සමාජ ආර්ථික රටාවේ සංකීර්ණත්වය හේතුවෙනි. ඉන් ගොවීන්ගේ වෙනසක් ඇති නොවීමට හේතුව ඒ විෂය පිළිබඳව ඔහුගේ නොදැනුවත් බව ම නොවේ. ඔහුගේ විෂය දැනුම මෙන් ම ඔහු මෙතෙක් ලබාගත් ප්‍රායෝගික දැනුම හා විවිධ විෂයයන් යටතේ එක් රැස් කර ගත් දැනුම ආදී සියලුම කරුණු තුලනාත්මකව විග්‍රහ කොට ගෙන ඔහුට වඩා වාසිදායක ලෙස තීන්දු ගන්නා බැවිනි. **සහභාගීත්ව පුහුණුවේ දී** මෙන්ම **සහභාගිත්ව සංවර්ධනයේ දී** ද මෙම කරුණ ඉතාම තීරණාත්මක කාරණයක් වේ. ප්‍රජාව තීරණ ගනු ලබන්නේ නැතහොත් චර්යාව වෙනස් වීමට හේතු වන්නේ ඔවුන්ගේ මෙම තර්කානුකූල වූත් ප්‍රායෝගික වූත් ඔහුට වඩා වැඩි වාසියක් ගෙන දෙන්නා වූත් ඔහුගේම මෙම දැනුම තුළ සිටයි.

වාරි ජලය වැඩි භාවිතය වැරදි බව ගොවියා ද හොඳින් දනී. නමුත් ඔහුට කුඹුරේ වල් පාලනය උදෙසා ජලය භාවිතා කිරීමට අවශ්‍ය වේ. මන්ද ඔහුට අඩු වියදමින් ලෙහෙසියෙන් මෙම කාර්යය සිදු කළ හැකි වන්නේ එලෙස ජලයෙන් ලියැදි පුරවා තබා සිදු කරන ජලය අති පරිභෝජනය තුළිනි .එසේම රක්ෂිත ඉඩම් වගා කරන, කුණු ඇල ඉඩම් වගා කරන ගොවීන්ගේ වගාව මේ ලෙස අපතේ යන වාරි ජලය මත පදනම් වී ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මෙම තත්ත්වය ජලය අපතේ යාමක් වුවත් ගොවියාට එය අපතේ යාමක් නොවන්නේය. එසේම මෙලෙස වගාවේ යෙදෙන ගොවින් නිත්‍යානුකූල ගොවින් නොවීම නිසාත් ඔවුන් පුහුණු වැඩසටහන් සඳහා කැඳ වන්නේද නැත. එසේම අනීතිකව වගාවේ යෙදෙන මෙම පිරිස ගොවීන්ගේ ම නෑදෑයින්, දූ දරුවන් නැතහොත් ඔවුනගේ දෙවන පරම්පරාවයි. එබැවින් වාරි ජලය පාලනය කර තම ඥාතීන් බඩගින්නේ තැබීමට සූදානම් වේවිද?..

සිතන්න ...ඔබ යමෙක් උදෙසා අතිශය සාර්ථක පුහුණුවක් ලබාදුන්න ද එසේ ඔහුට ඔබ ලබාදෙන දැනුම, ආකල්ප, කුසලතා වලට අමතරව ඔහුගේ ජීවන පරිසරයෙන් භෞතික හා සමාජ ආර්ථික සංස්කෘතික වටපිටාව ද ඔවුන්ගේ චර්යා කෙරෙහි බලපායි. මේ නිසා සහභාගිත්ව පුහුණු කරුවෙකු ලෙස ඔබට තිබිය යුත්තේ පුහුණු කිරීමේ ශිල්ප ක්‍රම හා සම්බන්ධ වූ විෂය ඥාණය පමණක් නොව සියලු සම්බන්ධතා තේරුම් ගැනීමට හැකි, ගැටළු මනාව විග්‍රහ කර ගැනීමට ඇති හැකියාවකි. එසේ නොකරන ඔබ කොතෙක් හොඳ පුහුණුකරුවෙකු වුවද ඔබගේ පුහුණු වැඩසටහන් මගින් පුද්ගලයකුට, රටකට, සමාජයකට යහපතක් ඇති කිරීමට නොහැකි වේ. ඔබ හොඳ පුහුණුකරුවෙකු සේ පුහුණු කණ්ඩායම සතුටු කර ඔබටද සතුටු විය හැකියි. නමුත් සැබෑ ගැටලුව එසේම පවතියි.

පුද්ගලයා පීඩාවට පත්කරන තත්ත්වයන් එසේම පවතී. **සහභාගිත්ව පුහුණු කරුවෙකු** වන ඔබ යම් කිසි ගැටලුවක්, පුහුණු ගැටළුවක් ද?, සමාජ, ආර්ථික සංකීර්ණතාවයේ ප්‍රතිඵලයක්ද යන්න පැහැදිලිව තේරුම් ගැනීම ඉතා වැදගත් වේ.

ඔබට සාර්ථක සහභාගීත්ව පුහුණු වැඩසටහනක් පැවැත් වීමට අවශ්‍යද?. එසේ නම් මෙතෙක් සාකච්ඡා කරන ලද කරුණු ඇසුරින් සත්‍ය වශයෙන්ම සමාජ වෙනසක් ඇති කිරීමේ අරමුණින් සිදු කළහැකි නිවැරදි පුහුණු ගැටලු හඳුනා ගැනීමෙන් ඒ සඳහා පදනම දමා ගැනීමට ඔබට හැකි වනු ඇත. ඉන් සහභාගිත්ව සංවර්ධනය උදෙසා කටයුතු කරන සහභාගිත්ව පුහුණු කරුවෙක් වන ඔබට සංකීර්ණ හේතුඵල සම්බන්ධතා විමසා බලා නිවැරදි පුහුණු ගැටලුව හඳුනාගැනීම තුළින් සමාජ වෙනසක් උදෙසා **සාර්ථක සහභාගීත්ව පුහුණුවක්** සිදු කිරීමෙන් සහභාගී වන්නාට සැබෑ වෙනසක් අත්කර දීමට හැකිවනු ඇත.

ආශ්‍රිත ග්‍රන්ත


- ශ්‍රී ලංකා පදනම් ආයතන - සහභාගිත්ව පුහුණු අත්පොත -1994
- ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යාස කටයුතු සඳහා - ප්‍රජාසංවර්ධනය පුහුණු අත්පොත කොන්රාඩ් - ආඩිනවුර් පදනමේ අනුග්‍රහයෙන් 1978
- පෙරේරා අයි. රණසිංහ - පුහුණුක්‍රම වේදය -හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය- 1996-

# රසායනික පොහොර වලින් මිදෙන ශ්‍රී ලංකාවේ හෙට දවස.

*නිශාන්ත රණතුංග*

රජදරුවන්ගේ කාලයේ සිට ශ්‍රී ලංකාව හැඳින් වූයේ පෙර දිග ධාන්‍යාගාරය නමින්ය. ගංගා නිම්නවල ආරම්භ කළ කෘෂිකර්මාන්තය ඉතා ඉක්මනින් ජනයා අතර ප්‍රචලිත විය. සාරවත් පසක් තිබීම හා නියමිත කාලයේදී වර්ෂාව ලැබීම යන හිතකර පාරිසරික සාධක පැවතීම ඊට බෙහෙවින් ඉවහල් විය. ඉතිහාසය හැදෑරීමේදි පෙර දිග රටවලට හාල් හා අනෙක් ධාන්‍ය වර්ග අපනයනය කල රටක් හැටියට ප්‍රසිද්ධියක් ඉසිලූ බව පෙනේ. ශ්‍රී ලංකා සමාජය තුල පැවති ගුණ ධර්ම හා ලංකා භූමියේ පැවති සාරවත්භාවය 1848 දී ඉංග්‍රිසින්ගේ ආක්‍රමණයෙන් පසු ක්‍රමයෙන් අභාවයට යන්නට විය. වැවයි දාගැබයි ගමයි පන්සලයි යන උදාර සංකල්පය තුළින් ගොඩනැගුණු සිංහල සමාජය ඉංග්‍රිසින්ගෙන් ලැබුණු ලාභ ප්‍රයෝජන ගිජු වූ සිංහල සමාජය විසින් අමු අමුවේ වල දමන ලදී.

නවීන තාක්ෂණය හා සම්බන්ධ ඒකාධිකාරය සංකේන්ද්‍රණය වී ඇත්තේ බලවත් ධනේශ්වර රටවල් අතලොස්සක් අතෙහිය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල ඉරණම තිරණය කිරීමේ බලය මෙකී තාක්ෂණික ඒකාධිකාරය ඔස්සේ අතලොස්සක් වු මෙම බලවත් රටවල් අතෙහි පවතින බව ඉතා පැහැදිලිය. මේ සඳහා නිදසුනක් ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ භාවිතා වන රසායනික යෙදවුම් දැක්විය හැකිය. ගොම පොහොර, පිදුරු, කැලි කසල, නොයෙක් අතු වර්ග හා අළු ගොවි තැනේදි පොහොර වශයෙන් සම්ප්‍රාදායික ගොවින් විසින් භාවිතා කරනු ලැබිය. අපහසුතා මධ්‍යයේ දෙපයින් නැගී සිටිමට වෙර දරන රටක් හැටියට ශ්‍රී ලංකාව එකී සම්ප්‍රදායික ප්‍රතිපත්තිය වර්තමානයටද කොතරම් ගැලපෙන්නේද යන්න අමුතුවෙන් පැහැදිලි කර දැක්වීමට වුවමනා නොවේ.

එමෙන්ම කෘමි උවදුර පාලනය කර ගැනීමේදී භාවිතා කරන ලද්දේ ද විවිධ දේශිය අමු ද්‍රව්‍ය යොදා නිපදවා ගත් සරල ප්‍රතිකර්මයකි. කොහොඹ හා මී වැනි ශාඛවල කොළ පොතු, ඇට වැනි කොටස් උපයෝගී කර ගනිමින් මෙකී කෘමිනාශක නිෂ්පාදනය කර ගන්නා ලදී. රසායනික යෙදවුම් භාවිතය වර්තමාන කෘෂි සමාජයට සාඩම්බර විලාසිතාවක් වි ඇත. රසායනික යෙදවුම් භාවිතයෙන් ජිව හා අජිව පරිසරයට සිදුවන හානිය ප්‍රමාණය කළ නොහැකි තරම්ය. එහෙත් සම්ප්‍රදායික කෘමිනාශක මෙන්ම පොහොර වර්ග ද අතිශයින්ම පරිසරයට හිතකාමී විය. පැරැන්නන්ගේ සම්ප්‍රදායික කෘෂි නිෂ්පාදන ක්‍රමයේදී කෘමි නාශක භාවිතයක් සිදු වුයේ නැත. ගොවිපලේ හට ගන්නා තණ කොළ ගලවා ඉවත් කිරිම සාමාන්‍ය ක්‍රියා මාර්ගයක් විය. මේ නිසා සාරවත් පසට හා පසට අවශ්‍ය සතුන්ගේ විනාශය අඩු ක්‍රියාවලියක් බවට පත්විය.

සම්ප්‍රදායික ක්‍රියාවලියෙන් මිදිම නිසා වර්තමාන ගොවි ජනතාවට පමණක් නොව ශ්‍රී ලංකාවාසී ජනතාව රසායනික පොහොර භාවිතා කරන ක්‍රියාවලියේ අතුරු ප්‍රතිඵලයක් ලෙස වකුගඩු හා පිළිකා රෝගීන් බවට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතෙන් ආරම්භ වු වකුගඩු රෝගය අද වන විට වයඹ හා ඌව පළාත් වලටත්

ක්‍රමයෙන් දකුණු පළාතටත් ව්‍යාපත්ත වෙමින් තිබේ. මේ වන විට ඉහත සඳහන් පලාත්වල සෑම නිවසකම එක් අයෙක් හෝ වකුගඩු රෝගයට ගොදුරු වි ඇති අතර වාර්ෂිකව සිදුවන මරණ සංඛ්‍යාවද ඉහළ ගොස් තිබේ.

මෙම පළාත් වල ක්‍රමයෙන් උඩු දුවන වකුගඩු රෝගයට ප්‍රධාන හේතුව වන්නේ එම ප්‍රදේශවල ලිං වල හා නළ ලිං වලින් භාවිතාකරණ ජලයේ ඇති රසායනික ද්‍රව්‍ය එම ප්‍රදේශවල ජල මූලාශවලට මෙම රසායනික ද්‍රව්‍ය අඩංගු වන්නේ ඔවුන්ගේ ප්‍රධාන වන කෘෂිකරමාන්තයටයි. විද්වතුන් පෙන්වා දෙන්නේ මධ්‍යම කඳුකරයේ කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය ජලය සමග මුසු වි එම ජලය ඇළවේලි ඔස්සේ වියළි කලාප වල වැව් දක්වා ගාලා ඒමත් එම ජලය භාවිතා කරමින් සිදු කරන වී වගාව නිසා විස රසායනික රට පුරා වැසියන්ගේ ශරිරගත වීමත් සිදුවන බවයි.

වැව් පතුලේ ඇති රොන් මඩ මහා පරිමාණයෙන් ඉවත් කර ඒවා විවිධ පළාත් වලට ගෙන ගොස් දැමීම හා වැව් පතුලේ ඇති වැලි ගොඩ දමා එම වැලි ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලට රථයොම මගින් එම වැලි වල හා පස්වල පවතින රසායනික ද්‍රව්‍ය රෝගා බාධ ඇති කිරීමට ඉවහල් වන බව ද තවත් මතයකි. රන්දෙනිගල හා වික්ටොරියා වැනි ජලාශ පතුලේ ටර්බයින් කරකවා පිටවන ජලය නැවත කෘෂිකාර්මාන්තය සඳහා යොදා ගනි. එම යොදා ගන්නා ජලයේ විශාල වෂයෙන් රසායනික ද්‍රවය තැන්පත් වි ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයකට මෙම ජලය ලබා ගැනිම නිසා වයස් භේදයකින් තොරව දිනෙන් දින වකුගඩු රොගින් හා පිළිකා රෝගින් මෙන්ම මරණ සංඛ්‍යාවද වැඩිවන බව සෞඛ්‍ය අංශ පෙන්වා දෙයි.

ගොවිතැන සඳහා රසායනික පොහොර සුදුසු නැති බවත් කාබනික පොහොර භාවිතය වගාවන් සඳහා පුරුදු වීම අනිවාර්ය කල යුතු බවටත් වන සමාජ කතිකාවක් ගොඩ නැගී තිබේ. බෝ නොවන රෝග සඳහා ද ජනතාව ගොදුරු වී ඇත්තේ ද රසායනික පොහොර භාවිතයෙහි අතුරු ප්‍රතිඵලයක් නිසා බව පර්යේෂණ මගින් ද අනාවරණය වී ඇත. කෘෂිකරමාන්තයේ යෙදෙන ගොවි ජනතාව වකුගඩු රෝගය සඳහා ගොදුරු වී ඇත්තේ ද රසායනික පොහොරවල අඩංගු ආසනික හා බැරලෝහ නිසා වෙන් යැයි මේ වන විට හෙළි වි ඇත.

ශ්‍රී ලංකාවේ වයස භේදයකින් තොරව වසරකට වකුගඩු රෝගීන් 70% කින් ද පිළිකා රෝගීන් 40% ප්‍රතිශතයකින් ඉහළ යෑමේ ප්‍රවණතාවයක් ඇති බවත්, පිරිමි පක්ෂය වැඩි දෙනා කෘෂිකර්මාන්තයේ නියලීමෙන් ඔවුන්ගෙන් බිහිවන දරුවන්ද මෙම රෝගවලට ගොදුරු වන බවත් සෞඛ්‍ය අංශ පෙන්වා දෙන කරුණකි. මෙම කරුණු අවබෝධ කරගත් වර්තමාන ජනාධිපතිවරයාගේ සංකල්පයක් මත රටක ජීවනාලිය වන තරුණ පරපුර හා ශ්‍රී ලංකාවාසි ජනතාවගේ ජිවිත ආරක්ෂා කර ගැනිම සඳහා රසායනික පොහොර භාවිතයෙන් තොරවීමට ගත් තීරණයට ඒක මතිකව සහයෝගය ලබාදිම අප කාගෙත් යුතුකමකි. ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙස හැදින් වූ මේ පුංචි ශ්‍රී ලංකාවේ මිනිසාගේ ආයු කාලය වැඩිකරගන්නත් සතා සිවුපාවන් ගස් කොළන් හා සාරවත් පොළොව අරක්ෂා කර ගන්නත් කාබනික පොහොර භාවිතය සුදුසු බව විද්වතුන්ගේ මෙන්ම මහ ජනතවාගේ මතය වේ. මුල් අවදියේ දි කාබනික පොහොරෙ භාවිතය අමාරු වුවත් කොසේ හෝ මෙම ක්‍රියාවලියට සියලුම දෙනා නැඹුරු කර ගැනිමට හැකි වුව හොත් සෞභාගයෙන් පිරුණු රටක් මතු පරපුර උදෙසා නිර්මාණය කිරීමට හැකිවනු ඇත.

# බෞද්ධ ආර්ථික දර්ශණයට අනුව දිළිදුකම.

*එස්.එම්.යූ.බී. සමරකෝන්*

දිළිදුකම වත්මන් ලෝකය ඉදිරියේ ඇති බලවත් සමාජ ආර්ථික ප්‍රවණතාවයකි. අසංවර්ධිත රටවල පමණක් නොව සංවර්ධිත යැයි සැලකෙන රටවලද ලක්ෂ ගණනින් දිළින්දෝ ජීවත් වෙති. ස්වභාවික සම්පත් බහුල ඉහල තාක්ෂණික ඥාණයක් හා ඉහල ජීවන තත්වයක් ඇති ඇමරිකාවේ පවා දුෂ්පෝෂණයෙන් පෙළෙන, වස්ත්‍ර හිග, නිවාස හිග ඇමරිකානුවෝ දශ ලක්ෂ ගණනින් ඇත. එහි ඇමරිකානු ඉන්දියන්වරු, ස්පාඤ්ඤ ඇමරිකන්වරු, නීග්‍රෝධවරු වැඩිහරිය දුප්පතුන්ය. ලොව ඉහලම සංවර්ධිත රටක තත්වය මෙසේනම් සංවර්ධිත රටවල් යැයි කියා ගන්නා අනෙක් රටවලත් අභ්‍යන්තර තත්වය මෙයම විය හැකිය. එසේනම් අසංවර්ධිත රටවල් පිළිබඳව සාකච්ඡා කල යුතු නොවේ.

දිළිඳුකම පිළිබඳව මෑත ඉතිහාසයේ වැඩියෙන්ම සාකච්ඡා කර ඇත්තේ දේශපාලනික දාර්ශණිකයෙකු වූ **කාර්ල් මාර්ක්ස්ය.** පුරාතන ලෝකයේ දිළිඳුකම සමාජ ප්‍රශ්නයක් ලෙස සාකච්ඡා කර ඇත්තේ ගෞතම බුදුරජාණන් වහන්සේය. නිකාය ග්‍රන්ථයන් හී බොහෝ තැන්වල මේ පිළිබඳව විස්තර දැක්වෙන අතර **චක්කවත්ති සිහනාද සූත්‍රයේ** දී ඒ පිළිබද දැඩි අවධානයක් යොමුකර ඇත.

නූතන අර්ථශාස්ත්‍රඥයින් සමාජගත දිළිඳුබව පිළිබඳව වරද පටවන්නේ දිළින්දන් මතමය. එහෙත් දුප්පතුන්ගේ දිළිඳුකමට ගැරහීම මිනීමරුවන් වෙනුවට මළකදන් වලට දොස් කියන්නාක් වැනි යැයි **ස්ටැන්ලි අයිට්ෂන්** සදහන් කරයි. දරිද්‍රතාවය ජාතික ප්‍රශ්නයක් බවත් එය සංවිධානය කළ ජාතික වැඩසටහනක් තුළින් නැතිකල යුතු බවත් ස්ටැන්ලි යෝජනා කරයි.

ඇතැම්විට ඇතැම් අය දිළිඳු වන්නේ ඔවුන්ගේ විෂම චර්යා රටාව නිසයි. මාදක ද්‍රව්‍ය, සූදුවෙහි ලොල්වීම, පර ස්ත්‍රී සේවනය, අලස බව ආදී දුරාචාරද ඊට හේතු වේ. එහෙත් මුලු මහත් සමාජය පුරාම සමාජගත දිළිදුකම පැතිරේනම් එය අවම කරලීමට රජය මගින් සැලසුම් සංවිධානය කළ යුතු වේ.

**“ඉති බෝ භික්ඛවේ දාළිද්දියම්පි දුක්ඛං ලෝකස්මිං.”**

**මේ ලෝකයේ දිළිඳුබව දුකක්** යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. දුක පැවතිය යුතු දෙයක් නොව නැතිකර ගතයුතු දෙයකි. සන්ධානගත දුක නැතිකර ගැනීමට අවශ්‍ය සමාජ පරිසරය සකස් කර ගැනීම සදහා ධාර්මික ලෙස සමාජගත දුක නැතිකරගත යුතුය.

බෞද්ධ ආර්ථික දර්ශණයට අනුව **“පූර්ව කර්මය නිසා දිළිදුකම ඇතිවේ.”** යැයි සිතා සමාජ අසාධාරණයට රුකුල්දීම ප්‍රතික්ෂේප වේ. මක්නිසාදයත්, සමාජගත නිර්ධනීන් ජනිත වන්නේ තෘෂ්ණාවට දාස වූ අතෘප්තිකර වූ වාණිජත්වය දේවත්වයෙන් සලකන සාධාරණත්වය පිටුදකින සුලු පිරිසකගේ ධන රාශීගත කිරීමේ අනිවාර්ය ප්‍රතිඵලය නිසයි. **“දිළිඳුබව පූර්ව කර්මානුරූපව සිදුවන්නකි”** යන්න බෞද්ධ මතය හැටියට විග්‍රහ කරන්නේ නම් එය බෞද්ධ කර්ම දර්ශණය පිළිබඳව වැරදි අර්ථ දැක්වීමකි. බුදුදහමේ කර්මවාදය පවතින සමාජ තත්වයන් සනාථ

කරන කුමන්ත්‍රණයක් හෝ ආගමික පූජකවරුන්ට අයථා ප්‍රයෝජන ගැනීමට ඉදිරිපත්කල උපක්‍රමයක් හෝ නොවේ. යමෙක් මෙලොව සැපක් හෝ දුකක් විදී නම් ඒ සියලු සැපදුක් පූර්ව කර්මයට භාරදීම තීර්ථක දහමක් යැයි බුදුරදුන් පැවසූහ.

සියලු සැපදුක් පූර්ව කර්මයට භාරදෙන්නා පුරුෂ වීර්යය, පුරුෂ පරාක්‍රමය, නිශ්ඵල බවට පමුණුවන්නෙහිය. මුල් බුදුදහමේ කර්මවාදය අටුවාචාරීන් ගේ දේශකයින්ගේ අතිධාවනය හේතුකොටගෙන තීර්ථායතනයන්ට අයත් පූර්වේකෘත කර්මවාදයක් බවට නැවතත් හරවා ගෙන ඇති බව කේ.ඥාණසිහ හිමියෝ පවසති.

මූලික අවශ්‍යතා කිහිපය හෝ මිනිසුනට සතුටුදායක ආකාරයට ඉටුකරගත හැකි නොහැකිනම් එම සමාජය රෝගී සමාජයකි. ඒ අනුව බලවත් වරදක් සිදුවී ඇත. පතිරූප දේස වාසය ප්‍රායෝගිකව මංගල කරුණක් බවට හරවා ගත යුතුය. ඕනෑම පරිසරයක් හෝ ඕනෑම සමාජයක් මිනිස් ව්‍යායාමයෙන් සුදුසු පෙදෙසක් බවට පරිවර්තනය කල හැකිය.

දිළිඳුබව නිසා මිනිසා සොරකමට පෙළඹේ. සොරකම ආර්ථික ප්‍රශ්න ඇති සමාජයක එක් විපාකයක් බව චක්කවත්ති සිහනාද සූත්‍රයේ කියැවෙන ප්‍රකාශය විද්‍යමාන සමාජය ඇසුරෙන් කල තාත්වික ප්‍රකාශයකි. හේතුඵලවාදී න්‍යායානුකූලව විමසුවද එය තථ්‍ය ප්‍රකාශයක් බව පෙනේ. එහෙත් මිනිසා සොරකමට පෙළඹෙන එකම හේතුව මෙයම නොවන බව බුදු දහමේ සඳහන් වේ. ඇතැමෙක් තම සන්තකය සුරක්ෂිතව තිබියදී අන්සතු වස්තු සොරකම් කරන්නේ ලෝලත්වය හෙවත් ආත්මාර්ථකාමිත්වය නිසාය. මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසය ගැන කියැවෙන අග්ගඤ්ඤ සූත්‍රයේ එන පරිදි මිනිස් වර්ගයා ප්‍රථමයෙන්ම සොරකමට පෙළඹුනේ ආත්මාර්ථකාමී ලෝලත්වය නිසයි. මේ අනුව දිළින්දා සොරකම් කරන්නේ දිළිඳුකම නිසාය. ධනවතුන් සොරකම් කරන්නේ ආත්මාර්ථකාමි ලෝලත්වය නිසයි. සමාජය සුවපත් කල හැක්කේ මේ දෙයාකාරයේම සොරකම් නැති කිරීමෙනි. බොහෝ රටවල නිති පද්ධතිය මකුළු දැලක් වැනිය. මහ සතෙක් දැළට හසුවුව හොත් ඌ මකුළු දැල කඩාගෙන යන අතර කුඩා සතා දැළේ පැටලී විනාශ වේ. එබඳු නීති පද්ධතියක් යටතේ බොහෝ ධනවත් අයගේ සොරකම් ආරක්ෂා වේ. දිළිඳු අය දඬුවම් විදී.

ප්‍රාග් බෞද්ධ යුගයේ කුළ හීනයන් පීඩිතව සිටි අතර ධනවත් කුලීනයෝ පීඩකයෝ වූහ. බ්‍රාහ්මණ ධර්ම යටතේ ආරක්ෂා කරනු ලැබුවේ දැඩි අසමානතාවෙන් යුක්ත වූ සමාජයිය සූරාකෑම් වලට ඉඩ තැබූ සමාජ ක්‍රමයකි. දිළිඳුබව විෂම ආර්ථික ක්‍රමයේ ඵලයකි. චක්කවත්ති සිහනාද සූත්‍රයට අනුව සොරකම් කළ පුද්ගලයෙකු ප්‍රකාශ කරන්නේ ජීවත්වීමට නොහැකි නිසා සොරකමට පෙළඹෙනු බවයි. (නහී දේව ජීවාමී) ධනවාදයේ වර්ධනයත් සමගම පළමුව ඇතිවන්නේ සොරකම බව මාර්ක්ස් හා එංගල්ස් ගේ කොමියුනිස්ට් ප්‍රකාශනයෙහිද සඳහන් වේ. සොරකමට පමණක් නොව මනුෂ්‍ය ඝාතනය, ගණිකා වෘත්තිය, අවිආයුධ නිෂ්පාදනය ආදි භයානක කායික හා මානසික දුරාචාරද ඇතිවන බව චක්කවත්ති සිහනාද සූත්‍රයේ සඳහන් වේ. ධනවාදී රටවල මෙන්ම සමාජවාදී රටවල ද සොරකම අල්ලස හා වෙනත් අපරාධ ද නැතැයි කිව නොහැකිය. මක්නිසාද යත් ලෝභ ද්වේෂ ආදී කෙලෙස් වලින් බර සත්වයා සිටින සෑම තැනකම පාප ක්‍රියාවන් සිදුවන බැවිණි. එය ලෝක ස්වභාවයයි. එහෙත් පවතින සමාජ තත්වයට අනුව ඒවා අඩු හෝ වැඩි විය හැකිය.

කූටදන්ත සූත්‍රයේ එන සැලැස්මට අනුව නිෂ්පාදනය, බෙදාහැරීම හා පරිපාලනය ඇතුලත් සමස්ථ ආර්ථිකයම කාර්යක්ෂම කර දිළිඳුබව තුරන්කල හැකිය. බොහෝ දුරාචාරවලට මූලහේතුවක් වූ දිළිඳුකම වැලැක්වීම පාලක පක්ෂයේ යුතුකමක් වන අතර යාගය වෙනුවට බුදුරජානන් වහන්සේ අනුමත කළේද ආර්ථික ආයෝජනය

යැයි **ඒ.කේ.බෝඩර්** පවසයි. අර්බුද රහිත සුඛිත මුදිත සමාජයක් ඇතිකොට නිෂ්පාදනය, බෙදාහැරීම හා රාජ්‍ය පාලනය ආදි විවිධ ක්ෂේත්‍රවල යෙදෙන අයගේ ජීවන තත්වයන් සුරක්ෂිත කිරීමෙහි නියාමකයා රාජ්‍ය අංශයයි.

**ආශ්‍රිත ග්‍රන්ථ-**

බෙලිගල්ලේ ධම්මජෝති හිමි, බෞද්ධ ආර්ථික දර්ශණය-1992

# ශ්‍රී ලංකාවේ ගොවිජනපද ව්‍යාපාරය

කේ.එම්. ජී සමරසේන

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සලකා බලන විට ගොවිජනපද ව්‍යාපාරය වැඩි වැදගත්කමක් ගනී. (පනතක් මගින් පාර්ලිමේන්තුවේ සම්මත වී නීතිමය ආවරණයකින් ආර්ථික අරමුණු කිහිපයන්ම ඉටුකරගන්නා වැඩ පිළිවෙලක් ප්‍රතිපත්තියක් වශයෙන් හැඳින්විය හැකිය). ලංකාවේ කෘෂිකර්මයේ දියුණුවට ගොවිජනපද ව්‍යාපාරය ප්‍රතිපත්තියක් වශයෙන් ඉහළ දායකත්වයක් ලබාගෙන තිබේ. මෙහිදී ගොවිජනපද ව්‍යාපාරය යනු කෘෂිකර්මය දියුණු කිරීමට අදාළ ශ්‍රමිකයන් ඒ ඒ ප්‍රදේශවල පදිංචි කරවා කෘෂිකාර්මික සම්පත් වැඩිදියුණු කිරීමට කරුණු යෙදීමයි. ඉංග්‍රීසීන්ගේ පාලනයෙන් නිදහස ලබනවිට වියළි කලාපයේ තිබූ පැරණි ජලාශ සහ වාරිමාර්ග පද්ධතිය විනාශ වී ගොස් තිබුණි. ඒවා පෝෂණය කිරීමට අමතර ජල සැපයුමක් අවශ්‍ය විය. මේ අනුව පවතින ජල මට්ටම යටතේ එම වාරිමාර්ග ආශ්‍රිත ජනපදිකයින් පදිංචි කිරීමත් නව ජලාශ ඉදිකිරීමෙන් ගොවීන් පදිංචි කිරීමත් මෙම ව්‍යාපාරය යටතේ සිදු විය. ඊට අමතරව මහවැලිය වැනි දැවැන්ත ව්‍යාපාරවලින් පැරණි වාරිමාර්ග පෝෂණය කිරීමත් වෙනත් බහුකාර්ය අරමුණු ඉටුකර ගැනීමත් මේ යටතේ සිදු වී තිබේ.

වී වගාව දියුණු කිරීමට මිනිසුන් සමූහයක් වශයෙන් පදිංචි කිරීමේ වැඩපිළිවෙලකි මෙය. රජය සතු ඉඩම් මෙම ගොවිජනපද ව්‍යාපාර පිහිටුවීම සඳහා වෙන් කර බෙදා දුන් අතර ඒවා රජයේ වියදමින් එළිපෙහෙළි කිරීමත්, ජනපදිකයන් පදිංචි කිරීමත් සිදුවේ. පදිංචිකරුවන් යම්කිසි ආර්ථික මට්ටමකට පැමිණෙන තෙක් නඩත්තු වියදම් සැපයිම, නිවාස සපයා දීමත්, ගොවිජනපද ව්‍යාපාරයක ක්‍රියාකාරීත්වය වේ.

ගොවිජනපද ව්‍යාපාරවල ව්‍යාප්තිය සලකා බලන කළ පොළොන්නරුව දිස්ත්‍රික්කය - ඇළහැර ,මින්නේරිය, කවුඩුල් ,ගිරිතලේ, පරාක්‍රම සමුද්‍රය. මහනුවර දිස්ත්‍රික්කය මිනිපේ 1 සහ 2 අදියර. මාතලේ- මිනිපේ 3 සහ 4 අදියර. හම්බන්තොට දිස්ත්‍රික්කය-මුරුතවෙල. පුත්තලම දිස්ත්‍රික්කය- තබ්බෝව. අනුරාධපුරය දිස්ත්‍රික්කය - රාජාංගණය, නාච්චාදූව, පදවිය. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - කන්තලේ. යාපනය දිස්ත්‍රික්කය - ඉරණමඩු. අම්පාර දිස්ත්‍රික්කය - ගල්ඔය ව්‍යාපාරය. ගොවිජනපද ව්‍යාපාර යටතේ බෙදා දුන් ඉඩම් කාලීන වශයෙන් ප්‍රමාණය වෙනස් විය. මුලදී අක්කර 8ක් පසුව අක්කර 5ක් පසුව අක්කර 2 1//2 ක් වශයෙන් බෙදාදෙනු ලැබීය.

ගොවිජනපද ව්‍යාපාරවල විශේෂ ලක්ෂණ

1.මුළු ව්‍යාපෘතියම එකම විශාල ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වීම.

2.විශේෂ සම්බන්ධීකරණ නිලධාරියෙකු යටතේ ක්‍රියාත්මක වීම.

3.සම්බන්ධීකරණය සඳහා විශේෂ ව්‍යාපෘති අධිකාරියක් ක්‍රියාත්මක වීම.

4.ප්‍රධාන බෝගය වී වශයෙන් ක්‍රියාත්මක වීම.

5.වාරිමාර්ග යටතේ කුඩා ගොවිපළවල් වශයෙන් ක්‍රියාත්මක වීම.

පැරණි වාරිමාර්ග ආශ්‍රිත පදිංචිව සිටි ජනයා නැවත ප්‍රතිසංස්කරණ මාර්ගයෙන් වැඩිදියුණු කිරීම ගොවිජනපද ව්‍යාපාරවලින් සිදු වේ. ඒ වගේම පැල්වෙහෙර, ගල්ඔය වැනි නව ජලාශ ආශ්‍රය කරගෙන ජනපදිකයින් අලුතින්

පදිංචි කරන ලදී. අද මහවැලිය මාර්ගයෙන් වඩාත් දියුණු මට්ටමින් ජනයා පදිංචි කිරීමක් කෙරේ. මේ සියල්ලම ආශ්‍රයෙන් පහත සඳහන් අරමුණු අපේක්ෂා කරන ලදී.

1. උපරිම ඉඩම් ප්‍රමාණයක් එක් පුද්ගලයෙකුට ලබාදීමට උත්සහ කිරීමෙන් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩිකර ගැනීම ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකර ගැනීම. ආහාර නිෂ්පාදනය වැඩිවීමෙන් සමස්ත ආහාර ආයාත අඩුකර ඉතිරිවන විදේශ විනිමය සංවර්ධනය සඳහා යොදවා ගැනීම.
2. ඉඩම් හිඟය පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් ලබාදීම.
3. මේ ආශ්‍රිත ජනපද පිහිටුවීම. (ජනපද පිහිටුවීම යනු පුද්ගලයෙකුට ජීවත් වියහැකි භෞතික පරිසරයක් නිර්මාණය කිරීම)
4. මිනිසුන් පදිංචි කරවීම. (තෙත් කලාපීය ප්‍රදේශවලින් මිනිසුන් රැගෙන ගොස් ස්ථිර වාසස්ථාන සපයා දීමයි)
5. සමුපාකාර ක්‍රියාවලිය සහ කෘෂිකාර්මික නිෂ්පාදිතයන් නංවාලීම.
6. ඒ ඒ ප්‍රදේශවල සුදුසු භෝග සොයා ගැනීම සහ අලෙවි පහසුකම් වර්ධනය කරගැනීම.
7. ගෘහ අවශ්‍යතා පදනම් කරගෙන කෘෂිකාර්මික අමුද්‍රව්‍ය මත වූ කර්මාන්තයන් ඇති කිරීම.
8. කෘෂි අංශය තුළ සේවා නියුක්තිය වැඩිකර ගැනීම තුළින් සේවා වියුක්ති ප්‍රශ්නයට විසඳුම් ලබාදීම.
9. ගංවතුර පාලනය සිදු කිරීම.
10. තෙත් කලාපයේ ජන පීඩනය අඩු කිරීම.
11. වියළි කලාපය සංවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ ප්‍රාදේශීය වශයෙන් සමබර ආර්ථික වර්ධනයක් ඇති කිරීම.

මෙම අරමුණු බොහෝමයක් ගල්ඔය වැනි ගොවිජනපදවලට සීමා විය. ගල්ඔය ව්‍යාපාරය සැලකුවහොත් 1956-57 වර්ෂවල පවුල් 4880 ක් වෙනුවෙන් මිනිසුන් 33000ක් පදිංචි කරවිය. 1965 වන විට පවුල් 11936ක් දක්වා වැඩි වී තිබේ. මෙය විශේෂ වූයේ තෙත් කලාපයෙන් වියළි කලාපයට ජනතාව සංක්‍රමණය කිරීමක් සිදු වීමයි. අම්පාර ප්‍රදේශයේ වී නිෂ්පාදනය වැඩිදියුණු කිරීම 1950 ගණන්වල රජයේ වැඩි සලකා බැලීමක් සිදුවූ අංශයක් විය. පැරණි වාරිමාර්ග පොළොන්නරුව අනුරාධපුරය ප්‍රදේශවලට සීමා වී තිබුණු අතර අම්පාර වැනි දිස්ත්‍රික්කයන්වල වූ ඓතිහාසික පසුබිම තුළින් වුවද කෘෂිකාර්මික ප්‍රගතියක් ලබා නොගත් ප්‍රදේශයකි. මේ නිසා විදේශ ආධාර යටතේ අලුතින් ජලාශ්‍ර ඉදිවිය. මේ කාලයේ මැලේරියා වසංගතය වියළි කලාපයේ ප්‍රබලව තිබුණි. මරණ අනුපාතය ඉහළ අගයක් විය. මෙ නිසා ජනයා එම ප්‍රදේශවලට යාම ප්‍රතික්ෂේප කළේය. සමකාලීනව මේ වන විට තෙත් කලාපයේ අධික ජනගහනයක් සිටීම නිසා තෙත් කලාපයේ ජනගහණය අඩුකොට වියළි කලාපයට යැවීමෙන් ජනගහනය සම්බන්ධයෙන් ද විසඳුමක් යොදනු ලැබීය. මුලදී හැකි උපරිම ඉඩම් ප්‍රමාණයක් ලබා දුනනේය. උස් බිම් සැලකුවහොත් සීනි නිෂ්පාදනය වෙනුවෙන් එක් පුද්ගලයෙකුට අක්කර 04ක් පමණ සපයා දී තිබේ. මඩ හා ගොඩ ඉඩම් වෙන්කර නිවසක් තනා අස්වැන්න ලැබෙන තෙක් කාලය සඳහා ජීවත් වීමට ද්‍රව්‍යමය ආධාර ද සපයමින් මෙම ජනපද ව්‍යාපාරය ආරම්භ කළේ ය. මේ නිසාම ඉහළ වී නිෂ්පාදනයක් ලබාගැනීමට හැකි වූ අතර ගොඩ ඉඩම්වල උක්වගාව දියුණු කිරීමට කටයුතු යෙදුවේ සීනි නිෂ්පාදය සඳහායි. 1965 පමණ වන විට උළු හා ටයර් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තයන්ද මෙම ප්‍රදේශවල ව්‍යාප්ත වූ අතර දුම්කොළ වගාව අතිරේක ආහාර බෝග වශයෙන් දියුණු කිරීමට සැලසුම් කෙරුණි. මේ ආකාරයට ගොවිජනපද ව්‍යාපාර තුළ අලුතින් ඉඩම් අස්වැද්දීමත් ඔස්සේ ජනයා පදිංචි කිරීමත් නිෂ්පාදනය වැඩිකර ගැනීමත් සිදුවිය. මේ සමගම පැරණි වාරිමාර්ග ප්‍රතිසංස්කරණ සහ ජනයා පදිංචි කර වැඩිදියුණු කිරීමක් අපේක්ෂා කරන ලදී.

පොදුවේ සලකන විට තෙත් කලාපයේ ජනපීඩනයට විසඳුමක් මේ නිසා ලැබී තිබේ. පදිංචි කරනු ලැබූ ජනයා තෙත් කලාපීය ප්‍රදේශයේ අඩු ආදායම් ලැබූ උදවිය නිසා ඉඩම් සම්පත් හිමිවීමෙන් වී නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබාදෙනු ලැබීය. වී නිෂ්පාදනය වැඩි කිරීමට ආරම්භ වූයේ මෙයයි. මැලේරියා වසංගතයට තිබූ බිය නිසා මුල් කාලවල අඩු ප්‍රතිඵල ලැබුණත් මැලේරියා මර්දන ක්‍රම ඇති වීමෙන් ප්‍රශ්නය විසඳුනි. පදිංචි කරනු ලැබුවෝ නව ජනපදිකයින් නිසා තෙත් කලාපයේ සම්ප්‍රදායික ගම්වල තිබූ සම්ප්‍රදායික ප්‍රශ්න ද ඇති වූයේ නැත. බොහෝ විට ගම්මාන රේඛීය පසුබිමක් පෙන්නුම් කළේය. වී නිෂ්පාදනය වැඩි වී ගැමියන්ගේ ආදායම් ඉහළ ගියේය. 1965 දී බලයට පත් වු රජය සහල් සහනාධාරය අඩු කිරීමේ අරමුණු වූයේ මෙසේ කෘෂි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහාය. වාරිමාර්ග පදනම් කරගත් ජන ජීවිතයකට පදනම ගොවිජනපද නිසා ඇති වුණි. පැල්වෙහෙර ප්‍රදේශයේ එක් පුද්ගලයෙකුට අක්කර 2 ½ ක් පමණ බෙදා දීමට හැකිවිණි. කණ්ඩලම වැව ආශ්‍රිත ජල සම්පත මේ යටතේ ප්‍රයෝජනයට ගැනුණි. කුඹුරු ඉඩම් ලබාදී ඒවාට ජලය සැපයීමෙන් ආහාර නිෂ්පාදනය වැඩිකර ගැනීමට හැකිවූවාය. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය සලකා බලන විට ස්වයංපෝෂිත මට්ටම දක්වා පැමිණීමට හේතු වූයේ ගොවිජනපද ව්‍යාපාරයයි.

ගොවිජනපද ව්‍යාපාරවල ඇති වු ගැටලු.

1.සෞඛ්‍යය පිළිබඳ ප්‍රශ්න - බෝවන රෝග නිසා පදිංචියට යාමට මැළිවීම පදිංචියට ගිය පිරිස් නැවත තෙත් කලාපයට සංක්‍රමණය වීම ඉඩම් අතහැර ගිය පිරිස් නිල නොවන ආකාරයට තම ඉඩම් ව්‍යාපාරකයින්ට විකිණීම සිදුවීම නිසා අපේක්ෂිත අරමුණු ඉටු නොවීය.

2.අන්තර් පහසුකම් ගොවිජනපද ව්‍යාපාරවල නොමැති නිසා නිෂ්පාදන ඉහළ මට්ටමක පවත්වා ගත නොහැකි විය.( එනම් ප්‍රවාහනය, පණිවුඩ හුවමාරුව, විදුලිබලය, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි)

3.ඉඩම් ඇතැම් සුළු ව්‍යාපාරිකයන් වටා ඒකරාශී වීම - අඩු ආදායම්ලාභී ගොවීන්ට ඉඩම් උකස් කිරීමට සිදු විය. එම නිසා නිල නොවන මට්ටමේ ව්‍යාපාරික පන්තිවල පරිහරණයට මෙම ඉඩම් පත්විය. එම නිසා ආදායම් ව්‍යාප්ති විෂමතාව වැඩිවිය. තවද සේවා වියුක්තිය වැඩිවිය.

4.ඉඩම් භුක්තිය සම්බන්ධ ප්‍රශ්නය - එනම් ඉඩම්වල අයිතිය පුද්ගලයින්ට නොදුන් නිසා ඒවා අලෙවි කිරීමට පෙර ඒවා බෙදා වෙන්කළ නොහැක. ඒ නිසා දූදරුවන්ට එම ඉඩම්වලම පදිංචි විය යුතුය. එම නිසා භුක්තියේදී ඉඩම් කුඩා කැබලි බවට පත්විය. එහිදි ගොවීන්ට කෘෂිකාර්මික කම්කරුවන් බවට පත්වීමට සිදුවේ.

5.උකස්, බදුගැනීම්, මුදල් ණයට දෙන්නන්, ආදී වශයෙන් මූල්‍යමය පසුබිම ඔස්සේ ගැතිභාවයන්ට ගොවීන් පත්වේ.

6.කුලී කම්කරුවන් වෙනත් ප්‍රදේශවල කුලී වැඩ ආදිය සඳහා සංක්‍රමණය වීමට පටන් ගැනීමෙන් වෙනත් වෙනත් සමාජ ගැටලු ඇතිවීම.

7.ගොඩ ඉඩම් ඌන උපයෝජනයක් සිදුවීම. වී පිළිබඳ පමණක් සලකා බැලූ නිසා ගොඩ ඉඩම් ඌන උපයෝජනයක් සිදුවිය.

8.කෘෂිකාර්මික ප්‍රශ්න සම්බන්ධයෙන් තිබූ ගැටලු.- ඵලදායිතාවය අඩු වීම ප්‍රධාන ගැටලුව වේ. හරිත විප්ලවයෙන් මීට පිටිවහලක් ලැබුණත් මිනිසුන් අතර ඇති ආදායම් පරතරය පුළුල් වීම නිසා ණය ගැතිභාවය වැඩිවීම මෙයට හරස් වී ඇත.

මෙලෙස ගොවිජනපද ව්‍යාපාරයේ අඩුපාඩු බොහෝමයක් විය. මහවැලිය වැනි බහුකාර්ය ව්‍යාපාර අවශ්‍ය වූයේද මේ නිසයි. ඉඩම් බෙදා දීමේ දී පසුකාලීන දේශපාලන බලපෑම් විශාල වශයෙන් ඇති වී තිබුණි. මේ නිසා අසහනකාරී තත්ත්වයක් ඇති වූ බව ඇතැම් අධ්‍යයනයන්ගෙන් පෙන්වා දී තිබේ. ප්‍රධාන ගැටලුවක් නම් කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ වී නිපැයුම වැඩිකර ගැනීම ගැන පමණක් අවධාරණය කිරීමෙන් අනිකුත් අරමුණු ඉටු නොවීමයි. එනම් ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් ජනපදිකයන්ට ලැබුණේ නැත. ගබඩා කිරීම් සහ අලෙවි පහසුකම් ප්‍රමාණවත් නොවීම. ඒ වගේම කෘෂිකාර්මික සේවා යෙදවුම් සැපයීම ප්‍රමාණවත් නොවීම. මේ නිසා අතරමැදියන් මේවා සැපයීමට සම්බන්ධ වීමෙන් ගොවීන් සූරාකෑමට ලක්වී තිබේ. ගිණි පොලියට ණය සැපයීම එම අතරමැදියන් විසින් සිදුකර ඇත. ගොවිජනපද ආශ්‍රිත නිවාස රටාවද ගැමි ජනජීවිතයට සුදුසු පරිදි නොවීය. එම නිසා පොකුරු ජනාවාස රටාවන් නිර්දේශ කර වර්තමානයේ ක්‍රියාත්මක වී ඇත්තේ ඒ නිසාය. විවිධ ජනකොටස් නිසා මත්ද්‍රව්‍ය ජාවාරම් ආදී ගැටලු ගොවිජනපදවල දක්නට ලැබුණි. පරිසරය කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම ගොවිජනපද ව්‍යාපාර නිසා දක්නට ලැබේ. වනාන්තර විනාශ වීම, වෙනත් පාරිසරික සම්පත් විනාශවීම මේ නිසා දක්නට ලැබේ. එම නිසා වන සංරක්ෂණයට පසුකාලීනව වැඩි වියදම් දැරීමට සිදුවේ. මේ කරුණු නිසා ආසියානු සංවර්ධන බැංකුව, ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානය ඊට වඩා වෙනස් කෘෂිකාර්මික සංවර්ධනයක් ගැන ශ්‍රී ලංකාවේ අවධානය යොමු කළේය. 1967ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානය පැරණි ගොවිජනපද ව්‍යාපාරවල ගැටලු වෙනුවට විසඳුම් සැපයෙන දැවැන්ත ව්‍යාපාරයක් වශයෙන් මහවැලි ව්‍යාපාරය හඳුන්වාදෙනු ලැබීය.

# සමාජ සුරක්ෂිතතාව හා බැඳුණු පුද්ගල වගකීම.

සී. කේ. ඩබ්ලිව්. අල්විස්

සමාජය යන්නෙහි සරල අර්ථය පුද්ගල සමූහයක එකතුවක් යන්නය. කිසියම් භූගෝලීය ප්‍රදේශයක් තුළ එකිනෙකා අතර සම්බන්ධතා පවත්වමින් සාමූහිකව ජීවත් වන පුද්ගල එකතුවක් ලෙස එය තව දුරටත් හැඳින්විය හැකිය. ඒ අනුව සමාජය පුද්ගලයන්ගෙන් නිර්මාණය වන බව පසක් වේ. පුද්ගලයා කිසියම් පවුල් ඒකකයකට අයත් වන අතර, පවුල් රාශියක් එකතුවීමෙන් සමාජයක් නිර්මාණය වේ. ඕනෑම සමාජයක් තුළ එයට ආවේණික වූ සිරිත් විරිත්, පිළිගැනීම්, නීති රීති, සම්ප්‍රදායන් හා සංවිධාන දක්නට හැකිය. සියලුම සමාජ ඒවාට පොදු වූ ආචාර ධර්ම, සම්මුති හා එකඟතා අනුව සකස් වී ඇත. එමෙන්ම කිසියම් සමාජයක් තුළ විවිධ වූ උප සමාජ ද හඳුනාගත හැකිය. නිදසුන් ලෙස ග්‍රාමීය, නාගරික, සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බෞද්ධ ආදී වශයෙනි.

වත්මන් සමාජය තුළ මිනිස් අවශ්‍යතා සංකීර්ණ වී ඇත. කිසිදු පුද්ගලයකුට හුදෙකලාව ජීවත්වීමට අපහසුය. තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා එකිනෙකා මත යැපීමට සිදුවන අතර විවිධ සමාජ ආයතනවල දායකත්වය ද අවශ්‍ය වේ. වර්තමානයේ සමාජය පුළුල් වී මුළු ලෝකයම එක සමාජයක් ලෙස පරිවර්තනය වෙමින් පවතී.

සුරක්ෂිතතාව යනු උපරිම ලෙස ආරක්ෂාව සැලසීමයි. ඕනෑම සත්වයකු මෙන්ම මිනිසා ද තම ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වේ. ඒ අනුව සමාජ සුරක්ෂිතතාව යනු සමාජයේ ආරක්ෂාව හෙවත් යහපැවැත්ම තහවුරුවීමයි. එක් එක් පුද්ගලයාගේ ආරක්ෂාව සහතික වන විට ඉන් සමස්ත සමාජයේම සුරක්ෂිතතාව තහවුරු වේ. පුද්ගලයා සමාජයේ පවතින සිරිත් විරිත්, සමාජ ඇගයීම්, නීති රීති, සම්ප්‍රදායන් ආදිය පිළිගනිමින් ඒවාට අනුකූලව ජීවත්වීමෙන් සමාජ සුරක්ෂිතතාව ඇතිවේ.

සමාජ සුරක්ෂිතතාව ඇතිවීම කෙරෙහි පුද්ගල චර්යා වැදගත් වේ. යහපත් සමාජයක ගති ස්වභාවයන්ට අනුව පුද්ගලයා වෙනස්වීම හා පුද්ගලයන්ගේ යහපත් අපේක්ෂාවන් අනුව සමාජය වෙනස් කර ගැනීමෙන් පුද්ගල චර්යා සකස් කර ගැනීම තුළ සමාජ සුරක්ෂිතතාව ආරක්ෂා කරගත හැකිය.

**සමාජ සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ආයතන**

පුද්ගලයෙක් සමාජයේ පවතින අංග තමාගේ පෞරුෂ ගුණාංග සමග ගලපා ගැනීම සමාජානුයෝජනය මඟින් සිදු වේ. සමාජානුයෝජනය තුළින් සමාජයේ සුරක්ෂිතතාව ඇති කිරීමට ඉවහල් වන මූලික ආයතන හතරක් හඳුනා ගත හැකිය.

- පවුල
- පාසල
- ආගමික ආයතන
- සමාජ සංවිධාන

එම ආයතන හතරයි.

**සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලේ දායකත්වය**

පුද්ගලයකු සමාජයට හැඩ ගැස්වීමේ දී මූලික වන්නේ පවුලයි. පවුලේ සාමාජිකයින් අතර යහපත් සම්බන්ධතා යහගුණ හා යහපත් ආකල්ප ඇතිවීමෙන් යහපත් පුද්ගලයකු නිර්මාණය වේ. එවැනි පුද්ගලයා සමාජයේ ද යහපත් ලෙස කටයුතු කරයි. පවුල් සම්බන්ධතා දුර්වල වූ විට පුද්ගලයා සමාජයට නොගැළපෙන හැසිරීම් රටාවක් ඇති කර ගන්නා අතර එය සමාජ සුරක්ෂිතතාවට අහිතකර ලෙස බලපායි. ඒ අනුව පුද්ගලයාගේ හා සමාජයේ සුරක්ෂිතතාව කෙරෙහි පවුල නමැති සමාජ ඒකකයේ ගති ලක්ෂණ බලපායි. පවුලකින් සමාජ සුරක්ෂිතතාව සඳහා ඉටුවිය යුතු කාර්යයන් සමූහයකි.

- යහපත් සමාජ සම්බන්ධතා ඇති කිරීම
- යහපත් සෞඛ්‍ය පුරුදු
- වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපැදීම
- අන්‍යයන්ට සවන් දීම
- අන්‍ය අදහස් හා මතවාදවලට ගරු කිරීම
- සංස්කෘතිය ආරක්ෂා කිරීම
- ආර්ථික සහයෝගීතාව ඇති කිරීම
- ආරක්ෂාව හා ආදරය ලබා දීම
- සමාජය දෙස ධනාත්මකව සිතීම
- චිත්තවේග පාලනයට හුරු කිරීම
- සමාජ සිරිත් විරිත් හා අගයයන් පිළි ගැනීම
- ආදායම් වියදම් කළමනාකරණය කිරීම
- ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීමට හුරු කිරීම ආදියයි.

මෙම ගුණාංග මනා ලෙස පවුලක් තුළින් පුද්ගලයාට ලැබීමෙන් ඒවා පුද්ගලයාගෙන් සමාජයට ද ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ සුරක්ෂිතතාව ඇති වේ. සමාජානුයෝජනය සඳහා පවුලෙන් මෙන්ම පාසලෙන් ආගමික ආයතන මගින් හා සමාජ සංවිධානවලින් ද විශාල දායකත්වයක් ලබා දෙයි.

පාසලෙන් යහපත් පුරුදු, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම සමාජයේ සුරක්ෂිතතාවට හේතු වේ.

ආගමික ආයතන සම්බන්ධයෙන් ගත්කල, සෑම ආගමකින්ම පුහුණු පුරුදු කරනු ලබන්නේ පුද්ගලයන්ට සමාජයේ හොඳ පුරවැසියන් ලෙස සමගියෙන් සහයෝගයෙන් හා සහජීවනයෙන් යුතුව ජීවත්වන ආකාරයයි.

සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා සමාජ ආයතන/ සංවිධාන මගින් ද විශාල කාර්යය භාරයක් ඉටු කරනු ලබයි. ළදරුවකු වයසින් වැඩෙත්ම තමා සමාජයේ සාමාජිකයකු වශයෙන් පිළිගැනීමට නම් සමාජයේ පිළිගත් චර්යාවන් පිළිගැනීම හා ඒවාට අනුගතවීම අවශ්‍ය බව සමාජ ආයතන තුළින් ඉගෙනු ගනු ලබයි.

සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමේ ප්‍රධාන සාධකය වන්නේ පුද්ගලයායි. එයට හේතුව සමාජ පද්ධතිය තුළ ඇති සියලුම සිරිත් විරිත්, නීති රීති, සංවිධාන හා අනෙකුත් යාන්ත්‍රණ පුද්ගලයා මූලික කරගෙන සකස් වී ඇති බැවිනි. පුද්ගලයා ඒවා කෙරෙහි අවධානය යොමු නොකරන්නේ නම් හා ඒ අනුව හැසිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් සමාජ සුරක්ෂිතතාව ඉබේම බිඳ වැටේ. සමාජය පිළිගත් ආචාර ධර්ම හා සම්මුතිවලට පටහැනිව පුද්ගලයා හෝ පුද්ගල

කණ්ඩායමක් කටයුතු කරයි නම් එවිට සමාජ සුරක්ෂිතතාව බිඳ වැටෙනු ඇත. එලෙස සමාජ සුරක්ෂිතතාව බිඳ වැටීම කෙරෙහි බලපාන්නා වූ කරුණු කිහිපයක් පහත පරිදිය.

- නීතිගරුක නොවීම
- පවුල තුළ සිදුවන ගැටුම්
- ආගමික ආයතනවලින් දුරස්ථ වීම
- අන් මත නොඉවසීම
- අන් අයට ගරු නොකිරීම
- දිළිඳුකම
- තරඟකාරිත්වය
- දැඩි ආත්මාර්ථකාමී බව
- සමාජ සාරධර්ම පිරිහීම
- නිසි අධ්‍යාපනයක් නොලැබීම
- දේශීය සංස්කෘතිය අගය නොකිරීම
- හුදෙකලාබව

එවන් කරුණු හේතුවෙන් සමාජ සුරක්ෂිතතාව බිඳ වැටීම පුද්ගලයාගේ ආරක්ෂාවට බලපාන බැවින් සමාජ සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීම සෑම පුරවැසියකුගේම වගකීම වේ. පුද්ගල වගකීම් නිසි ලෙස ඉටු කිරීමෙන් පුද්ගල සුරක්ෂිතතාව තහවුරු වන අතර එමගින් සමාජ සුරක්ෂිතතාව ද ඇති කළ හැකිය. එලෙස සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා පුද්ගලයන් සතු වගකීම් රාශියක් හඳුනා ගත හැකි අතර ඉන් කිහිපයක් පහත දැක්වේ.

- තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් හඳුනා ගැනීම හා ඒවා ඉටු කිරීම
- තමා හා අවට සමාජයේ ආරක්ෂාව පිළිබඳ නිරතුරුව විමසිලිමත් වීම.
- රජය විසින් පනවා ඇති නීති රීතිවලට අවනත වීම හා ඒවාට ගරු කිරීම
- රටේ නීතිය හා සාමය පවත්වා ගැනීමට ආරක්ෂක අංශවලට සහාය දැක්වීම
- ආරක්ෂක හමුදාවන්ට හා පොලීසියට ගරු කිරීම හා ඒවායේ කාර්යයන්ට සහාය ලබා දීම
- සමාජ සුරක්ෂිතතාව කඩවන අවස්ථාවලදී ඒ පිළිබඳව අදාළ අංශ දැනුවත් කිරීම
- පවුලේ සාමාජිකයින් ලෙස තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම
- බාල පරපුර/දරුවන් සඳහා ආදර්ශවත්ව ක්‍රියා කිරීම
- ආගමික ආයතන සමග නිරතුරුව සම්බන්ධවීම හා ආගමික පරිසරයක් අනුව කටයුතු කිරීම
- සංස්කෘතික අගයන්, සිරිත් විරිත්, සම්ප්‍රදායන් ගරු කිරීම හා ඒවා ආරක්ෂා කිරීම
- පවුලේ සාමාජිකයින් ලෙස තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම
- තම කුසලතා වර්ධනය කර ගැනීමටත්, පෞරුෂ සංවර්ධනයටත් අවශ්‍ය අධ්‍යාපනයෙහි නිරත වීම

මෙවැනි පුද්ගල වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීම රටක සෑම පුරවැසියකුගේම යුතුකමකි. ඒ සඳහා සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා සමාජ සංවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පූර්ණ සහාය දීම පුද්ගලයන් සතු වගකීමකි. එය නොපිරිහෙලා ඉටු කිරීමෙන් පුද්ගලයන් තුළින් සමාජය ආරක්ෂා වන අතර සමාජය ආරක්ෂා වීමෙන් පුද්ගල

ආරක්ෂාව ද තහවුරු වන බව අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. එවිට පුද්ගල සුරක්ෂිතතාව හා සමාජ සුරක්ෂිතතාව ද ඇති කළ හැකිය.

( අන්තර්ජාලය ඇසුරෙන්ය)

# ශ්‍රී ලංකාවට කොවිඩ්-19 වසංගතයේ බලපෑම.

*ප්‍රදීප් ලංකාපෙල*

කොවිඩ්-19 වසන්ගතය 2019 වසරේ දෙසැම්බර් අග චීනයේ හුබෙයි ප්‍රාන්තයේ වුහාන් නගරයෙන් මතුව ලොව පුරා පැතිර ගිය නව කොරෝනා වසංගතය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නම් කරන ලද්දේ කොවිඩ්-19 (CORONA VIRUS DISEASE-19) යනුවෙනි. මිනිස් ඇසට නොපෙනෙන මේ වෛරසය සමස්ත ලෝකයේම ආර්ථික සහ සමාජ ජීවිතයට බියකරු අනර්ථයක් ඇති කිරීමට සමත් විය. මේ වන විට ලොව පුරා කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව මිලියන 265 ඉක්මවා තිබිණ. මරණ සංඛ්‍යාව මිලියන 5.25 ක් ඉක්මවා ඇත. ලංකාවේ ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ 5 ඉක්මවා තිබෙන අතර මරණ සංඛ්‍යාව 14,440 ක් ඉක්මවා ඇත. වසංගතයක් හෝ වෙනත් ව්‍යසනයක් නිසා සිදුවන ජීවිත විනාශය පිළිබඳ සංඛ්‍යා බොහෝ විට මුළුමනින්ම නිරවද්‍යව නැත.

## රට රටවල කොරෝනා


සංසන්දනය කිරීමට අවශ්‍ය පරිදි මිලියනයක ජනගහනයකට දත්ත සාමාන්‍යකරණය කර ඇත.
අවසන් වරට යාවත් කාලීන කළේ: 2021 ජුනි 06 වැනිද

| | සමස්ත අසාධිතයන් මිලියනයකට | සතිපතා ආසාධිතයන්ගේ වෙනස % | මුළු ආසාධිතයන් මිලියනයකට | එන්නත් කළ සංඛ්‍යාව (පළමු මාත්‍රාව %) | මරණ මිලියනයකට | අලුත් ආසාධිතයන් මිලියනයකට |
|---|---|---|---|---|---|---|
| ලෝකය | 1,703 | -16 | 22,284 | 11.4 | - | 456 |
| ශ්‍රී ලංකාව | 1,608 | +12 | 9,414 | 8.3 | 77 | 144 |
| ඉන්දියාව | 1,067 | -33 | 20,687 | 13.0 | 249 | 82 |
| පාකිස්තානය | 218 | -24 | 4,139 | 2.7 | 94 | 9 |
| සිංගප්පූරුව | 1,608 | -15 | 9,414 | 40.0 | 77 | 144 |
| තායිලන්තය | 711 | +6 | 2,498 | 3.6 | 17 | 40 |
| කැනඩාව | 685 | -31 | 36,540 | 59.7 | 676 | 20 |
| බ්‍රිතාන්‍යය | 1,631 | +46 | 66,138 | 58.9 | 1,874 | 85 |
| ඇමෙරිකාව | 16,496 | -35 | 102,774 | 50.6 | 1,841 | 31 |
| ප්‍රංශය | 2,930 | -21 | 87,264 | 40.1 | 1,681 | 102 |

% මරණ ගණනය කරනු ලබන්නේ නිශ්චිත මරණ හා සමස්ත ආසාදන වාර්තා පදනම් කරමිනි. සැකැසුම ආචාර්ය නිමල් රාජපක්ෂ Ph.D ඇල්බර්ටා, කැනඩා ප්‍රසිද්ධියට පත් කරන දත්ත, මූලාශ්‍ර ඇසුරින් තහවුරු කරන ලදී.

**කොවිඩ්-19 වසංගතයේ ආර්ථික බලපෑම.**

කොවිඩ්-19 මානව සමාජයේ සෑම පැතිකඩකටම කළ අනර්ථකාරී බලපෑම ඉමහත්ය. ධනවත්, දුප්පත් දෙවර්ගයේම රටවල ආර්ථිකය කෙටි කලකට හෝ මුළුමනින්ම පාහේ කඩා වැටිණ. එය කෙතරම්ද යත් 2020 වර්ෂයේ ගෝලීය ආර්ථික වර්ධන අනුපාතය - 4.9% වනු ඇතැයි අන්තර්ජාතික මූල්‍ය අරමුදල ජූනි මස ප්‍රකාශයට පත් කළ ආර්ථික සමාලෝචනයේ සඳහන් වෙයි. ලෝක බැංකුවට අනුව ගෝලීය ආර්ථිකයේ පරිහානිය 5.2%කි. අන්තර් ජාතික කම්කරු සංවිධානයේ ගණන් බැලීම අනුව ලොව පුරා නැතිව ගිය රැකියා සංඛ්‍යාව මිලියන 305ක් විය. කම්කරු සංවිධානය සඳහන් කරන පරිදි ලෝකයේ වැඩකරන ජනයාගෙන් අඩක් පමණම නිරතව සිටිනුයේ අවිධිමත් රැකියාවලය. සෑම දහ දෙනෙකුටම හය දෙනෙක් එවැන්නෝ වෙති. ලොව අංක එකේ ආර්ථිකය හිමි ඇමරිකා එක්සත් ජනපදයේ නැතිව ගිය රැකියා සංඛ්‍යාව මේ වන විට මිලියන 50 ඉක්මවා ගොසිනි. 2020 වසරේ ලෝක වෙළෙඳ පරිමාවේ පරිහානිය 32% ක් බව ලෝක වෙළෙඳ සංවිධානය ගණන් බලා ඇත. මහ පරිමාණ මෙන්ම සුළු පරිමාණ කෘෂිකර්මාන්තය අඩාලවීම නිසා වසංගතයක් හා සමාන සාගත තත්ත්වයක් නිර්මාණය වී ඇතැයි එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන සඳහන් කරයි.




2020 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය මූර්ත වශයෙන් සියයට 3.6කින් සංකෝචනය වී ඇති බවත් එය නිදහසින් පසු ශ්‍රී ලංකාවේ වාර්තා වූ විශාලතම ආර්ථික අවපාතය බවත් ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

2020 වාර්ෂික වාර්තාව නිකුත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව මේ බව සඳහන් කරන අතර වසංගතය හේතුවෙන් ගෝලීය ආර්ථිකයෙහි ඇති වූ පසුබෑමට සමගාමීව මෙම තත්ත්වයට මුහුණ පෑමට ශ්‍රී ලංකාවට සිදුව ඇති බව එහි සඳහන් වේ. මෙහිදී වැඩිදුරටත් මහ බැංකුව මෙසේ කියා සිටී.

රජය සහ මහ බැංකුව විසින් සිදු කරන ලද සුවිශේෂී ප්‍රතිපත්තිමය මැදිහත්වීම් තුළින්, 2020 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සංකීර්ණ අභියෝගයන්ට කාර්යක්ෂම ලෙස මුහුණ දුන්නේය. කොවිඩ්-19 වසංගතයෙන් පැන නැගුණු ගැටලු හේතුවෙන් සමාජ ආර්ථික බලපෑම් ඇති වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස කුටුම්භ ඒකක හා ව්‍යාපාර වෙත වූ බලපෑම අවම කිරීම සඳහා මෙම ප්‍රතිපත්තිමය මැදිහත්වීම් අත්‍යවශ්‍ය විය. එසේම, ආර්ථිකය තුළ

විශ්වාසනීයත්වය තහවුරු කිරීමටත්, එමගින් සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව මත ඇති කෙරෙන දැඩි පීඩනය වළක්වාලීමටත් එවැනි මැදිහත්වීම් අවශ්‍ය විය.

වසංගතය හේතුවෙන් ගෝලීය ආර්ථිකයෙහි ඇති වූ පසුබෑම හා සමගාමීව, නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විශාලතම ආර්ථික අවපාතය වාර්තා කරමින්, 2020 වසරේ දී ආර්ථිකය මූර්ත වශයෙන් සියයට 3.6කින් සංකෝචනය විය. කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ අරමුණ ඇතිව දේශීය හා ගෝලීය වශයෙන් පැනවූ සංචරණ සීමා සහ අනෙකුත් ක්‍රියාමාර්ග හේතුවෙන් ආර්ථිකයේ සෑම අංශයකම මූර්ත ආර්ථික කටයුතුවලට බාධා එල්ල විය. ඉදිකිරීම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස පසුබෑමකට ලක් වීම හේතුවෙන් වසර තුළ දී කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල තියුණු පහළ යෑමක් දක්නට ලැබුණි.




වසංගතය හේතුවෙන් ප්‍රවාහන, වෙනත් පෞද්ගලික සේවා සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවාවල සිදු වූ පහළ යෑමත් සමඟ සේවා අංශයෙහි ක්‍රියාකාරකම්වල ද සැලකිය යුතු සංකෝචනයක් වාර්තා විය. කාලෝචිත ප්‍රතිපත්ති තුළින් ලද සහාය සහ හිතකර කාලගුණික තත්ත්වයන්හි ධනාත්මක බලපෑම ඉක්මවා වසංගතයෙහි බලපෑම ඉස්මතු වීම හේතුවෙන් කෘෂිකාර්මික අංශය ද වසර තුළ දී සංකෝචනය විය.

ආයෝජක අපේක්ෂා මන්දගාමී වීම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී ආයෝජන වියදම් සංකෝචනය වූ අතර, පරිභෝජන වියදමෙහි සුළු වර්ධනයක් දක්නට ලැබුණි. ජාතික ඉතුරුම්වල පහළ යෑම ඉක්මවා ආයෝජන වියදම අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ දී ඉතුරුම්-ආයෝජන පරතරය අඩු විය. මේ අතර, වසංගතය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතා මධ්‍යයේ, ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පහත වැටුණු අතර, 2009 වසරින් පසුව ප්‍රථම වරට සේවා වියුක්ති අනුපාතිකය සියයට 5 ඉක්මවීය.

පවත්නා වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පහළ යෑමේ සහ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින්, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය පෙර වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 3,852 සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් 3,682ක් දක්වා පහළ ගියේය. සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය, 2019 වසරේ එ.ජ. ඩොලර් බිලියන 84.0ක සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 80.7ක් දක්වා පහළ යෑමට ද වසංගතය හේතු විය.

රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, විදේශීය අංශය 2020 වසර තුළ දී මුහුණ දීමට සිදු වූ ප්‍රබල බාධකයන්ට එරෙහිව ක්‍රියාත්මක විය. ලාංකීය අපනයනකරුවන්ගේ අවදානම්වලට මුහුණ දීමේ හැකියාව පිළිබිඹු කරමින්, සංචරණ සීමා පැනවීම සහ සමාජ ආර්ථික කටයුතු සීමා කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් අඩු වූ වෙළඳ භාණ්ඩ අපනයන කඩිනමින් යථා තත්ත්වයට පත්විය. ඒ අනුව, කෙටි කාලපරිච්ඡේදයක් තුළ දී අපනයන ඉපැයීම් වසංගතයට පෙර පැවති මට්ටමට නැවත ළඟා විය.

ගෝලීය වශයෙන් සංචරණ සීමා පැනවීම හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රය දැඩි බලපෑමකට ලක්විය. වසංගතය මධ්‍යයේ වැඩ කිරීම සම්බන්ධයෙන් නිර්මාණය වූ නව්‍ය වාතාවරණයේ සහාය ලබමින්, තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (IT/BPO) යන අංශයට අදාළ සේවා වෙළඳාම මත විදේශ විනිමය ඉපැයීම් සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.





වසංගතය ආරම්භ වීමත් සමඟ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල පහළ යෑමක් දක්නට ලැබුණ ද, 2020 වසර තුළ දී ප්‍රේෂණ ලැබීම් සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් විය. වසර ආරම්භ වන විට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් මන්දගාමීව පැවති ආර්ථිකයට සහාය සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබිණි. කෙසේ වෙතත්, වසංගතයේ බලපෑම හේතුවෙන් 2021 වසර තුළ දී රාජ්‍ය මූල්‍ය කටයුතු සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දීමේ ප්‍රතිඵලයක් ලෙස ආදායම් රැස් කිරීම අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පැවති අතර, පුනරාවර්තන වියදම් ඉහළ ගියේය. වසංගතය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් මත ඇති වූ බලපෑම මෙන්ම, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය හේතුවෙන් ප්‍රාග්ධන වියදම අඩු විය. කෙසේ වෙතත්, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළ වුව ද, මහ බැංකුවෙහි සහ බැංකු අංශයෙහි මූල්‍ය සහයෝගය ඇතිව, වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් හට සහන සැලසීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කළේය.

මීට අමතරව, වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධනය සැපයීම ඉලක්ක කරගනිමින් මහ බැංකුව විසින් සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙනු ලැබීය. තවද, තෝරා ගත් මූල්‍ය උපකරණවලට අදාළ ණය අනුපාතික පහළ යෑම වේගවත් කිරීම සඳහා මහ බැංකුව විසින් ඍජු ක්‍රියාමාර්ග මෙන්ම ශිෂ්ට ප්‍රයෝග ද යොදා ගන්නා ලදී.

මේ අතර, මහ බැංකුව සහ බැංකු අංශය විසින් වසංගතය මධ්‍යයේ අවහිරතාවකින් තොරව රාජ්‍ය මූල්‍ය කටයුතු පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය මූල්‍යන පහසුකම් සපයන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, අනෙකුත් අංශ සඳහා වූ ණය ප්‍රසාරණයට අමතරව, බැංකු අංශය විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය 2020 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එමගින් පුළුල් මුදල් සැපයුමෙහි සැලකිය යුතු ප්‍රසාරණයක් ඇති විය. මේ අතර, වසංගතය හේතුවෙන් ආර්ථිකයට අවශ්‍ය වන සුවිශේෂී සහාය සැපයීම සඳහා මූල්‍ය අංශය සවිබල ගන්වන අතරම, මූල්‍ය ආයතනවල අභිප්‍රායයන් සුරක්ෂිත කිරීම මෙන්ම, එම ආයතනවල තැන්පත්කරුවන් ආරක්ෂා කරගැනීම

ඉලක්කකර ගනිමින් විවිධ ක්‍රියාමාර්ග හඳුන්වාදීම හරහා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව පවත්වා ගැනීම තහවුරු කරන ලදී.

වසංගතය හේතුවෙන් පහත සඳහන් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය.

- **දෛනික වැටුප් උපයන්නන් දුෂ්කරතාවන්ට මුහුණ දීම**
- **වැඩිහිටියන් සහ දරිද්‍රතා සීමාවට ඉහළින් ඊට ආසන්නයේ ජීවත් වන විශාල පිරිසකට බලපෑම් ඇතිවීම**
- **අන්තර්ජාතික වෙළෙඳාම මන්දගාමී විය හැකිය**
- **සංචාරක කර්මාන්තයේ අකර්මන්‍ය ස්වභාවය පැවතීම**
- **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල පහළ යෑමක් ඇතිවීම**
- **භාණ්ඩ හා සේවා අපනයන ආදායම් පහළ යාම**
- **ආර්ථිකයේ දරුණුතම පසුබෑම**

වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග, එහි පැතිරීම මැඩපැවැත්වීමට උපකාරී වුවද, එමගින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් ඇති කර තිබේ.

**( අන්තර්ජාලය ඇසුරෙන් )**

# කොවිඩ් 19 ඇතුල් කෙළවර.

*පී.පී යමුනා කුමාරි*

2019 වසර නිමා කරමින් 2020 වර්ෂය උදා වූයේ සමස්ත ලෝවැසි ජනතාවගේ දහසකුත් බලාපොරොත්තු සමුදායක් පොදි බැඳගෙනය. ලෝවැසි ජනතාවගේ මෙන්ම ශ්‍රී ලාංකිකයින් වන අපටද සෞභාග්‍යය උදා වීම තුළින් අපේ ජන ජීවිතය ඉහළට එසවේ යැයි යන්න පිළිබඳ බලාපොරොත්තුවක් තිබුණා යැයි පැවසීම අතිශයෝක්ති නොවේ. මන්ද නව රජයේ බලයට පත්වූ නායකත්වය අපට ලබා දුන් ප්‍රධාන කරුණක් වූයේ අපේ රටේ ජන ජීවිතය සුඛිත මුදිත කිරීම සඳහා සෞභාග්‍යයේ දැක්ම පිළිබඳ යථාර්ථවාදී අදහසක් ලබා දීමයි.

2020 වර්ෂය උදා වී මුල් කාර්තුව ඉක්ම යන්නට පෙර ලෝ වැසි සියලු දෙනාගේ බලාපොරොත්තු සුනු විසුණු කරමින් ජනතාව හා නගර හුදෙකලා කිරීමට කොරෝනා සමත් වූ බව අපට රහසක් නොවේ. කිසිවෙකුට මින් බේරීමට නොහැකි වූයේ ස්වභාදහමේ අභියෝගවලට මුහුණ දීමට හැකි කිසිවෙකු මිහිපිට නොමැති නිසාවෙනි. අද ලොව පුරාම සියලු රටවල පාහේ ව්‍යාප්තව ඇති මෙම වසංගතය නිසා ලෝකයේ බලවත් රාජ්‍යවලට විශාල වශයෙන් අභියෝග රැසකට මුහුණ දීමට සිදු වූ බව පෙනේ. අපේ රට ආසන්නයේ පිහිටි ඉන්දියාවද මෙම තත්ත්වයට මුහුණ දුන් අතර එම නිසා විශාල වශයෙන් ජන ජීවිතය හා ආර්ථිකය කඩා වැටුණු බව විවිධ අංශ වලින් පෙන්වා දෙයි.

වසංගතයේ පළමු රැල්ල අප රටේ ව්‍යාප්ත වීමත් සමඟම ඇති වූ ආර්ථික හා සමාජීය වැදගත්කම විමසා බැලීම වටී. සාමාන්‍ය ජන ජීවිතයේ විවිධ අයුරින් බිඳ වැටෙන්නට විය. අප සමාජයට නව වචන එකතු විය. සංචරණ සීමා, නිරෝධායනය, නිරෝධායන ඇඳිරි නීතිය උදාහරණ ලෙස දැක්විය හැකිය. වසංගතය මර්ධනය කිරීම සඳහා රජය සහ දේශපාලන අධිකාරිය ගත් උත්සාහය ප්‍රශංසනීය ලෙස අගය කළ යුතුය. සෞඛ්‍ය අංශයේ නීතිරීතිවලට යටත්ව ජනතාව ඒකරාශි වීම සිදු වූ අතර එහි ප්‍රතිඵලය වූයේ අප ඒ සාර්ථකව මැඩ පවත්වා සුපුරුදු පරිදි ජන ජීවිතය යථා තත්ත්වයට පත්වීමයි. ඕනෑම සිද්ධියක් ලංකාවේ ජනතාවට මතක තිබෙන්නේ සතියක් හෝ දෙකක් බව අප අත්දැකීමෙන් දනිමු. යථාර්ථයක් බවට පත් වෙමින් කොරෝනා රැල්ලේ දෙවන අවස්ථාවට අපට අවතීර්ණවීමට සිදුවූයේ අනපේක්ෂිත ව ය. යළිත් කොන්දේසි ඇති කරමින් ජනතාව ජන ජීවිතයේ සාමාන්‍ය කටයුතු වලින් ඈත් වී යළිත් නිවසට සීමා වන්නට විය. මෙහිදී ජනතාව සෑම නිවසකම පාහේ ගෙවතු වගාව, හේන් වගාව හා පුරන් වූ කුඹුරු අස්වැද්දීම සිදු කළේ සෞභාග්‍යයෙ දැක්ම යථාර්ථයක් බවට පත්කරමිනි. ගොවිතැන් කටයුතුවල යෙදුණ ජනතාව අතරින් බිත්තර වී, එළවළු බීජ, කෘෂි උපකරණ නොමිලේ ලබා ගැනීමට උත්සුක විය. ඔවුන් ගොවිතැනට පෙළඹුණේ නිරායාසයෙනි. ගොවීන් සමග නිරන්තරයෙන්ම ගැටෙන නිලධාරීන් ගන්නා වූ තීන්දු තීරණ තුළින් රාජ්‍ය යාන්ත්‍රණය මැදිහත්වීමෙන් ගොවිතැනට අවශ්‍ය දේ ලබා දීමටත් ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන් එම සේවා පහසුකම් කෘෂිකාර්මික බිම් වලට ගෙන යාමත් සැලකුමෙ ගොවිතැන වෙනුවෙන් තම වගකීම ඉටු කිරීමක් හැටියටය. ගොවිජන සංවර්ධන, කෘෂිකාර්මික අමාත්‍යාංශය ,පරිපාලන ක්ෂේත්‍රයේ සියලු අංශ ඉහළ සිට පහළ නිලධාරීන් දක්වා සෑම අංශයකම සහයෝගය හා දායකත්වය නිරන්තරයෙන් ලබාදීමට ඔවුන් උත්සුක විය.

සෑම ගෙවත්තකම පාහේ පල වැලෙන් සරුසාර වන්නට විය. සෑම බිමක් ම පාහේ කුමන හෝ වගාවකට යොමු කර තිබීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. ජනතාවට වස විසෙන් තොර ආහාර වේලක් ලබා ගැනීමට හැකි වීම ප්‍රශංසනීය කරුණකි. අප සමාජයේ ජනතාව මෙම කාලය තුළ චැනල් සෙන්ටර් කරා ඇදී ගියේ ඉතාමත් අඩු ප්‍රවණතාවය කින් බව පෙන්වා දීම යුක්ති යුක්තය .එයට හේතුව වන්නට ඇත්තේ ජනතාව නිදහස් හා විවේක කාලය නිරන්තරයෙන්ම තම පවුලේ කටයුතු සඳහා යොදාගැනීම නිසා යැයි අනුමාන කළ හැකිය. මේ තත්ත්වය පවුල තුළ සහයෝගය හා එකමුතුකම මනා ලෙස වර්ධනය වීමට ඉවහල් වන්නට ඇත. පළමු රැල්ල මෙන් දෙවන රැල්ල ජයග්‍රහණය කිරීම අප සිතූ තරම් ලේසි පහසු වූයේ නැත. එය වේගවත් ලෙස සමාජය පුරා සැරිසරන්නට විය. සෞඛ්‍ය අංශය, ආරක්ෂක අංශය ඇතුළු රාජ්‍ය යාන්ත්‍රණය කොතරම් ක්‍රියාත්මක වූවත් කොරෝනා රැල්ල යළි හිස ඔසවන බව අපට වඩාත් හොඳින් දැනුනේ මාධ්‍ය තුළින් දිනෙන් දින එහි යථා තත්ත්වය පෙන්වා දීම නිසාය. ලංකාවේ කොතැන හෝ ප්‍රදේශයක මහ පොළොව තුළ වැළලී ගියේ අපේ සහෝදර ජනතාවගේ ජීවිත බව කණගාටුවෙන් වුවද පෙන්වා දිය යුතුය. තවද කොරෝනා මාරයා සමග ජීවිත රැසකට ජීවය දුන් සෞඛ්‍ය හා වෙනත් අංශවල නිලධාරීන් මිය ගියේ කුමන අපරාධයක් නිසාද ?යන්න පැන නැගෙන ප්‍රශ්නයකි.

2021 වර්ෂය උදා වූයේ මේ වසංගතය නිසා බැට කෑ ආර්ථික, සමාජ හා දේශපාලන ව්‍යුහය මත බව අප සියලු දෙනා දන්නා සත්‍යයකි. සෞඛ්‍ය නිලධාරීන් පෙන්වා දුන්නේ යළිත් සෞඛ්‍යය මාර්ගෝපදේශ වලට අනුකූලව රට විවෘතකරන ලෙසය. එහෙත් බලධාරීන් හා දේශපාලන ව්‍යුහය අතර පැවති මතිමතාන්තරවල ප්‍රතිඵලයක් හැටියට සිංහල අවුරුදු උත්සවයට මිනිසුන් මුහුණ දුන් ආකාරය යළිත් මෙම රෝගය වඩාත් උත්සන්න වීමට අත වැනීමක් බවට පත්විය. එහි ප්‍රතිඵලය වූයේ අප යළි තුන්වෙනි රැල්ලක් කර පා නැගීමය. මේ තත්ත්වය ඉතා භයංකර විය. දිනපතා රෝගීන් ගේ ප්‍රමාණය ඉහළ යාම ශෝචනීය කරුණක් වන අතර අප සමාජයෙන් වෙන්වී ගිය ජීවිත ප්‍රමාණය ද අති විශාලය. මේ තත්ත්වය අපේ ජන ජීවිතයේ විවිධ පැති ඔස්සේ ගලා ගියේය. රටේ ආර්ථිකයට කණ කොකා හැඬලී ය. ආර්ථිකයේ මේ දෙදරීම රටේ සමස්ත ප්‍රජාවගේ ම ජන ජීවිතය තුළ ඉතාමත් දැඩි ලෙස බලපෑවේය. රට තුළ දැන් දෙස් විදෙස් සංචිත වල හිර වීමක් දක්නට විය. මේ තත්ත්වය විවිධ ගැටලු ගණනාවක් නිර්මාණය කිරීමට උපස්ථම්භ වූවා විය. තෙල් මිල ඉහළ ගියේය. එය සමස්ත ජන සමාජයේ විවිධ ගැටළු ගණනාවක් නිර්මාණය කළේය. මේ ගමනා ගමනයට බලපෑවේ ඉතාමත් අහිතකර අන්දමිනි. බස්, දුම්රිය ගමනාගමනයට මෙය ඉතා අහිතකර අන්දමින් බලපෑවේය.

අපේ ඉලක්කය වූයේ ජනතාව" සෞභාග්‍යයෙ දැක්ම" තුළින් සුඛිත මුදිත කිරීම හා රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමයි. නමුත් සිදුවූයේ කුමක්ද ?අද වන විට බඩු මිල අහස උසට නැග තුන්වේලක් තියා අද එක වේලක්වත් ආහාර ලබා ගැනීමට ජනතාවට හැකි වේද ? යන්න පවතින ගැටළුවකි. ජනතාව පාරදිගේ පෝලිම් කරා ඇදී යන්නට වූයේ නිරායාසයෙනි. මේ තත්ත්වය අප අතීතයේ අත්විඳ ඇත්තෙමු. අප පාන් ගෙඩිය පවා ලබා ගැනීමට වරු ගණන් පෝලිම් වල සිටි බව කාගේත් සිත් සතන් වල අදටත් සනිටුවන්ව ඇතැයි යන්න ලිවිය යුතු කරුණකි.

මෙම තත්ත්වය අපේ රටේ අධ්‍යාපනයට බලපෑම ඉතාමත් දැඩි ලෙස පාසල් හා වෙනත් අධ්‍යාපන ආයතන වල ට දොරගුළු තබන්නට සිදු විය. පාසලක් වැසීම සිරගෙවල් දහසක් නිර්මාණය කරන්නට හැකි වේ. යන්න අප අතර පවතින කියමනකි. මෙම තත්ත්වයේ ප්‍රතිඵලය භුක්ති විදීමට සිදු වන්නේ අද හෙට නොවේ. පාසල් දරුවන් නිවෙස් වලට කොටු වීම තුළ ඔවුන්ගේ මානසික මට්ටම ගැන අවධානය කළ යුතු කරුණකි. මාර්ගගත ක්‍රමයට

අධ්‍යාපනය ලැබූ අපේ දරුවන් අන්තර්ජාලය තුළ විවිධ අත්දැකීම් ලබා ගත්තේය. හුදෙකලාව සිදුකරන මෙම අධ්‍යාපන ක්‍රමය තුළ ළමා මනසෙහි ක්‍රියාකාරීත්වය ගැන අප දෙවරක් සිතා බැලිය යුතුය.

මිනිස් ජීවිත වලට එල්ලවන ප්‍රහාරයට අභියෝග වශයෙන් දේශපාලන හා සෞඛ්‍ය අංශ ජනතාවට ලබා දුන් එන්නත්කරණය අප ඉතාමත් ප්‍රශංසනීය ලෙස අගය කල යුතුය. මේ තත්ත්වය යම් තරමක් සැනසිලිදායක තත්ත්වයක් නිර්මාණය වී ඇතැයි සිතිය හැකිය. නමුත් කිව යුත්තේ අවදානම පහව ගොස් නොමැති බවයි. තත්ත්වය හොඳින් බලා තමන් ආරක්ෂාකාරී ලෙස ක්‍රියා කළ හොත් මෙම අභියෝග අපට යම් තරමකට පාලනය කළ හැක. එසේ නොහැකි වූ විට යළිත් කොයි මොහොතක හෝ මෙම තත්ත්වය යළි මතු නොවේ කියා කිව හැක්කේ කාටද?

නමුත් මේ වන විට ජනතාව තමන්ගේ විවිධ ගැටලු පාදක කරගෙන උද්ඝෝෂණ රැල්ලක් අරඹා ඇත. ගොවි හා ගුරු යන පංච මහා බලවේගයේ කොටස්කරුවන් ඔවුන් තමන්ගේ ඉල්ලීම් සඳහා සටන් වදිති. අයිතීන් දිනාගත යුතුය. එය ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයකි. නමුත් සෞඛ්‍යය නීති රීති වලට අනුකූලව ඒවා පැවැත්වීම සිදු කළ යුතු බව අප යළිත් සිහිපත් කළ යුතුය. වර්තමානය වන විට සංවරණ සීමා ක්‍රමයෙන් ඉවත් කරමින් සිටින්නේ කඩා වැටුන ආර්ථිකයට පිළියමක් වශයෙනි. ජනතාව මෙම තත්ත්වය මනා ලෙස අවබෝධ කරගත යුතුය.

1948 අධිරාජ්‍යවාදීන්ගෙන් අප රට නිදහස ලබා දශක හතරක කාලයක් අප ගෙවා අවසන්ව ඇත. තුන්වැනි ලෝකයේ රටවල් ලෙස අප සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස අදටත් හඳුන්වා ඇත. තත්ත්වය එය නොවේ. අපට අද වන විට බංගලාදේශයෙන් පවා ණය ලබා ගැනීමට සිදුව ඇත. අතීතයේ බංග්ලාදේශය නිතර නිතර ගංවතුරට මුහුණ දෙන රටවල් අතර සිටියේය. අද ඔවුන් තත්ත්වය සමනය කර ලෝකයේ දියුණු රටවල් අතර කැපී පෙනෙන රටක් ලෙස ගොඩනැගී ඇත. නිදහසින් පසු බලයට පත්වූ සෑම රටක්ම අපේ රටේ සංවර්ධනය උදෙසා විවිධ සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන්නට විය. පස් අවුරුදු, දස අවුරුදු සැලසුම් ඉදිරිපත් කළේය. එය ජාතික ප්‍රතිපත්තියක් ලෙස සකස් කරමින් කුමන රාජ්‍යයක් බිහි වුවද එය ඉදිරියට ගලා ආ යුතුය. ලංකාවේ සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක වන්නේ නම් විශාල වශයෙන් විදේශ රටවලට ගලා යන විදේශ විනිමය අපට ඉතිරි කර ගැනීමට හැකිවනු ඇත. අප රට වටා මහ මුහුදය අපට වටිනා සම්පතකි. නමුත් දිනකට" මාළු කැල්ල "රස බැලීමට හැකි වන්නේ අපේ රටේ ජනතාවගෙන් කීයෙන් කී දෙනකුට ද යන්න සිතා බැලිය යුතු කරුණකි. දේශගුණික හා කාලගුණික තත්වයද සංවර්ධනයට හිතකර අයුරින් නිර්මාණය වී තිබීම ජාතියේ ම වාසනාවකි. එසේ නම් අපට සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට නොහැකි වූයේ මන්ද ? යන්න සිතා බැලීමට කාලය එළැඹ ඇත. ලෝකයේ නොදියුණු රටවල් දියුණු වූයේ ජාතික ප්‍රතිපත්තියක් තිබීමත්, සුදුස්සාට නිසිතැන ලබාදීමත් නිසාය. එසේම ඔවුන් බලධාරීන් සමඟ උරෙන් උර ගැටී වැඩ කරන නිසාය. මේ ගුණාංග අපේ රටේ සංවර්ධනයට ලඟාකර නොගැනීම අප කාගේත් අභාග්‍යයට හේතුවක් බව පෙන්වා දිය යුතුය.

දේශපාලන වශයෙන් පිල් බෙදීමක්, ජනතාවගේ ප්‍රශ්න එකතැන රඳා පැවතීමක් නිසා සංවර්ධන ගමන්මග අභියෝග හා බාධක රාශියකට මුහුණ පා ඇත. පවතින කොවිඩ් වසංගතය හමුවේ වාද භේද පසෙකලා එකාමෙන් නැගී සිටිය යුතු කාලය එළඹ ඇත. එවිට සංවර්ධනය කරා යන්තමින් හෝ ගමන් කළ හැකි වනු ඇත.

දියුණු රටවල සංවර්ධනය සඳහා මිනිස් ශ්‍රමය මෙන්ම යන්ත්‍ර උපකරණ භාවිතය ද අඩු වැඩි වශයෙන් යොදා ගනිති. අපේ රටේ ද සංවර්ධනය සඳහා නවීන තාක්ෂණය සමග මිනිස් ශ්‍රමය ද කාලානුරූපීව යොදාගැනීම වේගවත්ව සිදු කළ යුතුය. පවතින ගොවි ගැටලු මනා ලෙස කළමනාකරණය කරමින් කටයුතු කළහොත් අපි බලාපොරොත්තු වන සෞභාග්‍යයේ දැක්ම කරා යන්තමින් හෝ පියනැගීමට හැකිවනු ඇතැයි යන්න විශ්වාස කළ හැකිය.

# ග්‍රාම සංවර්ධනයේ ගමන් මග.

*ඩබ්.ඩී. නිහාල් වීරසූරිය*

ග්‍රාම සංවර්ධනය යන්න මතු පිටින් බලන කල ගම සංවර්ධනය කිරීම යන සරල අර්ථයට වඩා පුළුල් ගැඹුරු අර්ථයක් ගෙන දෙන බව තේරුම් ගැනීම වඩා යෝග්‍යය. ග්‍රාම සංවර්ධන සංකල්පය විවිධ ආකාරයෙන් විග්‍රහ කරන අතර එය කාලීනව විවිධ වෙනස්කම් වලට බඳුන්වන ස්වභාවයක් ගනී. ගමේ සෞභාග්‍යමත් බව හා සමෘද්ධිය ඇති කිරීම ග්‍රාම සංවර්ධනයේ අරුත ලෙස වටහා ගත හැකිය. එසේම එය පෞද්ගලිකත්වයට වඩා පොදු බව මුල් කොටගත් සංකල්පයක් වන හෙයින් ඇතැම් විට භෞතික අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බවක් පෙනේ. එසේම එය කාලීන ව වෙනස්වන සංවර්ධන සංකල්පයක් බවට පත්ව ඇත. 'ග්‍රාම සංවර්ධනය' යන්න වඩාත් පුළුල් අරුතින් ග්‍රාමීය සංවර්ධනය ලෙස අප වහරනු ලබන්නේ එබැවිනි. හුදෙක් ගම සංවර්ධනය කිරිම යන අරුතට වඩා ග්‍රාමීය ක්ෂේත්‍රයේ සංවර්ධනය යන්න ඉන් අර්ථවත් වේ.

**ග්‍රාම සංවර්ධනය හා ගැමි සමාජය.**

පැරණි සම්ප්‍රදායික ගම්බද සමාජ ක්‍රමය රඳා පවතිනුයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපායක් වූ කෘෂිකර්මාන්තය මතය. මෙම සමාජ ක්‍රමයේ පදනම වූයේ සාමූහික වගකීමෙන් යුතුව ගැමියන් කටයුතු කිරීමය. කෘෂිකාර්මික කටයුතුවලදී ජලය යොදා ගැනීම, ජලය හිඟ කාලයට වගා කටයුතු සීමාකිරීම, අස්වැන්න බෙදාගැනීම, තට්ටු මාරු හා කර මාරු වැනි සංකීර්ණ භුක්ති ක්‍රම, ශ්‍රමය යොදා ගැනීම කයිය වැනි කටයුතු මෙම සමාජ ක්‍රමය තුළ දැකගන්නට හැකිවිය. පුද්ගලික ඔප්පු තිරප්පු අනුව ගමේ ඉඩම් බෙදීයාම, තනි අයිතිය නීතියෙන් පිළිගැනීම, පැරණි පංගු ක්‍රමය අහෝසි වී ගමේ ඉඩම්වල පොදු අයිතිය මැකීයාම, සාමූහික සම්මුතිය අනුව ගනු ලබන තීරණ වෙනුවට රජයේ හෝ උසාවියෙන් දෙනු ලබන තීන්දු තීරණ පිළිගැනීම වැනි ලක්ෂණ බ්‍රිතාන්‍ය යුගයේ මැද භාගයේ සිට සාමූහික ගැමි සමාජ ක්‍රමය සීඝ්‍රයෙන් බිඳ වැටීමට හේතු විය. මෙම පාලන කාලය තුළ රටේ පාලනය පළාත් නවයකට බෙදා දිසාපතිවරයෙකුට පැවරිනි. පරිපාලන කටයුතු මෙන්ම වාරිමාර්ග, අධ්‍යාපන, සමාජසේවා, සෞඛ්‍ය ආදී සෑම අංශයක ම වගකීම් පවරනු ලැබුව ද වැඩිම කාලයක් හා මුදල් වැයකරන ලද්දේ වානිජ කෘෂිකර්මාන්තයට හා එයට අවශ්‍ය අනිකුත් සේවාවන් සැපයීමට ය.

**ග්‍රාම සංවර්ධනය සඳහා රජයේ මැදිහත්වීම.**

30 දශකයේ ආරම්භයේ මෙරට ඇති වූ ආර්ථික පරිහානියත්, මැලේරියා වසංගතයත් හේතුකොට ගෙන ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය බිඳ වැටිනි. ඊට මුහුණදීම සඳහා දිවයිනේ බොහෝ ප්‍රදේශවල ස්වේච්ඡා සංවිධාන බිහිවීමත් සමඟ ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධනය පිළිබඳ රජයේ අවධානය යොමු වූ අතර එයට බලපෑ මූලික හේතු කිහිපයකි.

- 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ සමඟ ඡන්ද බලය ලැබීම.
- ගම්බද පළාත් කෙරෙහි විවිධ සේවා සපයන අමාත්‍යාංශවල වගකීම වැඩිවීම.

ඒ අනුව එවකට පැවති වානිජ හා කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ග්‍රාම සංවර්ධනය සඳහා වෙනම අංශයක් ආරම්භ කර තෝරාගත් ගම් කිහිපයක ගැමිසේවා මධ්‍යස්ථාන ආරම්භ කරන ලදී. මෙම ගැමිසේවා මධ්‍යස්ථානවල සේවයට ග්‍රාම සංවර්ධන හා සංඛ්‍යාලේඛන නිලධාරි නමින් නිලධාරීන් පිරිසක් යොදවන ලදී. ගැමිසේවා මධ්‍යස්ථාන වලින් සිදුකරන ලද සේවයේ වැදගත්කම නිසා 1948 වර්ෂයේ දී වානිජ හා කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදී.

**ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය.**

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ග්‍රාම සංවර්ධන සමිති සංවිධානය කිරීම තුළ ගමේ දියුණුව සඳහා ජනතාව මුල්විය යුතු බව හා පෞද්ගලිකත්වය වෙනුවට ස්වෝත්සාහය හා පරෝපකාරය මුල්කොටගත් ජන සමාජයක් ගොඩ නැංවීම අපේක්ෂා කෙරින. ඒ අනුව ග්‍රාම සංවර්ධන සමිති මගින් ආර්ථික වශයෙන් කෘෂි හා ගෘහ කර්මාන්ත කටයුතු වල ද, සෞඛ්‍ය වශයෙන් පාරිසරික පිරිසිදුකම බෝවන රෝග වලක්වා ගැනීම මාතෘ දාරකාභිවෘද්ධි කටයුතු වල ද, සාමාජීය වශයෙන් ආගමික, සංස්කෘතික, අධ්‍යාපන, අපරාධ මර්ධන කටයුතු වලද නිරත විය. ගැමියන් ස්වෝත්සාහයෙන් කරගෙන යන කටයුතු වලදී කාර්මිකව ඔවුනට කල නොහැකි වැඩ කොටස් සඳහා සහාය ලබාදිය යුතු බව පිළිගත් රජය ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කරන ලදී. මේ යටතේ පාරවල්, ග්‍රාමීය රෝහල්, පාසල් ගොඩනැගිලි, සුළු පරිමාණ, කර්මාන්තශාලා, වැසිකිලි, ළිං ඉදිවිය. මේ සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, ඉඩම්, පරිත්‍යාග කර ලබා දී ඇත්තේ ගම්මුන් විසිනි. මහජන උපයෝගිතා වැඩ නමින් සිදුකල මේ කටයුතු සඳහා රජය වැයකල මුදල් වටිනාකමට වඩා කිහිප ගුණයකින් නිමි වටිනාකම වැඩිවිය. ශ්‍රී ලංකාවේ ගැමි සමාජය තුළ ඔවුනට හුරු පුරුදු උරුම වූ ආත්මෝපකාරය, පරෝපකාරය, ස්වොත්සාහය, සාමූහිකත්වය වැනි සංකල්ප ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රධාන තේමාවක් වීම නිසා ගැමියන් පිබිදීමකින්, කැපවීමකින් කටයුතු කරන්නට ඇත. ග්‍රාම සංවර්ධන කටයුතු නිසි ප්‍රතිඵල අත්කර ගැනීමේ අරමුණින් දෙපාර්තමේන්තුව මගින් නිලධාරීන්ට මෙන්ම ග්‍රාමීය නායකින් සඳහා පුහුණු කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානය පේරාදෙණියේ ද ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන නාලන්ද, මැදවච්චිය, නිකවැරටිය, බිඳුනුවැව, මාදම්පේ, දික්වැල්ල, පුස්සැල්ල, අච්චුවේලි, කල්ලඩි යන ස්ථානවල ද ආරම්භ කරන ලදී. දෙපාර්තමේන්තුව පිහිටුවා දස වසරක් සපිරන විට ගැමි නායකයින් 57272 කට පුහුණුව ලබා දී ඇති බව වාර්තා වේ.

**ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාර පිළිබඳ ඇගයීම.**

1962 දී එක්සත් ජාතීන්ගේ මණ්ඩලය විසින් ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ සිදුකරන ලද අධ්‍යයන වාර්තාවට අනුව,

- ගම්ම මට්ටමේ තව තවත් ස්වේච්ඡා සංවිධාන පිහිටුවිය යුතු බව.
- ග්‍රාම සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීමේ දී ගම සජීවී ඒකකයක් ලෙස සැලකිය යුතු බව.
- ගැමි නායකයන් පුහුණු කිරීමේ කටයුතු පුහුණු විෂය මාලාව පුළුල් විය යුතු බව.
- ස්වොත්සාහී පදනමින් කරන කටයුතු සඳහා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පටිපාටිය අනෙකුත් දෙපාර්තමේන්තු විසින් අනුගමනය කළ යුතු බව.
- ගම් මට්ටමේ සමිති ප්‍රාදේශීය බල මණ්ඩල තුළට ගත යුතු බව ද ඉදිරිපත් කරන ලද වැදගත් නිර්දේශ කිහිපයකි.

70 දශකය ග්‍රාම සංවර්ධන ක්ෂේත්‍රයට සුවිශේෂි දශකයකි. 1973 වර්ෂයේ දී ග්‍රාම සංවර්ධන සමිති ප්‍රතිසංවිධානය කර,

- සෑම ගමක් පාසාම ග්‍රාම සංවර්ධන සමිතිය බැගින් පිහිටුවීම.
- යටිතල පහසුකම් හා පොදු පහසුකම් ඇති කිරීම සඳහා මහජන උපයෝගීතා වැඩ යටතේ මුදල් ලබාදීම.
- ලෝක ආහාර වැඩ පිළිවෙල යටතේ ග්‍රාමීය වැව් හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.
- සූක්ෂම සංවර්ධන ගම්මාන වැඩපිළිවෙල ආරම්භ කිරීම.
- ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන මගින් ග්‍රාමීය නායකයින් පුහුණු කිරීම.

යන වැඩ කොටස් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ඉටුකළ වැඩ කටයුතු අතර ප්‍රධාන වේ.

**ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය.**

1978 ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයට සුවිශේෂී වර්ෂයක් විය. 1978 දී ග්‍රාම සංවර්ධන විෂය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීමත් සමඟ ග්‍රාම සංවර්ධනය උදෙසා මෙතෙක් කරගෙන ආ කටයුතු වලට රජයේ මෙහෙය වීම හා ඍජු මැදිහත්වීම තව තවත් වර්ධනය වූ ස්වභාවයක් පෙනී ගියේ ය.

ග්‍රාම සංවර්ධන නූතන යුගය ආරම්භයේ සිට 1977 දක්වා කාලය ග්‍රාම සංවර්ධන කටයුතු සමාලෝචනයට භාජනය කිරීමේ දී පැහැදිලි වන්නේ රජයේ අනුගහය යටතේ ග්‍රාම සංවර්ධන සමිති සංවිධානය කිරීමත් එමගින් කෙරුණු සංවර්ධන කටයුතු රජයේ නියෝගයන්ට අනුව රජයෙන් සැපයුනු මූල්‍ය ආධාර යටතේ කෙරුණු බවත් ය. මෙම රාජ්‍ය නියෝගයන් ක්‍රියාත්මක කිරීමෙහිලා ග්‍රාම සංවර්ධන නිලධාරීන් බොහෝ දුරට කටයුතු කළේ අනිකුත් රාජ්‍ය නිලධාරින් කටයුතු කරන ආකාරයට ය.

**කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩපිළිවෙල.**

ග්‍රාම සංවර්ධනය උදෙසා විවිධ සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කළ ද ග්‍රාමීය දිළිඳුකම වර්ධනය වීම පිළිබඳ ශ්‍රී ලංකාව මෙන්ම යටත් විජිත පාලනයෙන් නිදහස ලැබූ සෑම ආසියානු රටකම පොදු අත්දැකීමක් විය. 70 දශකයේ අගභාගය වන විට ඒ ඒ රජයනුත්, රාජ්‍ය නොවන සංවිධානත්, විශේෂයෙන් සමාජ විද්‍යාඥයනුත් ග්‍රාමීය දිළිඳුකම ප්‍රශ්නයට විකල්ප විසඳුමක් සෙවීමේ විවිධ අත්හදා බැලීමේ පර්යේෂණ කටයුතුවල නිතර විය. ශ්‍රී ලංකාව ද මෙවැනි අත්හදා බැලීමෙන් 1978 ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ මූලිකත්වයෙන් සිදුවිය. සම්ප්‍රදායික සංවර්ධන වැඩපිළිවෙලට විකල්පයක් ලෙස ආරම්භ වූ මෙම කාර්ය බද්ධ පුහුණු හා පර්යේෂණ වැඩපිළිවෙල විපර්යකාරක වැඩසටහන නමින් හඳුන්වන අතර එයට පාදක වූ සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේද මුළු රටට ම නව සංවර්ධන අත්දැකීමක් එක් කිරීමට සමත් විය.

**ග්‍රාම සංවර්ධනය විමධ්‍යගත කිරීම.**

ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය ආරම්භ කර දස වසරක් ගෙවීයත් ම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ ග්‍රාම සංවර්ධන විෂය මුළුමනින් ම පළාත් සභා විෂය පථයට පැවරිනි. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව අහෝසි වූ අතර එක් එක් පළාතට අනුරූපිත ලෙස ග්‍රාම සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ හැකියාව පළාත් සභාව වෙත ලැබීම මෙහි ප්‍රතිඵලයකි.

(ග්‍රාම සංවර්ධන නිළධාරින් සඳහා පැවැත් වූ වැඩමුළුවක් වෙනුවෙන් සකසන ලද ලිපියක් ඇසුරිනි.

# සමාජ වගවීම හඳුනා ගැනීමේ වැදගත්කම.

ඩී.ඒ.පී. දාස්වත්ත

සමාජ වගවීම යනු කුමක්ද යන්න නිවැරදි ලෙස හඳුනා ගැනීම වර්තමාන සමාජ අවශ්‍යතාවයක් යැයි සිතමි. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම පවතින සෑම රාජ්‍යයක් තුළ මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන්ට අනුකූලව ගොඩනැගුණ සංවිධානයන් තුළ දක්නට ලැබෙන විශිෂ්ට ගුණාංගයක් ලෙස සමාජ වගවීම දක්වන්නට පුළුවන. සමාජ වගවීම යන්නෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ බලධාරීන් විසින් එනම් දේශපාලන නායකයින්, රාජ්‍ය නිලධාරීන් සිවිල් සංවිධාන නායකයින් තමන් විසින් ගනු ලබන තීරණ සහ ක්‍රියාකාරකම් වල වගකීම ද භාර ගැනීමට බලධාරීන් නිලධාරීන් හා ආයතන බැඳී සිටීමයි .

රාජ්‍ය පරිපාලනයට හා සංවර්ධන ක්‍රියාදාමයට ප්‍රජාවගේ සහභාගිත්වය වැඩිවත්ම බලධාරීන්ගේ වගවීම් ස්වභාවය වර්ධනය වී ඇත. ඒ අනුව බලන විට සමාජ වගවීම යන්න බොහෝ දුරට ප්‍රජාම මැදිහත්වීම මත (civil Engagement) ගොඩනැගෙන ක්‍රමවේදයක් නැතිනම් යහපාලන ප්‍රවේශයක් ලෙසද දක්වන්නට පුළුවන්.

**වගවීම සහ යහපාලනය.**

1999 පිලිපීනයේ පැවති පාලනය ( Governance) පිළිබඳ වැඩමුළුවේදී යහපාලනය පිළිබඳ දී ඇති නිර්වචනය මෙහිදී සඳහන් කිරීම ප්‍රයෝජනවත් වේ යැයි සිතමි.

යහපාලනය යනු විනිවිදභාවය, වගවීම, සාධාරණ හා යුක්ති ගරුක බව ප්‍රජාතන්ත්‍රවාදී සහ මහජන අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම යන ගුණාංගයන්ගෙන්යුත් පාලන ක්‍රමයකි. ඒ අනුව බලන විට වගවීම යන්න යහපාලන ක්‍රමයක සුවිශේෂී ලක්ෂණයක් බව පැහැදිලිය.

**වගවීම සහ සිවිල් සමාජය.**

යම් ආයතනයක් හෝ නිලධාරි පැලැන්තියක් තුළ වගවීමේ ක්‍රියාවලිය ස්ථාපිත කිරීමට නම් නීතිරීති මෙන්ම ශක්තිමත් සිවිල් සමාජයක බලපෑම අවශ්‍යය. දේශපාලඥයන් රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන් විසින් ගනු ලබන තීරණ සහ ඒවායේ ප්‍රතිඵල භුක්ති විඳින්නට සිදුවන්නේ ඒවායේ බලපෑමට ගොදුරුවන්නේ මහජනතාවයි. ඒ නිසා එම ආයතන හා බලධාරීන් විසින් නිවැරදි තීරණ ගැනීම සහ ගනු ලබන තීරණ ප්‍රජාවට යහපත් බලපෑමක් ඇතිවන පරිදි ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම අවශ්‍යයි. ඔවුන් ඒ සඳහා වගවන ප්‍රමාණය බොහෝ විට තීරණය වන්නේ සිවිල් සමාජය හරහා එන තෙරපීම මතය.

**වගවීම අවශ්‍ය ඇයි ?**

සමාජ වගවීම පිළිබඳ සංකල්පය හුදකලාව ගෙන අර්ථකථනයක් දීම අපහසුයි. ඒ හා බැඳුනු තවත් යහ පාලන ගුණාග රාශියක් ඇති බැවිණි. රාජ්‍ය පරිපාලන හා සංවර්ධන ක්‍රියාදාමය තුළ ප්‍රජා සහභාගිත්වය වැඩිවන විට නිලධාරීන්ගේ වගවීමේ ස්වරූපය වර්ධනය වන අතර ඔවුනගේ කාර්ය සාධනයේද ගුණාත්මක වර්ධනයක් සහ එම කටයුතුවල විනිවිදභාවයක් ඇති වීමද අනිවාර්ය ලක්ෂණයකි නීති රීති හා ආයතනික පටිපාටි ඇතුළත

ක්‍රියාකරන්නටද මහජන අවශ්‍යතා සඳහා නිශ්චිත කාලසීමාවක් තුළ කඩිනමින් ප්‍රතිචාර දැක්වීමටද , ජාති කුලභේද නොසලකා සියලු දෙනාටම සමව සැළකීමටද ඔවුනට සිදු වේ. ඒ අනුව බලන විට සමාජ වගවීම සංකල්පය සමග පාලනයේ කාර්යක්ෂමතාවය සංවර්ධන කටයුතුවල ඵලදායිතාවය ඉහළ යාම සිදු වේ.

සමාජ වගවීම හා බැඳුනු අනෙකුත් යහපාලන ගුණාංග ලෙස ,

| | |
|---|---|
| ප්‍රජා සහභාගිත්වය | Participation |
| නීතියේ පාලනය | Rule of Law |
| විනිවිදභාවය | Transparency |
| සමාජ සාධාරණත්වය | Justice and fair |
| සියලු දෙනාටම සමව සැලකීම | Equity and Inclusiveness |
| ප්‍රතිචාරාත්මක බව | Responsiveness |

හඳුන්වාදිය හැකිය. ඉහත දැක්වූ ගුණාංග අනුව කටයුතු කරන විට සංවිධානය/ ආයතනය නියම මාර්ගයේ යන බව තහවුරු වේ. සාමාජිකයින්ගේ උනන්දුව හා වගකීම් ඉටු කිරීමට ඇති කැමැත්ත අඛණ්ඩව පවතී. විවෘත සාකච්ඡා තුළින් වැරදි නිවැරදි කර ගැනීමටත් අත්දැකීම් තුළින් පාඩම් ඉගෙන ගැනීමටත් අවකාශ සැලසේ. සාමාජිකත්වය තුළ මෙන්ම සංවිධාන අතරද එකමුතුභාවය සහයෝගිතාවය වර්ධනය වේ. සාමූහික උත්සාහය තුළින් ආර්ථික හා සාමාජීය වශයෙන් තිරසාර දියුණුවක් ඇති කර ගැනීමට හැකිවේය යන ආත්ම විශ්වාසය ගොඩනැගේ.

# ග්‍රාමීය දරිද්‍රතාව තුරන්කිරීම සඳහා "යහපාලනය" උපක්‍රමික ප්‍රවේශයක් ද?

ඒ.එම්.එස් අතපත්තු

මේ පිළිබඳ මාගේ විග්‍රහය ඉදිරිපත් කිරීමට පෙර ඒ සඳහා සංකල්ප රාමුවක් ගොඩනැගිය යුතු බව මාගේ පිළිගැනීමයි. එහිදී "ගම" හෝ ඒ හා බැඳුණු ග්‍රාමීය ,"දරිද්‍රතාව" හෝ දිළිඳුකම සහ "යහපාලනය" යන ත්‍රිත්වයේ ඒකාබද්ධතාව ගොඩනැගීමට අදහස් කරමි.

ගම/ ග්‍රාමීය පිළිබඳ විවිධ අර්ථ නිරූපණ ඉදිරිපත් කර ඇති අතර ඒ අතරින් අපට දැනෙන අර්ථකතනයක් දෙස බලමු ."ගම වශයෙන් හඳුන්වනු ලබන්නේ, කිසියම් භූගෝලීය සීමාවන්ගෙන් වෙන්වුණු, කිසියම් ජන කණ්ඩායමක් වෙසෙන, එක්තරා නමකින් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශයකි. සාපේක්ෂව බලන කළ ගම කුඩා භූගෝලීය ප්‍රදේශයකි. නගරයට සාපේක්ෂව අඩු ජන ඝණත්වයක් ගමක් තුළ පවතියි. රජයේ හෝ පාලනයේ පහසුව සඳහා ගම් වල සීමා වෙන්කර තිබුනත් සාම්ප්‍රදායිකව කුඩා භූගෝලීය ප්‍රදේශ වල ජීවත්වන ජන සමූහය තුළින් ගම හඳුන්වා දීමේදි එවැනි භූගෝලීය සීමාවන් සැලකිල්ලට ගෙන නැත. ශ්‍රී ලංකාවේ ගම ලෙස සැලැකෙන ප්‍රදේශය ප්‍රමාණයෙන් මෙන්ම ජන සංඛ්‍යාවෙන්ද අඩු අගයක් ගනී (Obesekara,1967). මීට අමතරව ජාත්‍යන්තර විග්‍රයක් ලෙස මේ කෙරෙහිද අවධානය යොමු කරනු මැනැවි. "ගම යනු නගරයට වඩා කුඩා වුත් ගොඩමණ්ඩියට වඩා විශාල වුත් නිවාස සමූහයක් ඇති ප්‍රදේශයකි(Oxford Dictionary, 2008). ඉහත අදහස් දෙක තුළින්ම සම අදහසක් ගොඩනගා ගැනීමට හැකි වුවත් තව දුරටත් ගම යන්නෙහි යථා ස්වරූපය තුළ භෞතික හා සාමාජීය විවරණයක් ඔබට ඔබට තිබිය හැකිය.

මීළඟට දිළිඳුකම නැතහොත් දරිද්‍රතාව යන්න විවරණය කිරීමට හා එහි මානයන් පිළිබඳ සොයා බැලීමට උත්සාහ ගනිමු. එහිදි විවිධ පුද්ගලයින් විසින් විවිධ අර්ථකථන ඉදිරිපත් කර ඇති බවක් දක්නට ඇති අතර, ඒවා දරිද්‍රතාව හඳුනා ගැනීම හා මැනීම සඳහා භාවිත කළ විවිධ නිර්ණායක මත ගොඩනැගුණ ඒවා බව මාගේ විශ්වාසයයි. සමාජය තුළ කාර්යක්ෂම සහභාගිත්වයට ඇති නොහැකියාව නැතහොත් අසමත්වීම, මූලික අවශ්‍යතා සපුරා ගැනීමේදී හා වැය කිරීමට ඇති සම්පත්වල හිඟකම දරිද්‍රතාව ලෙසත්, දරිද්‍රතාව යනු මූල්‍ය සම්පත් මඟින් තීරණය කරන යම් පාරිභෝජන මට්ටමක් හෝ සහභාගිත්වයේ හිඟකම පිළිබඳ තත්ත්වය නොව, මූලික අවශ්‍යතාවල සාපේක්ෂ බවට වඩා පුළුල් බවක් දරිද්‍රතාව තුළින් විස්තර කර ඇත(Veit-Wilson, 2004).

දරිද්‍රතාව යනු මූලින අවශ්‍යතා ඉටු නොවන වටපිටාවක්, සම්පත් කළමනාකරණයට ඇති නොහැකියාවය, අඩු අධ්‍යාපනය, දුර්වල සෞඛ්‍ය තත්ත්වය, මන්දපෝෂණය, නිවාස හිඟකම, දුර්වල පානීය ජල සැපයුම සහ සනීපාරක්ෂාව, ප්‍රචණ්ඩත්වයට හා අපරාධවලට ගොදුරුවීම සහ අඩු දේශපාලන නිදහස ආදී බහුමාන ප්‍රපංචයක් බව ප්‍රකාශ කර ඇත(Deepa Narayan, 2000).

එසේම Grosh සහ Glewe(2000) වැනි විද්වතුන් මූල්‍ය ප්‍රවේශය ඔස්සේ දරිද්‍රතාව හඳුනා ගැනීම හා විග්‍රහ කිරීමටත්, මූල්‍ය ආදායම හෝ පාරිභෝජනයේ හිඟකම නැතහොත් අවම මූල්‍ය ආදායමේ හිඟකම, දරිද්‍රතාව ලෙස

අර්ථ ගැන්වීමටත් උත්සාහ ගෙන ඇත. දරිද්‍රතාව, මූලික අවශ්‍යතා ඉටු නොවන තත්ත්වයක් හෝ කඩවීමක් තුළින් ඇතිවන තත්ත්වයක් බව පෙන්වා දෙන අතර දරිද්‍රතාව තුරන් කිරීමේදී මිනිසුන්ගේ මානසික ආකල්ප අගය කිරීම වඩා සුදුසු බව පවසති. එහෙයින් දරිද්‍රතාවේ අවදානම් බව හා දිළිඳුවීමට බලපාන හේතු හඳුනාගැනීමේ සාකච්ඡා සඳහා දිළිඳු ප්‍රජාවගේ පූර්ණ දායකත්වය හා සහභාගිත්වය අවශ්‍ය වන බව පවසයි(Robert Chembers, 1994). දිළඳු ප්‍රජාවගේ සහභාගිත්වය, තීරණ ගැනීම හා බලසතුවීම අතර සම්බන්ධතාවක් පවතින බවත්, ඔවුන් සඳහා ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව හා ඉගෙනීමේ පරිනත බව සමඟ සම්බන්ධතාවක් පවතී (Cornwall, 2000). මේ අනුව ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ මූලික අවශ්‍යතා ඉටුවීම හා දරිද්‍රතාව අතර ඍජු සම්බන්ධතාවක් පවතින බව සනාථ වේ.

දරිද්‍රතාව විග්‍රහ කිරීම හා මැනීම සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන විවිධ නිර්ණායක භාවිත කරන මුත්, මූල්‍ය නොවන ප්‍රවේශයට ඇතුළත් වන මූලික හැකියා ප්‍රවේශය දරිද්‍රතාව විග්‍රහ කිරීම හා මැනීම සඳහා භාවිත කර ඇත(අමාත්‍ය සෙන්, 1981). එහිදී මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි තත්ත්වය දරිද්‍රතාව ලෙස විග්‍රහ කරති. මෙම අර්ථ දැක්වීමට අනුව අවකාශීය වශයෙන් පවතින හිඟකම නැතහොත් මූලික හැකිභාවන් පිළිගත හැකි අවම මට්ටමටවත් ලඟාවීමට අපොහොසත්වීම දරිද්‍රතාව නම් වේ. මෙහිදී මිනිසුන්ගේ යහපත් ජීවන පැවත්ම තහවුරු කිරීමට හේතු වන මූලික අවශ්‍යතා සලකා බලන අවම මට්ටමට වඩා ඉහළ නංවාගැනිමට අවශ්‍ය ඉතා වැදගත් කටයුතු කිරීමට ඇති හැකියාව මූලික හැකියාව ලෙස දක්වයි.

දරිද්‍රතාව නැතහොත් දිළිඳුකම ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශය තුළ පවතින ප්‍රධාන ගැටළුවකි. ජනගහනයෙන් බහුතරයක් ග්‍රාමීය ප්‍රදේශ තුළ ජීවත්වන අතර, ඉතා සීඝ්‍රයෙන් ගම නාගරීකරණයට ලක්වීමේ ප්‍රතිඵලයන් වශයෙන් විවිධ සමාජ ආර්ථික ගැටළු නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 25% කට අධික ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවෙන් පහළ මට්ටමේ ජීවත් වෙති. දිළිඳු ජනගහනයෙන් 4/5 ක් පමණ ගම තුළ ජීවත්වන අතර, එකී ජනගහනයෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් සුළු පරිමාණ ගොවියන් වෙති. මධ්‍යම, ඌව, සබරගමුව හා දකුණු පළාත් තුළ දිළිඳු ජනයා ප්‍රධාන වශයෙන් කේන්ද්‍ර ගත වී සිටින අතර, එම පළාත් තුළ කෘෂි අංශයේ වර්ධනය පහළ මට්ටමක පවතී. කෘෂි නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයකට සුළු පරිමාණ ගොවියන්ගේ දායකත්වය ලැබේ. සාර්ව මට්ටමින් හා ක්ෂුද්‍ර මට්ටමින් සිදුවන නොසැළකිලිමත් බව හා දූර්වල ආර්ථික කළමනාකරණය ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය දූර්වල කිරීමට හේතු වී ඇත. දූර්වල මූල්‍ය සේවාවන් හා යල් පැන ගිය හෝ සීමා සහිත තාක්ෂණය භාවිතය අඩු ආයෝජනයට හේතු වේ. ඉඩම් කැබලි වීම, පසු අස්වනු හානි ඉහළ මට්ටමක පැවතීම, අසංස්ථිතික මිල ගණන් පැවතීම, රාජ්‍ය යාන්ත්‍රණයේ පවතින නොගැළපෙන වෙළඳ ප්‍රතිපත්ති හා ලාභදායි වෙළෙඳපොළට ප්‍රවේශයට ඇති අසීරුතා යනාදිය දිළිඳු ප්‍රජාවගේ ජීවන තත්ත්වය කෙරෙහි බලපාන අනෙකුත් සාධක වේ. එසේම කාලගුණ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන නිරන්තර ගංවතුර නායයාම් වැනි තත්ත්වයන් තුළ දේපළ හානි හා වාසස්ථාන අහිමි වීම නිසා ග්‍රාමීය ප්‍රජාව නිරන්තරයෙන් පීඩාවට පත්වේ. ඒ අනුව ග්‍රාමීය දරිද්‍රතාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටළුවක් බවට පත් වී ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ( 2018) පෙන්වා දෙයි.

මී ළඟට යහපාලනය පිළිබඳ හැඳින්වීම අවශ්‍ය වන බව මාගේ පිළිගැනීමයි. මේ සඳහා විවිධ බුද්ධිමතුන්ගේ අදහස් තුළින් පොදු අදහසක් ගොඩනගා ගැනීම අත්‍යාවශ්‍ය වේ. යහ පාලනය ගැන විස්තර ඉදිරිපත් කිරීමට පෙර ඒ සඳහා පසුබිම සැකසීමට අදහස් කරමි.

**රාජ්‍ය හා පාලනය.**

වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය තුළ ප්‍රසිද්ධියට හා අවධානයට යොමුවන ප්‍රධාන සංවර්ධනය විෂය ධාරාවක් වශයෙන් යහපාලනය හැඳින්විය හැකිය. නමුත් යහපාලන සංකල්පය ප්‍රචලිත වීමට හා භාවිතයට මෙරට සමාජය තුළ පවතින සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික පද්ධතියේ බිඳවැටීම විශේෂ වශයෙන් හේතු වී ඇත. යහපාලනය පිළිබඳ විග්‍රහ කිරීමට පෙර මේ සඳහා පසුබිම් වූ කරුණු අනාවරණය හා අවශ්‍ය ආකෘතිය හා ප්‍රවේශය ගොඩනංවා ගැනීමට අවශ්‍ය වේ. එසේම යහපාලනය යන්නේ විෂය සන්ධර්භය ඉදිරිපත් කිරීමට පෙර මෙය සරල කර ගැනීමද අවශ්‍ය වේ. ඒ සඳහා පාලනය පිළිබඳ වඩා වටින්නේ යැයි හැඟී යයි.

පාලනය යන යෙදුම දේශපාලනය, පරිපාලනය, පළාත් පාලනය, ස්වයංපාලනය යනාදි විෂයානුබද්ධ යෙදුම් සමග සාර්ව මට්ටමින් භාවිතා වන අතර. ස්ව පාලනය ( ආත්ම පාලනය), ගෘහ පාලනය ආදි අපට ලංවිය හැකි මායිම් තුළ ක්ෂුද්‍ර මට්ටමෙන්ද මෙය භාවිත වේ. එසේම රටක ආණ්ඩුකරණයේදී ප්‍රජාතන්ත්‍රවාදි පාලනය, ඒකාධිපති පාලනය, සමාජවාදි පාලනය ආදි භාවිතයන් හා විග්‍රහයක් දක්නට ඇත. ප්‍රජාතන්ත්‍රවාදි පාලනය හා ඒකාධිති පාලනය පාලන ක්‍රියාවලියේ පිහිටි අන්ත දෙකක පිහිටි ව්‍යුහයන් වේ. ප්‍රජාතන්ත්‍රවාදි පාලනයේ මන්දනය හා බිඳවැටීම ඒකාධිපති පාලනයේ ත්වරණය බවත් ප්‍රජාතන්ත්‍රවාදි පාලනය පුද්ගල හෝ පුද්ගල කණ්ඩායමක අභිමතාර්ථ හා සිතුම් පැතුම් මත මෙහෙයවීම යහපාලනයේ බිඳ වැටීම බව අප රටේ විවිධ කාලවල පැවති තත්ත්වයන් ආවර්ජනය කිරීමේදී හැඟී යයි. ගෝත්‍රිකත්වය මෙහි විවිධ තත්ත්වය වර්ධනය කිරීමේදී හැඟී යයි. ගෝත්‍රිකත්වයෙන් හා ආත්මාර්තකාමිත්වයෙන් මිදී ශිෂ්ඨ ලෝකය තුළ ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රායෝගික තත්ත්වයක් හිමි වී ඇති තත්ත්වයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රායෝගික භාවිතයක් නොපැවතීම හේතුවෙන් යහපාලනය සමාජගත කිරීමට සිදු වී ඇත.

ග්‍රීක භාෂාව තුළ "Kubernao" හෙවත් " සුක්කානම ඇල්ලීම" යන යෙදුම තුළ අන්තර්ගත භූමිකාව තුළින් පාලනය විග්‍රහ කිරීමට ප්ලේටෝ විසින් පළමුව උත්සාහ කරගෙන ඇති අතර, මෙම අදහසට සමගාමීව පුළුල් අර්ථයෙන් පාලන ආකාර තුනක් විග්‍රහ කර ඇත. රජය හා පුද්ගලික අංශයේ සහභාගිත්වය සහිත මෙහෙයුම් ජාලයක් තුළින් කරන පාලනය, වෙළෙඳපොළ යාන්ත්‍රණය තුළින් රාජ්‍ය රෙගුලාසි මත ක්‍රියාත්මක පාලනය හා ධූරාවලිය අධිකාරී බලය පැවරීම තුළින් සිදු වන පාලනය එකී ත්‍රිත්ව පාලන උපක්‍රම විධික්‍රම වේ.

ලෝක බැංකුව, සමාජ ඒකකයක පවතින ගැටලු හා කාර්යයන් කළමනාකරණය සඳහා දේශපාලන අධිකාරිය මගින් ආයතන හා සම්පත් භාවිතයට ගැනීමේ ක්‍රියාවලිය පාලනය ලෙස දක්වා ඇත. එක්සත් ජාතීන්ගේ ආසියා පැසිපික් කලාපයේ ආර්ථික හා සමාජ කොමිසම විසින් " තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා එම තීරණ ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය" පාලනය ලෙස දක්වා ඇත(එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2007). කැනඩාවේ ඔටාහී පිහිටි පාලනය සඳහා වූ ආයතනය විසින් මෙය සාමූහික ක්‍රියාවලියක් බවත්, දිශානතිය හා කාර්යභාරය එහි උපාය මාර්ගික ස්වරූපය බවත් පෙන්වා දෙන අතර, පාලනය අදාළවන අවකාශ 04 ක් දක්වා ඇත. ඒවා නම් ගෝලීය අවකාශය, ජාතික අවකාශය, සංවිධාන අවකාශය සහ ප්‍රජා අවකාශය යනුවෙනි. පාලන තන්ත්‍රය විසින් අවශ්‍යතා ඉටු කිරීමේ ධාරිතාව සිවිල් සමාජ සවිබල ගැන්වීමේ ප්‍රමාණය සහ ව්‍යවසායකයින්ගේ ශක්තිය පදනම් කරගත් ආකෘතියක් තුළ ජාතික අවකාශ පාලන ගොඩ නැගෙන බව වැඩි දුරටත් විග්‍රහ කර ඇත.

පාලනය හා රජය යන්න තුළින් අර්ථ දෙකක් ගම්‍යමාන වන බවත්, රාජ්‍ය පවත්වාගෙන යාමේ යාන්ත්‍රණය පාලනය බවත් දක්නට ඇත. පාලනය යන ක්‍රියාවලිය පවුල, සමාජය, ආයතනය, සංවිධානයක් හෝ රටක් යන සෑම සන්දර්භයක් තුළම ක්‍රියාත්මක යාන්ත්‍රණයයි. ඒ අනුව පවුල, සමාජය, ආයතනය, සංවිධානය හෝ රටක් තුළ වෙසෙන පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක අරමුණු ඉටු කර ගැනීම සඳහා නිශ්චිත කාලයක් තුළ භෞතික හා මානව සම්පත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස මෙහෙයවීමේ විධික්‍රමය ලෙස සාරාංශ කළ හැකිය.

**යහපාලනය.**

පොදු ව්‍යවහාරය තුළ පාලන පිළිබඳ අර්ථ ගැන්වීමේ දී රජය සමඟ පර්යාය අදහස් අනුකලනය කිරීමට පෙළඹී ඇතිමුත්, මෙම දෙකම එක සමාන නොවන අතර එය රාජ්‍ය පාලනයට පමණක් ලඝු කිරීමට අදහස් නොකරමි. එනම් පාලනය, රටක් තුළ, ආයතනයක් තුළ, පවුල තුළ, සමාජය තුළ හෝ පුද්ගලයා තුළ භාවිතයට ගත හැකි බැවින්. ජාතික දෘෂ්ටි කෝණයක පිහිටා රජය යනු පාලනය සඳහා භාවිතා කරන උපකරණයක් හෙවත් මෙවලමක් ලෙස දක්වා ඇත(David Osborne and Gaebler). එසේම මානවයා හට මුහුණ පෑමට සිදුවන ගැටලුවක් විසඳා ගැනීම සඳහා ඇති කරගත් ආයතනක් හෝ සංවිධානයක් තුළින් එම අරමුණු ඉටු කර ගැනිම සඳහා භාවිතා කරන සම්මත චර්යාව යහපාලනය ලෙස ද විග්‍රහ වේ.

"යහපාලනය" පිළිබඳ නිශ්චිත හෝ අසම සම අර්ථ ගැන්වීමක් සිදු නොවන බවත් එය කාලයෙන් කාලයට, රටෙන් රටට, ආයතනයෙන් ආයතනයට වෙනස් වන නමුත් ඒ තුළින් අපේක්ෂා කරන තත්ත්වය මානව වර්ගයාට වඩා යහපත් වටපිටාවක් නිර්මාණය කරන බව පැහැදිලි වේ.

සිංගප්පූරුව සංවර්ධන ප්‍රයත්නය තුළ සාධනීය අරමුණු ළඟා කරගෙන ඇති අතර, යහපාලනය යනු මහජනතාවගේ යහපත උදෙසා ඵලදායී ලෙස රට පාලනය කිරීම ලෙස දක්වා ඇත. එක්සත් ජාතීන්ගේ හිටපු මහලේකම් කොෆී අනන් විසින් යහපාලනය යනු දිළිඳුකම තුරන් කර සංවර්ධනය යම් මට්ටමකට ගෙන ඒමේ ක්‍රියාවලියක් ලෙස දක්වා ඇත. එසේම Child helpline International ආයතනය යම් සංවිධානයක බලය හා අධිකාරිය බෙදා හැරීමේ හා පරිහරණය කිරීමේ ක්‍රමය හා සම්බන්ධ සිද්ධි පාලනය ලෙසත්, එකී බලය තනි පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් මත ඒකරාශී නොවන බවට තහවුරු කිරීම යහපාලනය බවත් පවසයි (Child helpline International,2017).

එක් පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක අපේක්ෂාවන්ගෙන් තොරව ආයතනයක හෝ සංවිධානයක අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීමේ ක්‍රියාවලිය යහපාලනය බව සනාථ වේ. ඒ අනුව ස්වකීය ජීවිතයේ යහපැවැත්ම සාධනය තුළින් සමාජ යහපැවැත්ම ද, සමාජ යහපැවැත්ම තුළින් සමස්ත ජාතියේම යහපැවැත්ම ද ඒ තුළින් මානව හිතවාදී ලොවක් බිහිවීමට ද හේතු වේ.

පටු ආත්මාර්ථකාමීත්වයෙන් තොරව පුද්ගල, පවුල, සමාජය, ආයතනය හෝ දේශයේ මානවවාදී අරමුණු සාධනයෙහිලා පවතින සම්පත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස යොදා ගනිමින් ධරනීය තත්ත්වයක් කරා ළඟා වීම යහපාලනය ලෙස පැහැදිලි වේ.

ශ්‍රී ලංකාව තුළ "යහපාලනය" පිළිබඳව 90 දශකයේ දී කතිකාවට ලක්වුවත් 2000 දශකයේ දී මෙය භාවිතාවට එක් කරන ලදී . නමුත් මෙම විෂය මා තුළ චර්යාගත වූයේ මෙම නම නාමකරණයෙන් නොව "සැමට සාධාරණත්වය" යන අර්ථ රූපයකිනි. සමාජ ක්‍රියාකාරිකයෙකු ලෙස ජනතාව හා සමාජගත වූයේ 80 දශකයේ මැද භාගය තුළයි. එයට අප මුහුණපෑ ආහාර හිඟය, දරිද්‍රතාව, සමාජ වරප්‍රසාද අහිමි වීම, පහත් ජීවන තත්ත්වය

ඉතිහාසය පුරාවට පැවති නොසලකා හැරීම, සමාජ ගෞරවය අහිමිවීම, සමාජය තුළ මතුවීමට එරහිව පැවති සාම්ප්‍රදායික ග්‍රාමීය නායකත්වය, තරුණයා යන ශාරීරික වර්ධනය පමණක් ඇති ජීවියෙකු ලෙස පැවති සමාජ සම්මතය සහ තරුණයා නොදැනුවත් පුද්ගලයෙකු ලෙස සමාජගතවීම වැනි හහිර්ජන්‍ය සාධක සමූහයක් හේතු වුණි. එසේම පුද්ගලයා තුළ පැවති ආවේගය, යථාර්ථය සෙවීමට වඩා පවතින තත්ත්වය දෙස විවේචනාත්මකව බැලීම හා ක්‍රමෝපායික නොවීම වැනි අන්තර්ජන්‍ය සාධක සමූහයක් ද මෙයට හේතු විය.

යහපාලනය යනුවෙන් මා හට අර්ථ ගැන්වී ඇත්තේ පවුල, සමාජය, සංවිධානය, ආයතනය හෝ රට තුළ වෙසෙන සාමාජිකයින්ගේ හෝ ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි බහුතරයෙන් සම්මත කරගත් නීති රීති, රෙගුලාසි, චක්‍රලේඛ හා එකඟතා අනුව සමාජ ආර්ථික හා පාරිසරික යහපැවැත්ම සාධනයෙහිලා සහභාගිත්වයෙන් කටයුතු කිරීමේ යාන්ත්‍රණයකි.

**යහපාලන මූලධර්ම.**

යහපාලන ක්‍රියාවලිය හඳුනා ගැනීමේ විවිධත්වයක් පවතින්නාසේම එහි මූලධර්මය ද විවිධාකාරයෙන් හඳුන්වා දී ඇත. පුද්ගලයාගේ, පවුලේ හෝ සංවිධානයේ අරමුණු විවිධාකාර හා සුවිශේෂ වන සේම ඒවා ළඟා කර ගැනීම සඳහා අනුගමනය කළයුතු මූලධර්ම ද විවිධාකාර වේ. ඒ අනුව යහපාලනය පිළිබඳ පොදු හා සම්මත මූල ධර්ම දක්නට ඇත. 1997 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය පුළුල් තේමාවන් 05 ක් ඔස්සේ යහපාලන මූලධර්ම 10 ක් පෙන්වා දී ඇත. ඒවා නම්,

**තේමාව - නීත්‍යානුකූල බව හා නියෝජනය.**

**පළමු මූලධර්මය:- සහභාගිත්වය(Participation).**

පවුල, සමාජය හෝ ආයතනය තුළ නියෝජනය වන සමාජිකයෙකුට බලපවත්නා වූද, එකී ව්‍යුහය තුළ නියාමනය වන ක්‍රියාවලිය සම්බන්ධයෙන් තීරණ ගැනීමට, නිමග්න වීමට, මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට හා පසුඵල භුක්ති විඳීමට සහභාගිවීමට ඇති අයිතිය තහවුරු කිරීම මෙම මූළධර්මයෙන් විස්තර වේ. මෙම මූලධර්ම මා විසින් ඉදිරිපත් කරන්නේ මේ පිළිබඳ ඔබගේ විෂය දැනුම පුළුල් කිරීමට නොව ඒ පිළිබඳ කියවා බලා ශ්‍රී ලාංකීය භාවිතාව අවබෝධ කර ගැනීමට පහසුවන පිණිසයි.

**දෙවන මූලධර්මය:- පොදු සම්මුතියකට හැඩගැසීම(consonance orientated).**

පවුල, සංවිධානය හෝ රට තුළ වෙසෙන ජන කණ්ඩායමට තම අරමුණු සපුරා ගැනීමේ ක්‍රියාවලිය තුළ පොදු සම්මුතියක් ඇති අතර, ඊට අනුගතව කටයුතු කිරීමට එකඟතාවට එළඹීමේ පුරුද්ද තවත් එක් මූලධර්මයකි.

**තේමාව - දිශානතිය.**

**තෙවන මූලධර්මය:- උපාය මාර්ගික දැක්ම(Strategic vision).**

පුද්ගලයා, පවුල, සංවිධානය හෝ රටක තම අනාගත දැක්ම සාක්ෂාත් කර ගැනීමේදී පවතින සම්පත් යොදා ගනිමින් වඩා ප්‍රායෝගික යථාර්තවාදී ක්‍රියාකාරකම්වලට එළඹිය යුතු අතර, ඒවා උපාය මාර්ගික සැලසුම්කරණය තුළ ඇතුලත් වන පරිදි ඒ පිළිබඳ මනා දැක්මක් සාමාජිකයා තුළ පිහිටුවීම මෙම මූලධර්මය තුළින් තහවුරු වේ.

**තේමාව - කාර්යසාධනය.**

**සිව්වන මූලධර්මය :- අනුකූලතාව හා ප්‍රතිචාරාත්මක බව(Accordance and responsiveness).**

පුද්ගලයා, පවුල, සංවිධානය හෝ රටක් තුළ පිළිගත් සම්මතයන්, නීතිරීති, ගිවිසුම්, කොන්දේසි හා පටිපාටි යනාදිය එකී ව්‍යුහයේ පැවත්ම සඳහා ගොඩනගා ගෙන තිබෙන අවස්ථාවලදී ඒවාට හා කළමනාකරණ ගැටලු පැනනගින ලෙස හෝ අවසන් අරමුණට හානි නොවන අයුරින් එකී සම්මතයට අනුකූලව ක්‍රියාව තුළින් ප්‍රතිචාර දැක්වීම සහ පාලනය සාධනයේදී අත්‍යාවශය මූලධර්මයකි.

**පස්වන මූලධර්මය :- සඵලදායි බව හා කාර්යක්ෂමතාව(Efficiancy and Effectiveness).**

පුද්ගලයෙකු , පවුල, ආයතනය හෝ රටක් සතුව අපේක්ෂාවන් හා අරමුණ ඇති අතර, එම අරමුණු කරා පවතින සම්පත් නිසි කළමනාකරණයකින් යුක්තව යෙදවීම තුළින් කාර්යක්ෂම මෙන්ම සඵලදායි නිමවුමක් ලඟාකර ගැනීමේ හැකියාව තහවුරු කර ගැනිම මෙම මූලධර්මයෙන් විස්තර කරයි.

**තේමාව - වගවන බව.**

**සයවන මූලධර්ම:- වගවීම(Accountability).**

පවුලක් තුළ සංවිධානයක් තුළ හෝ රටක් තුළ අරමුණුගත ක්‍රියාවලියක එක් එක් පුද්ගලයාට පැවරුණු කාර්ය භාර්යයක් නියම වී ඇත. එවැනි තමා විසින් කළ යුතු කාර්යය වගකීම වන අතර, එම වගකීම පැවරූ අය සඳහා එම කාර්යය කිරීම හෝ නොකර සිටීම පිළිබඳව වගකිව යුතුය. එවැනි වගකිව යුතු බව තමා විසින් අවබෝධ කරගෙන කාර්යයේ නියුක්ත වීම වගවීම නම් වේ. එවැනි වගවීමේ කොන්දේසිය ගලපා ගැනීම මෙයින් විස්තර වේ.

**සත්වන මූලධර්මය :- විනිවිද බව(Ttransparency).**

තමන් සතුව හිමිකාරිත්වයක් නොමැති සහ තමන් ඇතුළු තවත් පිරිසකට අයිතිය හෝ බාහිර පිරිසකට අයිතිය සහිත සම්පත් පරිහරණය හා කළමනාකරණයේ දී ඒවා යොදවා ගන්නා ආකාරය දැන ගැනීමේ අයිතියක් එකී සම්පත් හිමි පිරිසට ඇති හෙයින්, තමන් පරිහරණය හෝ කළමනාකරණය කරන සම්පත් පිළිබඳ උත්තර දීමට හා භෞතිකව පෙන්වා දීමට වගකිව යුතු බව අවබෝධ කරගෙන කටයුතු කිරීම යහපාලනයේ තවත් මූලධර්මයකි.

**තේමාව - සාධාරණත්වය හා සමානාත්මතාව.**

**අටවන මූලධර්මය:- සමානාත්මතාව(Equality).**

ජාතිය, ආගම,ස්ත්‍රී පුරුෂ , කුල හා වර්ග ආදිය කෙරෙහි විශේෂ සැළකිල්ලක් නොදක්වා සමස්ථ ප්‍රජාවම සමාන කොට සළකා එසේ නැත්නම් තවත් අයගේ අයිතිවාසිකම් කඩ නොවන ආකාරයෙන් කටයුතු කිරීම සමානාත්මතාවයි. දිළිඳු ප්‍රජාව සඳහා වූ සංවර්ධන කාර්යයේදී වර්ගීකරණයක් නොකොට සමස්තයට ප්‍රතිලාභ ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. නමුත් මෙහිදි දායකත්වයට සමානුපාතිකව ප්‍රතිලාභ හිමි වීම සමානාත්මතා මූලධර්මය කඩවීමක් ලෙස සැළකිය නොහැකිය.

**නවවන මූලධර්මය:- නීතියේ ආධිපත්‍යය (Rule of law).**

යම් ව්‍යුහයක් තුළ පාලනය මෙහෙයවන විධායකය හෝ බලය හිමි අධිකාරියක් මගින් එහි සිටින සියලුම සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සුරකෙන පරිදි තීන්දු තීරණ ගත යුතුය. සමාජ ආර්ථික යහපැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ප්‍රජාවට ඇති අයිතිය අභියෝගවලට ලක්වන අවස්ථාවල සාධාරනත්වය වෙනුවෙන් මැදිහත්වීමට අධිකරණයේ හෝ නීතිය පසිඳුවන වෙනත් මොනයම් හෝ ආයතනයක ස්වාධීනත්වය පැවතීම අත්‍යාවශ්‍ය වේ. එසේ නැතහොත් මොනයම් හෝ පාලන ව්‍යුහයත් තුළ හෝ රටක් තුළ එක නීතියක් බලාත්මක කිරීම තුළින් නීතියේ ආධිපත්‍ය සුරකෙනු ඇත.

**යහපාලනය ක්‍රියාවට නැගීමේ ක්‍රමෝපායන්.**

යහපාලනය පිළිබඳ විග්‍රහය හා එහි මූලධර්ම රටින් රටට හා ආයතනයෙන් ආයතනයට වෙනස්වන අතර යහපාලන මූලධර්ම ක්‍රියාවට නැංවීමේ ක්‍රමෝපායන් හා මාර්ගෝපදේශවලද වෙනස්කම් දක්නට ඇත. මෑත කාලයේ ඉතා විශාල ආර්ථික සංවර්ධනයක් දිනා ඇති සිංගප්පූරු රාජ්‍ය තුළ යහපාලනය ක්‍රියාවට නගා ඇත්තේ "අසහාය බව (Uniqueness)"කේන්ද්‍රීය අසහාය ජාතියක්, අසහාය පරිසරයක් හා අසහාය රාජ්‍යයක් වන මූලිකාංග මත පදනම් වේ. උපයෝගිතාවයද, ඉදිරි දැක්ම මූලිකවීම, කුසලතාව මූලික වීම, සාධාරනත්වය, විනිවිද බව, නායකත්වයේ ගුණාත්මක බව සහ වෙනස් වීම් පිළිබඳ අපේක්ෂාව යන යහපාලන මූලධර්ම හතක් අනුගමනය කර ඇත.

උගන්ඩාව යහපාලනය ක්‍රියාවට නගා ඇත්තේ දරිද්‍රතාවය, ගතානුගතිකත්වය හා අධ්‍යාපනය මූලිකාංග පදනම් කර ගෙනය. මානව අයිතිවාසිකම් සුරාකමින් බහු ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් ගෘහස්ථ හිංසනය, ළමා අපචාර, ශ්‍රම සූරා කෑම ආදිය වැළැක්වීම සඳහා යහපාලනය ක්‍රියාවට නගා ඇත. සමාජ සේවයේ බිඳ වැටීම, දිළිඳුකම උග්‍ර වීම, ආදායම් විෂමතාව, දිළිඳු ප්‍රජාව සංවර්ධන ක්‍රියාවලියෙන් දුරස් වීම, විරැකියාව, අත්‍යාවශ්‍ය සේවා සඳහා මූල්‍ය සම්පත්වල හිඟය වැනි සාර්ව ආර්ථික ගැටලු විසඳීමේ ක්‍රමෝපායක් ලෙස යහපාලනය භාවිතයට ගෙන ඇත.

කොරියානු ජනරජය තුළ විශාල වශයෙන් සේවා නියුක්තවී සිටින්නේ විදේශිකයන්ය.එහෙයින් නීති විරෝධි සංක්‍රමණ, වීසා කාලය ඉක්මවා ඇති අයවලුන් හොර රහසේ රටේ රැදී සිටීම වැනි ගැටලුකාරි තත්වයන් දක්නට ඇත. විදේශීය ශ්‍රම බලකායෙන් 80% ක් නීති විරෝධි අයවලුන් වන අතර, ඒ හේතුවෙන් ඔවුන්ගෙන් අඩු වැටුපට සේවය ලබා ගැනීම, වැටුප් නොගෙවා පැහැර හැරීම, පහර දීම, ලිංගික හිරිහැර, වන්දි නොගෙවීම හා මානව අයිතිවාසිකම් උල්ලංගනය කිරීම වැනි ශ්‍රමිකයින් ආශ්‍රිත බරපතල ගැටලු පැන නැගී ඇති හෙයින් ඔවුන් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන මූලධර්ම ක්‍රියාවට නගා ඇත.

මේ අනුව යහපාලනය හා එහි මූලධර්ම ඉක්වදෝරය, මලාවි, රුමේනියාව වැනි රටවල විවිධ ආකාරයෙන් භාවිතයට ගෙන ඇත. පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාව තුළ තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීම, රාජ්‍ය ගනු දෙනු පිළිබඳ පාරදෘශ්‍ය භාවය තහවුරු කිරීම, දූෂණය පිටු දැකීම, මානව අයිතිවාසිකම් තහවුරු කිරීම හා දරිද්‍රතාව තුරන්කිරීම වැනි ක්‍රමෝපායන් හරහා යහපාලනය යථාර්ථයක් බවට පත් කිරීමට උත්සාහ ගෙන ඇත. නමුත් මෙය දේශපාලන මුහුණුවරකින් ක්‍රියාවට නැගුණු අතර විරුද්ධවාදීන් එය දේශපාලන නාමකරණයකට ලඝු කිරීම නිසා සුසමාදර්ශ පෙන්වා දීමට අපොහොසත් වේ.

**යහපාලනයට එල්ලවන අභියෝග.**

යහපාලනය ක්‍රියාත්මක වන ආයතන ව්‍යුහය මත ඒවාට එල්ලවන අභියෝග ද විවිධ ස්වරූප ගෙන ඇත. ගෝලීය වශයෙන් පවතින වෙළඳපොල තරගකාරිත්වය, සම්පත් හිමිකර ගැනීමේ ආත්මාර්ථකාමී තරගකාරිත්වය හා බලාධිකාරිය පැතිරීමේ අවශ්‍යතාව එවැනි අභියෝග වේ. විශේෂයෙන්ම තුන්වන ලෝකයේ රටවල ඉහල අභියෝග සුවිශේෂී වේ. රටක් තුළ හෝ සංවිධානයක් තුළ පවතින යහපාලනයට සිදුවන ලොකුම අභියෝගය වන්නේ දූෂණයයි. ආයතනය හෝ සංවිධාන අභ්‍යන්තරයෙන් සිදුවන දූෂණය, බාහිර පාර්ශවයෙන් සිදුවන දූෂණය හා මෙම දෙපිරිස එකතු වී සිදු කරන දූෂණ ආදි විවිධාකාර දූෂණ දක්නට ඇත. ඊට අමතරව රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා හෝ තහවුරු කර ගැනීම සඳහා රාජ්‍ය පාලකයින්ගෙන් ප්‍රජාතන්ත්‍රවාදයට සිදුවන හානි, අවභාවිතා ලෙස මැතිවරණ දූෂණ, මැතිවරණ කල් දැමීම, කුමන්ත්‍රණකාරි ලෙස පවතින ආණ්ඩු කඩා බිඳ දැමීම, අධිකරණ ක්‍රියාවලියට සිදුකරන අනිසි බලපෑම් ආදිය සුලභ තත්ත්වයන්ය. මෙය ජාතික මට්ටම පමණක් නොව ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් විද්‍යාමාන වේ. ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය සඳහා වෙන්කරන අරමුදල් ප්‍රජාවගේ සහභාගිත්වයෙන් හා අවශ්‍යතාවෙන් බැහැර කටයුතු සඳහා යෙදවීම, එකී සංවර්ධන කටයුතු වලදී සිදුවන මුදල් වංචා හා අවභාවිතාවන් ලංකාව තුළ සුලභ තත්වයකි. මීට ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය මෙන්ම රාජ්‍ය නිලධාරීන්ද දායකවන බව දක්නට ඇත. එසේම පවුලක් තුළ වුවද ආදායම් උපයන සාමාජිකයින් පවුලේ සෙසු අයගේ ජීවන පැවැත්ම වෙනුවෙන් නොව ඒවා නාස්තිකාර පාරිභෝජන අවශ්‍යතා සඳහා වැයකරන අවස්ථා සුලබ වේ. මේ හේතුවෙන් පවුලේ සාමාජිකයින්ගේ මූලික අවශ්‍යතා කඩවීම මෙන්ම සමගිය, සහජීවනය, පෞරුෂ වර්ධනය ආදි සාමාජ ආර්ථික යහ පැවැත්මට එරෙහිව ප්‍රබල ලෙස බලපානු ලබයි. මෙවැනි අභියෝග පරදවා සාධනීය හෝ ධනාත්මක ප්‍රතිඵල නිර්මාණය කර ගැනීමට නම් පුද්ගලයන්ගේ චර්යාවේ ගුණාත්මක වර්ධනය හා පාර්ෂව කරුවන්ගේ සහභාගිත්වය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා පුද්ගලයින් සතු විභව ශක්තිය මතු කරගනිමින් ඔවුන් බලගැන්වීමට මැදිහත් විය යුතුය.

# යහපත් මානව සම්පතක් සහිත රටක් ගොඩ නැගීමට දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනයේ වැදගත්කම.

*ආර්.එම්.කේ. බණ්ඩාර*

මුල් ළමාවිය සංවර්ධනය නොවූ පුද්ගලයා හීනමානයෙන් යුතු හිස උදුම්වාගත්තෙකි. එවැනි අය අප සේවයකරන කාර්යාලවල, මගතොටේ දී මෙන්ම සමාජ කණ්ඩායම් තුළ දැකිය හැක. මාගේ හැඟීම අනුව නම් මේ රටේ ආර්ථික දිළිඳු පුද්ගලයන් නොමැත. දුප්පතුන් යයි කියා ගන්නා බොහෝ දෙනෙක් තුළ ඇත්තේ මානසික දිළිඳු භාවයයි. දුප්පතුන් ලෙස හඳුනාගෙන සහනාධාර මත යැපෙන පුද්ගලයාගේ සිට ඊනියා උගත් හා බුද්ධිමතුන් යයි බලෙන්ම හඳුන්වාදෙන පුද්ගලයන් ද මානසික ව්‍යාධි වලින් පෙළෙන අය බව අනුන් මත යැපීමෙන් හා ඔවුන්ගේ පහත් හැසිරීම් තුළින් මනාව ඔප්පුවේ. මේ සඳහා හුදෙක් බලපා ඇත්තේ ඔවුන්ගේ මුල් ළමාවිය සංවර්ධනය නිසි අයුරින් සිදුවී නොමැතිවීමයි. මා අසා තිබෙන කියමනකි. " මිනිසාගේ පියා දරුවාය" යන්න. මෙම කියමනෙන් අදහසවන්නේ මුල් ළමාවිය හා වැඩිහිටි විය අතර පවතින සහසම්බන්ධතාවයයි. මුල් ළමාවියේ දී නිවැරදිව සංවර්ධනය නොවූ නැතහොත් නිවැරදි සමාජානුයෝජන ක්‍රියාවලිය සිදු නොවූ පුද්ගලයා තරුණ හා වැඩිහිටි වියේ දී ඔහුගේ හැසිරීම තුළින් ඒබව මනාව පෙන්නුම් කරයි. සියලුම මිනිසුන්ගේ ජීවිතයේ පදනම සකස් වන්නේ මෙම අවධියේදීය. මේ නිසා මුල් ළමාවිය සංවර්ධනය පුද්ගල සංවර්ධනයේ දි ඉතාම වැදගත් සාධකයකි. මුල් ළමාවිය යනුවෙන් අදහස් වන්නේ දරුවා මවු කුස පිළිසිඳ ගත්දා පටන් වයස අවුරුදු 05 වන තෙක් අවධියයි. ජාත්‍යන්තර නිර්වචනයන්ට අනුව වයස අවුරුදු 08 දක්වා වූ කාලය පූර්ව නැත්නම් මුල් ළමාවිය ලෙස සලකනු ලැබේ. පුද්ගලයා මුල් ළමාවිය පසුකර තරුණ, වැඩිහිටි අවධින්ට ගමන් කිරීමේ දී මුල් ළමා වියේ දී ලද අත්දැකීම් හා ඉගෙනුම් පදනම් කර ගන්නා බව පර්යේෂණ මගින් මනාව ඔප්පුකර ඇත. මෙම අවධියේ වැඩි කාලයක් දරුවා ගතකරන්නේ මව සහ පවුල් ඥාතීන් සමූහයා සමඟයි. මේ නිසා දරුවගේ මුල් ළමාවිය සංවර්ධනය නිසි පරිදි ගොඩ නැගීමේ වැඩි බරක් පැවරෙන්නේ ඔවුනටය. දරුවා නිවැරදිව සමාජානුයෝජනය නොකිරීම වරද දෙමාපියන් විසින්ම බාරගතයුතු වෙනවා. එසේ නොවූ හොත් සමාජය ඉදිරියේ සමාජයට පිළිලයක් සේ හැසිරෙන මුල් ළමාවිය සංවර්ධනය නොවූ පුද්ගලයාට වඩා සමාජය ඉදිරියේ ගැරහුමට ලක්වන්නේ මව ඇතුළු පවුලේ අනෙක් සාමාජිකයන්ය.

මුල් ළමාවිය සංවර්ධනය යනු සෑම අංශයකින්ම දරුවාගේ සංවර්ධනයක් සිදුවීමයි. දරුවාගේ සමස්ත සංවර්ධනයක් සිදුවීම අංශ කීපයක් යටතේ සිදුවේ. එනම්.

කායික සංවර්ධනය

මනෝචාලක සංවර්ධනය

සමාජ සංවර්ධනය

චිත්තවේග සංවර්ධනය

බුද්ධි සංවර්ධනය

භාෂා සංවර්ධනය

පරිසර සංවර්ධනය

සෞන්දර්යාත්මක සංවර්ධනය

යහජීවන පුරුදු හා ආචාර ධර්ම

මෙම සෑම අංශයක්ම බෙදා වෙන්කර හුදකලාව සංවර්ධනය කල නොහැක. එයට හේතුව මේවා එකිනෙක බැඳී පැවතීමයි. මුල් ළමාවියට පත්වන දරුවා තම ජිවිත කාලය තුළ ලබන සංවර්ධනයෙන් 80 % ක්ම මුල් ළමා විය සංවර්ධන අවධියේ සිදුවන බව මනෝ විද්‍යාඥයින්ගේ මතයයි. මෙයින් පෙනී යන්නේ පුද්ගලයකුගේ සංවර්ධනයෙන් වැඩි කොටසක් මුල් ළමාවිය සංවර්ධන කාලය තුළ සිදුවන බවයි. මේ නිසා සමාජයට දායාද කරනු ලබන දරුවා යහපත් මානසිකත්වයක් සහිත පුද්ගලයකු වීමට නම් ඔහුගේ මුල් ළමාවිය අවධිය නිසි අයුරින් සංවර්ධනය විය යුතුය. එසේ නොවුන හොත් ඔහුගෙන් සමාජය පීඩාවටත් පරිහානියටත් පත්වේ. පුද්ගලයකුගේ පූර්ණ සංවර්ධනයේ දී ආරය හා පරිසරය යන අංශ දෙකම බලපානු ලබයි. ආරය යනු ජාන සම්බන්ධතාවය නිසා හටගන්නා තත්ත්වයකි. විකෘති මනසකින් යුතු පුද්ගලයන් බිහිවීමට ආරය ඍජුව බලපාන බව මනෝවිද්‍යාව අනුව තහවුරු වී ඇත. පරිසර සාධකයද පුද්ගල සංවර්ධනයේ දී විශාල බලපෑමක් කරනු ලබයි. පරිසර සාධකය යනුවෙන් අදහස් වන්නේ පුද්ගලයා ජීවත්වන, ඇසුරුකරන බාහිර සමාජයයි. පුද්ගලයාට බාහිර සමාජයෙන් ඇතිකරනු ලබන තත්ත්වයන් ඔහුගේ හැසිරීම් රටාව කෙරෙහි බලපානු ලබයි.

මව් කුස පිළිසිඳ ගන්නා දරුවා එතැන් පටන් වයස අවුරුදු 05 දක්වා වූ කාලය තුළම මවගේ ආදරය, උණුසුම, මවගේ ආහාර රටාව ඇය ගන්නා ආහාරවල පෝෂණය, ඇය භාවිත කරන භාෂාව, ස්වාමියාගෙන් ඇය ලබන ආදරය, රැකවරණය, ඇය ඇසුරු කරන පුද්ගලයන්ගේ ක්‍රියාකලාප, ඇයගේ මානසික ස්වභාවය, සිතිවිලි ආදී පංචේන්ද්‍රියන් නිසා සිදු කරන සෑම ක්‍රියාවක්ම මුල් ළමාවිය දරුවාගේ සංවර්ධනය සඳහා බලපානු ලබයි.

සංවර්ධන විය යුතු අංශ අතරින් සමාජ සංවර්ධනය, චිත්තවේග සංවර්ධනය භාෂා සංවර්ධනය, පරිසර සංවර්ධනය, සෞන්දර්යාත්මක සංවර්ධනය, යහජීවන පුරුදු හා ආචාර ධර්ම යන අංශ කෙරෙහි මෙම ලිපියෙන් වැඩි අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වේ. එයට හේතුව කායික වශයෙන් පමණක් පුද්ගලයකු සංවර්ධනය වූ පමණින් ඔහු සමාජට වැඩදායි පුද්ගලයකු බවට පත්නොවන බැවිනි.

වර්තමානය වන විට දුප්පත්කම, ස්ත්‍රී දූෂණ, පාතාල කල්ලි, සමාජ විරෝධී ක්‍රියාවන්, පවුල් සංස්ථාව තුළ හටගෙන ඇති ගැටුම්, රාජ්‍ය දේපල අවභාවිතය, රැකියා ස්ථානවල තමා උගතාය, බුද්ධිමතාය, තමන් දරන්නේ ඉහළ තනතුරක්ය ආදි ලෙස කටයුතු කරන පුද්ගලයන්ද සමාජය තුළ දක්නට ලැබේ. එපමණක් නොව එදා පැවති විශාල ඥාති සම්බන්ධයක් සහිත පැවති විස්තෘත පවුල අද පුළුල් ඒකකයක් ලෙස මව, පියා හා දරුවන්ට පමණක් සීමාවී ඇත. මේ නිසා එදා පවුල මූලික වූ මුල් ළමාවිය සංවර්ධන අවශ්‍යතා ඉටු වුවද වර්තමානය වන විට එම සංවර්ධන අවශ්‍යතා හුදකලාවූ පරිසරයක් තුළ තනි තනිව එම කාර්යයන් ඉටුකරගන්නා ස්වභාවයක් දක්වා වර්ධනය වී ඇති ආකාරයක් දැකිය හැකිය. පෙර පාසල තුළින් යම් පමණක මුල් ළමා විය සංවර්ධන අවශ්‍යතා ඉටු වුවද දරුවා වැඩි කාලවේලාවක් ගතකරනු ලබන්නේ මව ප්‍රධාන වූ තම පවුල් ඒකකය තුළය.

මුල් ළමාවිය සංවර්ධන අවශ්‍යතා නිසි පරිදි ඉටු නොවුන හොත් පවුල, ඥාති සමූහයා, සමවයස් කණ්ඩායම්, පාසල, විශ්ව විද්‍යාලය, රැකියා ස්ථාන හා වෙනත් සමූහයන් සමඟ ගනු දෙනු කිරීමේ දී තවකෙක් අපහාසයට, උපහාසයට ලක්කරමින් කටයුතු කරනු දැකිය හැකිය. දෙමාපියන්ගේ නොසැලකිලිමත්භාවය නිසා මුල් ළමාවිය සංවර්ධන අවශ්‍යතා ඉටු නොවූ පුද්ගලයෙකු විසින් තව කෙනෙක් පහත හෙළා කටයුතු කිරීම සමහර සේවා ස්ථානවල මෙන්ම විවිධ සමාජ කණ්ඩායම් තුළ දැකිය හැක. කේලාම් කියන පුද්ගලයා බොහෝ විට නිර්මාණශීලී නොවන, කිසියම් වූ පොතේ දැනුමක් සහිත තවකෙක් සමඟ තරඟකාරීත්වයට බිය, අනෙකාගේ දක්ෂතාවයන් දරාගත නොහැකි වූ අති දුර්වල පුද්ගලයෙකි. එම කේලම් අසා තවත් අයෙක්ට ගැරහුම් කරන්නා අති මෝඩයෙකි. මෙවැනි පුද්ගලයන් මුල් ළමාවිය සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වූවන්ය.

මෙහි දි පැරණි කියමණක් සිහියට නැගෙයි එනම් “ ආරේ ගුණ නෑරේ ” යන කියමනයි. අපි කතාවටත් කියනවා පැරණි මිනිස්සු මෙවැනි කතා කට කහනවාට කියූ කතා නොවන බව. එයින් කියවෙන්නේ ඔවුන් මෙවැනි කතා කිසියම් වූ අත්දැකීමක් අර්ථ ගැන්වීමට යොදාගත් බවයි. පුද්ගලයකු ආරයෙන් උරුම කරගන්නා දේ වෙනස් කිරීම අති දුෂ්කර ක්‍රියාවක් බව මෙයින් පෙන්නුම් කෙරේ. නමුත් මුල් ළමාවිය සංවර්ධනය කර නොගත් තරුණ හෝ වැඩිහිටි පුද්ගලයා යම් අවස්ථාවක සමාජයෙන් එම සංවර්ධන අවශ්‍යතා කිසියම් වු හැඩතලයකින් යුතුව අත්විඳිනු ඇත.

අද මුළු විශ්වයම සමාජ ප්‍රශ්න රැල්ලකට හසුවී ඇත්තේ පැටලුණු නූල් බෝලයක් හා සමානවය. මෙම ගැටළු ද එකිනෙක හා බැඳුන විසඳීමට නොහැකි සංකීර්ණ ස්වභාවයක් ගනී. මේ නිසාම පුද්ගලයා ඉච්ඡාභංගත්වයට පත්ව ආතති මනසකින් යුත්තය. සමාජය දිනෙන් දින පිරිහෙමින් පවතී. පුද්ගලයා ආයු කාලය කෙටිකරගත්, හඳුනාගත නොහැකි හදිස්සියේ හට ගන්නා රෝගී තත්ත්වයන්ට ගොදුරු වෙමින්, ඊර්ෂ්‍යාව, වෛරය, පළිගැනීම, හීනමානය හා මහන්තත්වය ගති පැවතුම් පෙන්වමින් කටයුතු කරන බව පෙනීයයි. මෙයට හේතුව පුද්ගලයා මුල් ළමාවිය සංවර්ධන අවශ්‍යතා නිසි පරිදි සපුරාගෙන නොමැති වීමයි.

මෙවැනි තත්ත්වයන්ට මුහුණ පා ඇති පුද්ගලයන් කෙරෙහි අනුකම්පා සහගතව ක්‍රියාකර ඔවුන් එම තත්ත්වයන්ගෙන් මුදා ගෙන සමාජ මිනිසෙක් බවට පත් කිරීමට සමාජගත පුනරුත්තාපන ක්‍රියාවලියක් ඉක්මනිනින් ආරම්භ කල යුතුය. නමුත් මෙය ප්‍රතිකාරාත්මක ප්‍රවේශයක් පමණක් වන අතර එය සංවර්ධනාත්මක ප්‍රවේශයක් කරා තල්ලුකල යුතුව ඇත. මුල් ළමාවියට පා තබමින් සිටින අනාගත මුල් ළමාවිය දරුවන් සඳහා නිවස පදනම් වූ සංවර්ධන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කල යුතුය. මේ සඳහා දෙමාපියන්ගේ පමණක් නොව සමස්ත සමාජයේම වගවීමක් වනු ඇත. විශේෂයෙන් මෙය රාජ්‍ය මැදිහත්වීම අත්‍යවශ්‍ය කාරණයකි.